FM 104.4,105.7
ශ්‍රී ලංකාවේ ප්‍රථම බෞද්ධ ගුවන් විදුලි නාලිකාව
"රංගිරි ශ්‍රී ලංකා"
සැබෑ මාධ්‍ය සංස්කෘතියක පෙර ගමන්කරු

# රංගිරි ශ්‍රී ලංකා

## RANGIRI SRI LANKA NEWSPAPER



FM 104.4,105.7
ශ්‍රී ලංකාවේ ප්‍රථම බෞද්ධ ගුවන් විදුලි නාලිකාව
"රංගිරි ශ්‍රී ලංකා"
සැබෑ මාධ්‍ය සංස්කෘතියක පෙර ගමන්කරු

ශ්‍රී.බු.ව. 2565- ක්‍රි.ව. 2021
ඔක්තෝම්බර් (වප්)

මාසික බෞද්ධ සාර සංග්‍රහය - අන්තර්ජාල කලාපය

35




**රංගිරි ශ්‍රී ලංකා රූපවාහිනිය**

UHF CH 60
PEO TV CH 22
Dialog Tv 21
Dish Tv 2532

රංගිරි ශ්‍රී ලංකා
RSL TELEVISION

**රංගිරි ශ්‍රී ලංකා ගුවන් විදුලිය**
**දේශයේ රන් හඬ**

රංගිරි ශ්‍රී ලංකා
RSL RADIO

FM 104.4 - 105.7

වෙබ් : www.rangirisrilanka.lk

රංගිරි දඹුල්ල සංවර්ධන පදනමේ ප්‍රකාශනයකි.



# වප් පෝය වර්ණනාව

බිනර පොහොයෙන් පසු උදාවෙන වප් පොහොය බෞද්ධ ජනතාවට මෙන්ම උපසපන් භික්ෂුන් වහන්සේලාට වැදගත් වන්නේ, චීවර කටයුතු සිදුවන මාසය වන බැවිනි. වප් මාසයේ සිට ඉල් මාසය අවසානය වන තෙක් පවතින කාලයේ දී ''කඨිනාස්කරණ'' කාලය ලෙස සලකනු ලබයි. විහාරස්ථානයක හෝ ආරාමයක වස් සමාදන් වූ උපසපන් භික්ෂූන් වහන්සේලා වස් පාවාරණය කිරීමෙන් පසු වස් පිංකම සඳහා දින නියමකර ගෙන වස් දායක දායිකාවන්ගේ සහාභාගිත්වයෙන් පිංකම සිදු කරනු ලබයි.

වස් විසූ භික්ෂුව විසින් මේ සඳහා අනුගමනය කරන ලද කරුණු අටක් ගැන සඳහන් වේ.මේවා ගැන මූලික කරුණු දත යුතු වේ.තුන් සිවුර පිළබඳ මූලික කටයුතු සිදු කිරීම පරිහරණය කල තුන් සිවුර ගැන සම්බුද්ධාරය කිරීම, අධිෂ්ඨානය කිරීම, අත්ථාරය කිරීම අෂ්ට මාතිකාව ගැන අවබෝධය ලබා ගැනීම පලිබෝධය ගැන අවබෝධය ලැබීම, උද්ධාරය ගැන දැනුම හා අනුසස් ගැන දැනුම ලැබීම යන කරුණු අටක් වේ.

වසරකට එක් විහාරස්ථානයක එක් වරක් පමණක් සිදු කළ ඇති සුවිශේෂී පිංකමක් ලෙස කඨින පිංකම හඳුන්වා ද තිබේ.කඨිනය ලබන භික්ෂුවට මෙන්ම, පූජා කරන දායකයාටද අනුසස් ලබාදෙන පිංකමක් ලෙස බුද්ධ දේශානාවේ සඳහන්කර තිබේ.

''නාගිකා පද්‍රනයෙහි'' මේ ගැන දීර්ඝ වශයෙන් දක්වා ඇත. තව්තිසා දෙව්ලොව වස් විසූ බුදුරාජාණාන් වහන්සේ වස් කාලය අවසන් වීමෙන් පසු සංකස්ස ද්වාරයට වැඩම වූ අවස්ථාවේ දක්වන ලද පෙළහැර දුටු සැරියුත් මහරහතන් වහන්සේ ප්‍රධාන ජනතාව බුද්ධාලම්භන ප්‍රීතියට පත් වූ බව ශාසන ඉතිහාසයෙහි සඳහන් වෙයි.ලෝකයේ වෙසෙන බෞද්ධ ජනතාව වප් පොහොය මූලික කරගෙන විවිධ පිංකම්හි නිරතවන බව සඳහන් කිරීමට පුළුවන.

ඇම්.ඩී.විජයවර්ධන

## පුදබිමක අසිරිය



# ගිරිහඬු සෑය

නැගෙනහිර පලාතේ, ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයට අයත් තිරියාය නම් ස්ථානයේ පිහිටි කඳු ගැටයක මෙම ඓතිහාසික ස්ථූපය පිහිටා තිබේ. මෙම ස්ථානයේ ඓතිහාසික තොරතුරු හැදෑරීමේ දී අසල ඇති සෙල්ලිපි හා නටබුන් උපකාරී වේ. බුදුරාජාණන් වහන්සේට ප්‍රථමයෙන්ම දානය වශයෙන් විලඳ හා මී පිඩු පූජාකළ තපස්සු, හල්ලුක යන දෙදෙනා විසින්, කේශ ධාතු නිධන් කොට මෙම ස්ථූපය ගොඩනැගූ බව මෙහි ඇති සංස්කෘත භාෂාවෙන් ලිය වී ඇති සෙල්ලිපියකින් පැහැදිලි වෙයි. ක්‍රි.පූ.528 දී පමණ මෙම ස්ථූපය නිර්මාණය කරන්නට ඇතැයි මහාචාර්ය සෙනරත් පරණවිතාන ශූරීහූ පවසා ඇත. මෙම ස්ථූපය පිළිබඳ තොරතුරු පූජාවලි ග්‍රන්ථවේද සඳහන් වෙයි.කේශධාතු වන්දනය සහ අවලෝකිතේශ්වර වන්දනය වඩාත් ජනප්‍රියත්වයට පත් වූ බවට මෙම ස්ථානය නිදසුනකි. පුරාවිද්‍යාඥයින් විසින් ද මෙම අදහස තහවුරුකර තිබේ.මෙම ස්ථානය ස්ථූපවට වූ ගෙවල්, ප්‍රතිමාඝර, පොකුණු, පියගැටපන්ති, ගල්ලෙන්, මුරගල්, වාමණි රූප සඳකඩපහණ යනා දී ඓතිහාසික නටබුන් වලින් සමන්විතය.ඉපරණි වෙළඳ මාර්ගයකට නටබුන් වලින් සම්බන්ධව ඇති මෙම ස්ථානය වෙළඳුන්ගේ විශේෂ පූජාවට භාජනය වූ පිංබිමක් ලෙස ප්‍රකට වී තිබූ බවට සෙල්ලිපි වලින් පැහැදිලි වේ.බෝධිසත්ත්ව වන්දනාව මෙකල පැවැති බවට සාක්ෂි දරණ සෙල්ලිපියක් ද හමු වී තිබේ. ස්ථූපය අසල අවලෝකිතේශ්වර සහ මංජු ශ්‍රී ප්‍රතිමා ප්‍රතිමාවක් ද පැවැති බවට නටබුන් හමු වී තිබේ.මේ අනුව පැහැදිලි වන්නේ තිරියාය මහායාන බෞද්ධ මධ්‍යස්ථානයක් වශයෙන් ප්‍රසිද්ධියට පත් ව තිබූ බවයි. අවස්ථා දෙකකදී මෙම ස්ථූපය නිර්මාණයකර ඇති බව ඓතිහාසික සාධක අනුව සඳහන් කර ඇත.මුල ස්ථූපයේ විෂ්කම්භය අඩි 24 ක් වූ අතර දෙවන ස්ථූපයේ විෂ්කම්භය අඩි 32 ක් වන බව සොයාගෙන තිබේ.ස්ථූපය වටා මනහර වේදිකාවකි. එය වටේට වළලු දෙකක ආකාරයෙන් ගල් කණු අටපට්ටම් ස්වරූපයක් ගනී.මෙම වේදිකාවට ඇතුල්වීම සඳහා සතර දිශාවෙන් පියගැට පේළිවලින් සැදුණු වේදිකා හතරකින් සමන්විතය.එම පියගැට පේළි නාග මුරගල් සහා මකර මුඛ සහිත කොරවක් ගල්වලින් අලංකාර කර තිබේ.සතර දිශාවට යොමු වූ මල් ආසන හතරක් ද දක්නට ලැබේ.මෙම භූමියෙහි අතුරණ ලද ගල්ලැලිද එක්තරා ක්‍රමයකට අනුව සකසා තිබීම විශේෂ ලක්ෂණයකි.මෙම විහාර භූමිය අවට ඇති ස්වාභාවික ලෙන්වල කොටා ඇති ලිපි වලින් පෙනියන්නේ,භික්ෂුන් වහන්සේලා වාසයකර ඇති බවයි.මෙම ලෙන් කටාරම් කොටා තිබීම නිසා වැසි ජලයෙන් ආරාක්ෂා වීම ද සිදු වේ.විවිධ සෙල්ලිපි හමු වී ඇති අතර ඒවා කුමන රජෙකුගේ කාලයක ඒවාදැයි නිගමනය කිරීම අසීරුය.බුද්ධ කාලයේ සිට පූජනීය තත්වයට පත් වූ පුද බිමක් ලෙස සඳහන් කිරීමට පුළුවන.නැගෙනහිර පලාතට අයත් පුදබිම් අතරින් සුවිශේෂී ස්ථානයක් ලෙස තිරියාය හෙවත් ගිරිහඬු සෑය දැක්වීමට පුළුවන.මෙවැනි ඓතිහාසික වටිනාකමකින් අනූන පුද බිම ආරක්ෂා කිරීම අප සැමගේ පරම යුතු කම වන්නේමය.



විජය තලවත්තේගෙදර

# බුදුරජාණන් වහන්සේගේ මහා ප්‍රඥාව



ප්‍රඥාව යනුවෙන් අදහස් කරනු ලබන්නේ යමක් යථා ස්වභාවයෙන් හෙවත් ඇත්ත ඇති සැටියෙන් අවබෝධයෙන් දැන ගැනීමයි. යථා ස්වභාවයෙන් අදහස් කරනු ලබන්නේ අනිත්‍ය, දුක්ඛ, අනාත්ම යන ත්‍රිලක්‍ෂණය තේරුම් ගැනීමයි. ත්‍රිලක්ෂණය අවබෝධයෙන් මනාව වටහා ගැනීමෙන් නිවනට පැමිණෙන ආකාරය සියල්ලේ හටගැනීම නැතිවයාම මූලික වශයෙන් දැනගන්නා විට ආස්වාදය හා ආදීනවය මෙන්ම නිස්සරනය පිළිබඳව මූලික කරුණු අවබෝධ වේ. මෙම අවබෝධය විශ්වය පිළිබඳව ඉතා වැදගත් වන ත්‍රික්ෂණය තේරුම් ගැනීමේ පදනමද වෙයි.

රූප, වේදනා, සඤ්ඤා, සංස්කාර, විඤ්ඤාණ වශයෙන් පංචවිධ වන සියලු සංස්කාර ධර්මයන් ම අනිත්‍ය බව නුවණ මෙහෙයවා පසත් කරගත් පසුව අනතුරුව දැනගත යුතු වන්නේ නිත්‍ය වශයෙන්ම ප්‍රාර්ථනා කරන අපට අනිත්‍ය දේ දුඛ පිණිසම හේතුවන ආකාරයයි. යම් සැපතක් මෙලොව ඇත්නම් ඒ සියල්ලම දුකට හේතුවන බව තේරුම් ගතයුතුව ඇත. ඉපදීම, ජරාව, ලෙඩවීම, මරණය, ප්‍රියයන්ගෙන් වෙන්වීම, අප්‍රියන් හා එක්වීම අපේක්‍ෂා කරන දේ නොලැබීම යන මේ සියල්ල ම දුක්ය.

ඉඳුරන් මගින් ලබන ආස්වාදය තාවකාලික හෙයින් වැඩිපුර ඇත්තේ ආදීනව බව පෙනීයයි. එබඳු තාවකාලික වූ ආදීනව බහුල වූ නිත්‍ය අවිපරිනාමි ලක්‍ෂණ වලින් සමන්විත 'ආත්ම' පදාර්ථයක් සේ ගැනීම මුලාවකි. එබැවින් ස්ථිර කිසිවක් නැති මෙලොව දෙස අප බැලිය යුත්තේ අනාත්ම වශයෙනි.

මෙම යථා ස්වභාවය බුදුරජාණන් වහන්සේට අවබෝධකොට ගෙන අනුන්ටත් අවබෝධකර වූ බැවින් උන්වහන්සේගේ ප්‍රඥාව මහා ප්‍රඥාවයි. අනුන්ගේ උදව්වක, උපකාරයක් උපදේශයක් මගපෙන්වීමක් නොමැතිව ස්වශක්තියෙන් ම ස්වයං ඥාණයෙන්ම චතුරාර්‍ය සත්‍ය ධර්මයන් සර්වප්‍රකාරයෙන්ම දත යුතු සියලු ආකාරයෙන් ප්‍රත්‍යක්ෂ අවශයෙන් අවබෝධ කළ නිසා සම්මා සම්බුද්ධ වෙති.

ලොවේ ඇති තතු ඒ ආකාරයෙන්ම දැන ගැනීම තුන් ආකාර වේ. යම් පමණකින් දැන ගැනීම සඤ්ඤාවයි. තරමක් දුරට දැන ගැනීම විඤ්ඤාණයයි. කිසිවක් ඉතිරි නැතිව හැම ආකාරයෙන්ම දැන ගැනීම ප්‍රඥාවයි. බුදුරජාණන් වහන්සේට සබ්බඤ්ඤු යන පදයෙන් හඳුන්වනු ලබන්නේ සියල්ල දැන ගත් නිසාය. බුදුරජාණන් වහන්සේ ත්‍රිවිද්‍යාව ලබා ඇති බවත් උන්වහන්සේද ඒ බව පිළිගත් බවත්, වච්චගොත්ත සමඟ වූ සංවාදයෙන් පැහැදිලි වේ. ත්‍රී විද්‍යාව නම් නුවණ තුනකි.

එනම්,

1.පුබ්බේනිවාණුස්සතිඥාණ
2.දිබ්බචක්ඛුඥාණ
3.ආසවක්ඛයකරඥාණ
යන ඥාණ තුනයි.

පුබ්බේනිවාණුස්සති ඥාණය නම් පෙර විසූ කඳ පිළිබඳ දැනගන්නා වූ නුවණයි. දිබ්බචක්ඛු ඥාණය නම් දිවස පිළිබඳව ඥාණයයි. ආසක්ඛයකර ඥාණය නම් ආස්‍රවයන් ක්‍ෂය කිරීමේ නුවණයි. උන්වහන්සේ සතුව විශේෂ ඥාණයක් වූ බැවින් විජ්ජාචරණ සම්පන්න නම් වේ. ඒ ත්‍රී විද්‍යාව, අෂ්ට විද්‍යාව හා පසළොස්චරණ ගුණයන් විශේෂ ඥාණ ගණයට ඇතුළත් වේ.

අම්බට්ඨ සූත්‍රයේ විශේෂ ඥාණ අටක් දැක්වේ. විදර්ශනා ඥාණය වූ ත්‍රිලක්ෂණය පිළිබඳව දැනීමද මනෝමය සෘද්ධි ඥාණය වූ මනෝමය කයක් නිර්මාණය කිරීමද සෘද්ධි විද ඥාණය වූ නානා විද වූ සෘද්ධි දැක්වීම පිළිබඳව ඥාණයද දිව්‍යශ්‍රෝත ඥාණය නම් වූ මනුෂ්‍යසත්‍ය ඉක්මවා ඇසීමේ හැකියාව ඇති ඥාණයද පරචිත්තවිජානන ඥාණය නම් වූ අනුන්ගේ සිත හා සිතන දේ දැන ගැනීමේ හැකියාව ද පූර්වේ නිවාසානුස්සති ඥාණය තමන්ගේත් අනුන්ගේත් පූර්ව ජාති සිහි කිරීමේ හැකියාව නම් වූ ඥාණය ද දිව්‍යංචක්‍ෂුරභි ඥාණය නම් වූ සත්වයින්ගේ චුති උත්පත්තිය දැන ගැනීමේ හැකියාව ඇති ඥාණය ද ආශ්‍රවක්‍ෂයකර නම් වූ සියලු කෙලෙසුන් නැසීමේ හැකියාව ඇති ඥාණය යන මේ විශේෂ ඥාණ අටයි.

උපාය කෞශල්‍ය ඥාණය උන්වහන්සේ සතු වූ නමුත් විශේෂ ඥාණ යයි. සූදුසූ මාර්ග යෙහි දක්‍ෂතාවයෙන් යුතු ඥාණ යයි. දසවිධ ඥාණ අතුරින් ප්‍රධාන ඥාණය වූ ඨානාඨාන ඥාණයයි.

මදුරට සාගල නුවර රජකුලයෙහි විශිෂ්ට රූපශ්‍රීයෙන් හෙබි රූප මදයෙන් මත් වූ ඛේමා නම් කුමරියට සෘද්ධියෙන් දෙවගනක වැනි ශ්‍රීමත් ස්ත්‍රියක තමන් වහන්සේ වෙත සිට විච්නිපතක් ගෙන පවන්සලන්නා සේ ඇයට පෙනෙන්නට සැලැස්වීම උපයා කෞශල්‍ය ඥාණයයි. නන්ද තෙරුන්ට කිසා ගෝතමියට ලෝක තත්ත්වය යථා තත්ත්වය පිළිබඳ ව දැනීම යථාවබෝධය ලබා දීමේ මෙම උපාය කෞශල්‍යතා ඥාණයෙන් ය.

පසළොස් චරණ ධර්මයන් අතර ප්‍රඥාව පිළිබඳ කියවෙන අංශ 7ක් අතුළත් වේ. බහුශ්‍රැතතාවය, ස්මෘතිය, ඥාණය සතර ධ්‍යාන යනුවෙනි. බහුශ්‍රැතතාවය නම් නිවැරදි ශිල්ප ශාස්ත්‍ර දන්නා බවයි. ස්මෘතිය නම් කුසලා කුසලයන් වෙන්කොට සිහිකර දෙන්නා වූ මතක්කර දෙන්නා වූ කල්ගත වූ කරුණු මතක්කර දෙන්නා වූ නුවණයි. ඥාණය නම් සත්වයා හා ලෝකය පිළිබඳ ව තත්‍වාකාරයෙන් දක්නා වූ නුවණයි. සතර ධ්‍යාන නම් ප්‍රඥාවේ පියවරවල් හතරයි. එනම්, ප්‍රථමධ්‍යාන, ද්වීතීය ධ්‍යාන, තෘතීය ධ්‍යාන,චතුර්ථ ධ්‍යාන වශයෙනි.

උපාලි ගෘහපති පුත්‍රයා බුදුරජාණන් වහන්සේ හා වාදයට යන්නට සූදානම් වූ අවස්ථාවේ දී දීඝතපස් වී මෙසේ ප්‍රකාශ කළේ ය.

''ස්වාමීනි'' බුදුහු මායා ඇත්තෙකි. අනවතීර්ථකයන්ගේ ශ්‍රාවකයන් තමා කෙරෙහි ඇදගන්නා වූ නම්මවාගන්නා වූ මායාවක් දනී. මෙයින් පෙනෙන්නේ අනුන්ට කරුණු අවබෝධ කරදීමේ ඇති දක්‍ෂතාවයයි. ස්වකීය ඥාණ ශක්තිය පිළිබඳව සැරියුත් මහරහතන් වහන්සේට මෙසේ ප්‍රකාශ කළහ.

මනා සිහියෙන් යුත් මාගේ ශ්‍රාවකයන් සතර දෙනෙකු අවුත් වෙන වෙන ම ප්‍රශ්න විචාළ කළ කල්හි පැහැදිලිව නොපැකිලිව පිළිතුරුදීමට මට පිළිවෙන. පිළිතුරු වශයෙන් කියන සෑම කරුණක් ම සිහියේ තබා ගැනීමට ද මට පිළිවෙන. මා වයස්ගතවීමෙන් ඉතාදුබලව ශ්‍රාවකයන් හතරදෙනකු විසින් ඇදක තබාගෙන යායුතු තත්වයට පත් වූවත් මාගේ ප්‍රඥා ශක්තියෙහි කිසිම අඩුවක් නොවන්නේය.

බුදුරජාණන් වහන්සේගේ ප්‍රඥාවේ සුවිශේෂභාවය අෂ්ටවිද්‍යා ධර්‍මයන්ගෙන් හා පසළොස් චරණධර්‍මයන්ගෙන් මනාව පෙන්නුම් කොට සෘද්ධිවිධ ඥාණයෙන් ප්‍රාතිහාර්‍ය්‍ය පෑම ආදිය ද දිබ්බසෝත ඥාණයෙන් මිනිස්කම ඉක්මවා දිව්‍යමය කන් ලැබීම ද කොතරම් දුර සිහිපත් සියුම් ශබ්ද ඇසීමද සුවිශේෂ වේ. චේතොපරියාය ඥාණයෙන් මිනිස් චිත්ත සන්තානගත දෑ නිවැරදිව දැකීමට හැකිවීම ද ආසවක්ඛය නැති කිරීමෙන් අර්හත්ඵලය ලබාගෙන තිබේ දැයි බැලීම පුබ්බේ නිවාසානුස්සති ඥාණයෙන් සත්‍වයින් පෙර විසූ කඳ පිළිවෙළ දැනීම පරචිත්ත විජානන ඥාණයෙන් අනුන්ගේ සිත් දැන ගැනීම සුවිශේෂ ලක්‍ෂණ වේ.

බුදුරජාණන් වහන්සේ දසබල ඥාණයෙන් ද චතුර්වෛසාරද්‍ය ඥාණයෙන් ද යුක්ත වූහ. අණ්ඩජ, ජලාබුජ, සංසේදජ, ඕපපාතික යන යෝනිවල උපතලද සත්වයන් පිළිබඳව දැකීම චතුර්යෝනි

15 පිටුවෙන්...

ශාස්ත්‍රවේදී ගෞරව අධ්‍යාපන ඩිප්ලෝමා
එච්.එම්.අයි.හේරත්
ලෙනදොර

# කාලාම සූත්‍රයෙන් පෙන්වාදෙන බෞද්ධ නිදහස් චින්තනය



බෞද්ධ දර්ශනය සියුම්ව විග්‍රහයකට භාජනය කිරීමේදී ඒ තුළ නවීන විද්‍යාත්මක ක්‍රමවේදය මනාව දෘශ්‍යමානව පවතින බැව් පෙනී යයි. නවීන විද්‍යාවේ යම් යම් නිගමන වලට බැසගැනීමේදී අනුගමනය කරනු ලබන ක්‍රියාමාර්ගයකට සමාන වූ ක්‍රමවේදයක් බුදුරජාණන් වහන්සේ විසින්ද දේශනා කොට ඇත. ඒ අනුව යම් කිසි කරුණක් පිළිබඳව නිගමනයකට බැසීමේදී පළමුවෙන්ම එය මනාව පරීක්‍ෂා කළ යුතුවේ. දෙවනුව එකී කරුණ පැහැදිලිව නිරීක්‍ෂණය කළ යුතුය. තෙවනුව එම කරුණ පිළිබඳ අවසාන නිගමනයකට බැසිය යුතුවේ. මෙවැනි දාර්ශනික විද්‍යාත්මක ක්‍රමවේදයක් සම්බන්ධව පැහැදිළි ප්‍රකාශයක් දක්වා ඇත්තේ බෞද්ධ දර්ශනය තුළ පමණක් බව පෙන්වාදිය හැක.

ලොව පහල වූ අනෙකුත් ආගමික දර්ශන හා මතවාද පිළිබඳව තුලනාත්මකව විග්‍රහයක යෙදීමේදී බෞද්ධ දර්ශනයන් සියලුම ආගමික චින්තනයන් හා මතවාද අභිභවා ඉදිරියෙන් සිටින බැව් පෙනීයයි. ඒ සඳහා ගෙනහැර දැක්විය හැකි නොයෙකුත් සාදක අතර ප්‍රබලතම සාධකයක් වන්නේ බුදුදහමින් පෙන්වා දී ඇති නිදහස් චින්තන සංකල්පයයි. මෙම කරුණ සනාථ කිරීම සඳහා බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරන ලද සූත්‍ර දේශනා හා බුද්ධ භාෂිතය සුවිශේෂ වූ පිටුබලයක් ලබාදෙන බැව් දැක්විය හැක. එවැනි සූත්‍ර දේශනා අතුරින් මෙම කරුණ පැහැදිළිව අනාවරණය කරන සූත්‍ර ධර්මයක් ලෙෂ අංගුත්තර නිකායේ මහා වග්ගයේ එන කාලාම සූත්‍රය සඳහන් කළ හැක. ගුණාත්ම සමාජ පසුබිමක් මිනිස් ජීවිතයට එක්කර ගැනීමට බුදුදහමේ සාර්වත්‍රික ඉගැන්වීම්වල ඇති අදාලත්වය මැනවින් ප්‍රකට කරන සූත්‍රයක් ලෙස කාලාම සූත්‍රය දක්වාලිය හැක.

අප සම්මා සම්බුදු රජාණන් වහන්සේ භාරතයේ කොසොල් මහ ජනපදයට අයත් කේසපුත්ත නැමැති නගරයෙහි වාසය කළ කාලාම නැමැති ජනතාව අරඹයා මෙම සූත්‍රය දේශනා කළ සේක. එවක බෞද්ධයින් නොවන කාලාම වැසියන් විවිධ ආගමිකයන් විසින් තමන්ගේ ආගම්වාදය පමණක් නිවැරදිය කියා ඉස්මතු කර පෙන්වීමට උත්සාහ කළ අතර (තේපි සකඞද්කෙද්ව වාදං දීපෙන්ති) අනිකුත් ආගමික දර්ශන හෙලා දකිමින් කරන ලද ප්‍රකාශන වලින් විචිකිච්ඡාවට පත්වී සිටියහ. මෙසේ ගැටළු සහගතව පසුවන අවස්ථාවේදී අප තිලෝගුරු සම්මා සම්බුදු රජාණන් වහන්සේ භික්‍ෂු සංඝයා සමඟ කේසපුත්ත නගරයට වැඩමකර සිටින බැව් කාලාම වැසියන්ට ආරංචි වී උන්වහන්සේ වෙත පැමිණ මෙම ආගමික මතවාද වල ඇති ෂත්‍යාසත්‍යතාවය පිළිබඳ ගැටළුවට විසඳුමක් ලබාදෙන ලෙස ඉල්ලා සිටියහ. කාලාම වැසියන්ගේ එම ඉල්ලීම අරභයා බුදුරජාණන් වහන්සේ විසින් කාලාම සූත්‍රය දේශනා කොට වදාළ සේක.

කාලාම සූත්‍රයේදී බුදුරජාණන් වහන්සේ කාලාමයින්ට කිසිම කරුණක දැඩිලෙස එල්බගෙන නොසිට නුවණින් විමසා බලා පිළිගන්නා ආකාරය කරුණු සහිතව පැහැදිළි කළ සේක. එය බුදුදහමේ එන නිදහස් චින්තන සංකල්පය මනාලෙස සනාථ කරන ලද්දකි. ඒ අනුව,

1.යම් කිසිවක් කෙනෙකුගෙන් අසා දැනගත්තාය කියා පිළිගන්න එපා (මා අනුස්සවේන)
2.බුද්ධිමත් නුවණ තියන අය තමන්ට වටහාගැනීමට ශක්තිය තිබුණත් තමාගේ පරම්පරාවෙන් ආ ආකාරය නිසා යමක් පිළිගන්න එපා ( මා පරම්පරාය)
3.යම් යම් දේවල් හා සම්මතයන් මේ ආකාරයට සිදුවුණු දේවල් කියා ගන්න එපා (මා ඉතිකිරාය.)
4.මෙ පොත් වලින් ඇවිල්ලා තියෙන්නේ මෙහෙමයි කියා ගන්න එපා. (මා පිටක සම්පදානේන)
5.ඒ ආකාරයේ තර්කයට ගැලපෙනවා කියූ පමණින් ගන්න එපා. (මා තත්ත හේතු)
6.බැසගත් න්‍යායට ගැලපෙනවා කියා ගන්න එපා. (මා නය හේතු)
7.බලාගෙන ගියාම වෙන්නෙ මේ විධියට හරිනේද කියලා කරුණු සලකාගෙනගන්න එපා. (මා ආකාර පරිවිතක්කේත)
8.සොයා බලන්නේ නැතිව මතවාදයකට බැසගෙන තීරණ ගන්න එපා. (මා දිට්ඨිනිජ්ඣනක්ඛන්තියා)
9.බලාගෙන යනවිට එයත් හරිනේ. මේකත් හරිනේ කියා ගන්න එපා. ((මා භබ්බරූපතාය)
10. මේ අපේ ගුරුවරයානේ කියා ශ්‍රමණයන් කියන ඕනෑම දෙයක් අපි පිළිගන්න ඕනෑ කියා ගන්න එපා. (මා සමණෝ නො ගරූති)

මෙසේ කරුණු පැහැදිලි කරදුන් බුදුරජාණන් වහන්සේ විසින් යම් දෙයක් සිතට ගතයුතු ආකාරයත් පැහැදිළි කරන ලදි. ඒ අනුව කාලාමයිනි, යම් කලෙක ඔබ තමා තුළින්ම දැනගන්නවා නම් (යදා තුම්හේ කාලාමා අත්තනාව ජානෙය්‍යාථ) මේවා අකුසල ධර්මයන්ය. (ඉමේ ධම්මා අකුසලා) මේවා වැරදි දේවල්ය. (ඉමේ ධම්ම සාවජ්ජා) මේ දේවල් බුද්ධිමත් මිනිසුන් විසින් ගරහන දේවල්ය. (ඉමේ ධම්මා විඤ්ඤූ ගරහිතා) මේ දේවල්වලින් යුක්තව ඒවා සමාදන් වෙලා සිටියහොත්, බොහෝ අහිත පිණිස, දුක් පිණිස පවතින්නේය. (ඉමේ ධම්මා සමත්තා සමාදින්නා අහිතාය දුක්ඛාය සංවත්තන්තීති) ඒ නිසා කාලාමයිනි, එ දේවල් බැහැර කරන්න. (අථ තුම්හේ කාලාමා විජහෙය්‍යාථ)

මේ පිළිබඳව තවදුරටත් කාලාමයින්ට කරුණු පැහැදිළි කරන බුදුරජාණන් වහන්සේ ලෝභ, ද්වේශ මෝහ යන අකුසල මූල යමෙකුගේ සිතෙහි ඇතිවූ විට එය අයහපත පිණිස පවතින බවත්, එසේ ලෝභ, ද්වේශ, මෝහ යන අකුසල මූලයන්ගෙන් මුලාවට පත් වූ ජනතාව ඒ සිතුවිලි හේතුකොටගෙන ප්‍රාණඝාතය සොරකම් කිරීම

15 පිටුවට...

විශ්‍රාම සහකාර සංස්කෘතික අධ්‍යක්‍ෂක ඩී.එම්.එච්.කරුණාරත්න මහත්මාගේ අභාවයෙන් පසු උපහාර පිණිස පළ කෙරේ.

# බෞද්ධ පාලක ප්‍රතිපදාව



රටක පාලක ප්‍රතිපදාව තුළ ඒ රටේ දියුණුව රඳා පවතී. යහපත් පාලක ප්‍රතිපදාවක් රටක ඇතිවූ විට එහි වෙසෙන ජනතාවට ගැටලු වලින් තොර ජීවිත ගතකිරීමට වර සැළසෙයි. පාලක පාලිත ගැටලු ඇතිවූ බොහෝ අවස්ථාවල බුදුන් වහන්සේ ඒ සඳහා අනුගමනය කළ යුතු ප්‍රතිපදාව කුමක්දැයි පෙන්වා දුන් අතර එමගින් ඒවා නිරාකරණය ද වීය. මෙහිදී සාකච්ඡා කෙරෙන්නේ බුදුන් වහන්සේ වදාළ පාලක ප්‍රතිපදාවේ ප්‍රධාන කරුණු කීපයක් පිළිබඳවයි .

බෞද්ධ පාලක ප්‍රතිපදාව පිළිබඳ සොයා බැලීමේදී බුදුන් වහන්සේ ජීවමාන යුගයේ තිබූ රාජාණ්ඩු මෙන්ම ගණතන්ත්‍ර ආණ්ඩු පිළිබඳව ද මඳක් සොයා බැලීම වටී. දීඝ නිකායේ මහා ගෝවින්ද සූත්‍රයේ එදා ඉන්දියාවේ භූගෝලීය ලක්ෂණ පදනම් කොට බෙදීම් කළ ජනපද හතක් ගැන කියවෙයි. එසේම අංගුත්තර නිකායේ පෙහෙවස් රැකීමේ අනුසස් දක්වන තැන ඉන්දියාව ජනපද දහසයකට බෙදා දක්වයි. මෙයින් රාජාණ්ඩු අතර ප්‍රබලව නැගී සිටි මගධ, කෝසල, වත්ස, අවන්ති යන රාජ්‍ය දක්වන අතර මෙම රාජ්‍ය ගංගා යමුනා ගංගා මිටියාවත් ආශ්‍රය කොට පිහිටා තිබුණ ආකාරය පැහැදිලි කරවයි. ඉන්දියාවේ බොහෝ ගණතන්ත්‍ර රාජ්‍ය ප්‍රබල රාජාණ්ඩු විසින් යටත් කරගන්නා ලද අතර කෝසලයට අයිති ගණතන්ත්‍ර රාජ්‍ය කීපයක් ගැනද බෝධි රාජා කුමාරයා සතු කරගත් භග්ගයින්ගේ සුමසුමාරගිරිය ගැනද තොරතුරු සඳහන් වෙයි.

එසේම කාසි කෝසල දෙකට අයත් ගණතන්ත්‍ර රාජ්‍ය දහැටක් අජාසත් රජුට එරෙහිව වජ්ජීන් හා එකතු වූ බව ජෛන ග්‍රන්ථවල සඳහන් වෙයි. මෙයින් වජ්ජීන්ගේ ප්‍රබල ගණතන්ත්‍ර රාජ්‍යයක් පැවති අතර ශාක්‍ය, මල්ල, කාලාම, වේදේහ, මෞර්ය වැනි අවශේෂ ගණතන්ත්‍ර රාජ්‍යයද මෙකල පැවති බව පැහැදිලි කරුණකි. නමුත් බුදුන් වහන්සේ එකල ඉන්දියාවේ තිබූ රාජාණ්ඩු හෝ ගණතන්ත්‍ර ආණ්ඩු හෝ වෙනත් පාලන ක්‍රමයක් යහපත් දේයි අනුමත නොකළ අතර උන්වහන්සේ අනුමත කළේ (ධමමිකො ධම්මරාජා) යන පාලක සංකල්පයයි. මෙයින් පාලක ක්‍රමය නොව ධාර්මික පාලක තන්ත්‍රයක් ධර්මානුකූල ප්‍රතිපදාවක් අනුමාන කළ බව පැහැදිලිව පෙනේ. තණ්හාව නිසා මිනිසුන් තලමින් මිරිකමින් කරන පාලක ප්‍රතිපදාව අනුමත නොකළ බව රජ්ජ සූත්‍රයෙන් පෙන්වා දෙන අතර රටක පාලකයන්ගේ කායඝීය ඉතා බැරෑරුම් බව අත්ත දණ්ඩ, තේමිය වැනි ජාතක කථා වලින් පෙන්වා දුන් සේක.

රජ යන්නෙහි අදහස රංජනය කරන්නා යන්නයි. ජනතාව සතුටු කරන්නා රජ ලෙස කරදර වලින් බැහැර ආරක්ෂා කරන්න යන අදහස අග්ගඤ්ඤ සූත්‍රයේද දැක්වෙන අතර, මුල්ම රජ ජනතා කැමැත්ත මත (මහා සම්මත) පත්වූ ආකාරය හා ඔහු සතුව තිබිය යුතු සුදුසුකම් ද පෙන්වා දී ඇත. ඉන්දියානු වර්ණභේදය අනුව ක්ෂත්‍රිය යනු රජ කරන්නා යන්නයි. එය රාජ කුල ලෙසද බෞද්ධ සාහිත්‍යයේ සඳහන් වෙයි. කෙසේ වුවද රාජාණ්ඩු ගණතන්ත්‍ර පාලක ක්‍රම දෙක්ම ක්ෂත්‍රියන් රැඳී සිටි බව පෙනේ.

පාලක ක්‍රමය කුමක් වුවද බුදුන් වහන්සේ රාජ්‍ය පාලකයන් ලෙස පිළිගත්තේ ධර්මානුකූල පාලක ප්‍රතිපදාවයි. සමකාලීන පාලකයන් සඳහා බුදුන් වහන්සේ බොහෝ අවස්ථාවල බෞද්ධ ප්‍රතිපතා රාශියක්ම පාලකයන් සඳහාම පෙන්වා දුන් සේක. දස සක්විතිවත්, දසරාජ ධර්මය පාලකයන් සතර අගතියෙන් තොරවීම, පාලකයන් සතර සංග්‍රහ වස්තු පිළිගත යුතු බවද රටක් දියුණුවන අපරිහානි ධර්ම පාලක ප්‍රතිපදාවට එකතු විය යුතු බවද පෙන්වා දුන්හ. එසේ පැවති ප්‍රතිපදා සහිත රාජ්‍ය උන්වහන්සේගේ විශේෂ ඇගයීමටද ලක්විය.

බුද්ධ කාලීන සමාජයේ පරමාදර්ශී පාලක සංකල්පයක් ලෙස චක්‍රවර්ති සංකල්පය ඉදිරියට ඒමද මෙහිදී වැදගත් වෙයි. මෙම සංකල්පය ඉන්දියාවේ මෙකල පැවති බෞද්ධ, හින්දු හා ජෛන ආගම් වලදී කාවැදී තිබූ වැදගත් සංකල්පයක් බව පැහැදිලි කරුණකි. බොහෝ දෙනා මෙය බෞද්ධ මූල බීජයක් ලෙස පැතිර ආවක් ලෙස සලකනු ලැබූවත් චක්‍රවර්ති සංකල්පය බුදුන් වහන්සේ වැදගත් ලෙස සැළකූ බව ජාතක කථා මෙන්ම සූත්‍ර කීපයකින්ම පැහැදිළි කරවයි. මුල් පෘතුවි තලයට අධිපති එක් රජෙක් වන මොහුට පහළ වන රත්න හත මහජන සුභ සිද්ධියට අදාළව කටයුතු කිරීමට යොදා ගතහැකි බව පෙන්වන අතර එසේ නොවුණහොත් ඔහුගේ චක්‍රවර්ති බලය පිරිහෙන බවද පෙන්වා දෙයි. චක්‍රවර්ති රජුගේ පුතා අධාර්මික වූ සැනෙකින් චක්‍රවර්ති රජුගේ චක්‍ර රත්නය අතුරුදහන් වූ බව දැක්වීමෙන් පාලක ප්‍රතිපදාව අකුරටම අනුගමනය කළ යුතු බව අවධාරණය කෙරෙයි. බෝධිසත්වයෝ සුදස්සන නම් චක්‍රවර්ති රජුව ඉපිද බොහෝ වාර ගණනක් චක්‍රවර්ති රජකම ලබමින් ජනයා සතුටු කරවූ ආකාරය මහා සුදස්සන සූත්‍රයේ කියවෙයි. ඒ සමඟම බුදුන් වහන්සේ බොහෝ විට චක්‍රවර්ති සංකල්පය අගය කළ කථා අතර .චක්‍රවර්ති සූත්‍රයෙන් අතීත චක්‍රවර්ති රජුන් ගැනද මතු ඇතිවෙන කේතුමතී රජධානියේ මෛත්‍රී බුදුන් සමයේ පහළ වන සංඛ නම් චක්‍රවර්ති රජු ගැනද කරුණු දැක්වෙයි. චක්‍රවර්ති රජු පරමාදර්ශී රජෙක් වන අතර මොහුටද චක්‍රයක් හිමිවන අතර එය බුදුන් වහන්සේගේ ධර්ම චක්‍රයට සමාන වෙයි. දාගැබක් සෑදිය යුතු උතුමන් අතර බුදු, පසේ බුදු, මහ රහතුන් අතර චක්‍රවර්ති රජුද එක් කෙනෙකි. චක්‍රවර්ති සංකල්පයෙන් ධාර්මික බව සංකේතවත් කරන අතර රජු ධාර්මික වන විට රටද ධාර්මික වන බව පැහැදිළි කරවයි. මෙම සංකල්පය බුදුන් වහන්සේ වැඩ සිටි සමයේ යුධ ගිනි අවුලුවා අවට රටවල් අල්ලා ගනිමින් බලය එකලස් කළ පාලකයන්ට සිතට කා වදින සංකල්පයක් වූවාට සැක නැත. එසේම බෝධිසත්වයන් ගේ උපත සිදුවූ අවස්ථාව මෙන්ම නම් තබන දිනයේද සිදුහත් බෝසතාණෝ බුදු බව නොලැබුවහොත් ඒකාන්තයෙන් චක්‍රවර්ති රජවන බව එකළ උගත් බමුණන්ද ප්‍රකාශ කළේ එය පරමාදර්ශී රාජ්‍ය සංකල්පයක් වූ නිසාය.


බෞද්ධ පාලක ප්‍රතිපදාව මෙසේ වුවත් මෙවැනි ප්‍රතිපදා වලින් යුක්ත රජුන් සොයා ගැනීම අපහසු වූවකි. බුදුන් වහන්සේගේ පිරිනිවනින් අවුරුදු 218 දී රජවූ ධර්මාශෝක රජුගේ පූර්ව රාජ්‍ය යුගය සටන් වලින් ගහණ වූ අතර ඔහු බුදුදහම වැළඳ ගැනීමෙන් පසුව ඔහු බුදුන් වහන්සේගේ අනුමත කළ පාලක ප්‍රතිපදාවක් අනුගමනය කිරීමට පෙළඹෙන බව ඔහුගේ සෙල්ලිපි රාශියකින්ම පෙනී යයි. ඔහුගේ 13 වන ගිරි ලිපියේ දෙවියන්ට ප්‍රිය වූ රජතෙම සියලු තුන්ගේ පීඩා රහිත බවද සංයමයද, සමචරියාව ද සතුටින් විසීම ද කැමති වෙයි.

එසේ ම ඔහු බෞද්ධ පාලක ප්‍රතිපදා අනුගමනය කරන බව 13 ගිරි ලිපියේ ම ධර්ම විජය යන නමක් වෙයි නම් එය දෙවියන්ට ප්‍රිය වූ රජුගේ ප්‍රධාන විජය වෙයි. ධර්මාශෝක රජතුමා බුදුන් වහන්සේගේ පාලක ප්‍රතිපදාවට ළං වීමට උත්සාහ කළ බවක් මෙම තොරතුරු වලින් අනාවරණය වෙයි. බෞද්ධ පාලක ප්‍රතිපදාව ඉහළින් දැක්වෙන චක්‍රවර්ති සිහනද සූත්‍රයේ නිෂ්පාදනයට පාලක සහයෝගය නොමැති විට රටක් දුප්පත් වන බව කියා දෙන අතර මහාපරිනිබ්බාණ සූත්‍රයේ පාලකයෙකු ප්‍රජාතන්ත්‍රවාදී වීමේදී රටේ සියලු දුර්වලතා නැති කළ හැකි බවද පෙන්වා දෙයි.

ආචාරිනී එස්. සමරසිංහ (ශාස්ත්‍රවේදී විශේෂ)
ගුන්නෑපාන

අප සසර ගමන තව තවත් දික්කරන දුරදිග යාමට හේතුකාරක වන ආමිසයට මුල්තැන දීමෙන් පිං දහම් කරමින් වටිනා කාලය නිකරුනේ කා දමනවා. එසේ කරමින් මේ දානාදී පිංකම් වලින් නිවන් ලැබේවායි ප්‍රාර්ථනා කරනවා. ඒ අතරම මතු මනාවූ අනාගතයේ පහල වන්නාවූ සැමටම මෛත්‍රී වූ මෛත්‍රී බුදුපියාණන් වහන්සේ සියසින් දුක උන්වහන්සේ විසින් දේශිත මධුර මනෝහර ශ්‍රී සද්ධර්ම දේශනාව අසා දේශනාව අවසානයේ සෝවාන් ආදී මාර්ගඵල ලබා නිවනින් සැනසේවායි ප්‍රාර්ථනා කරයි.

දැන් පහලවී සිටින ගෞතම ශාක්‍යසිංහ බුදුපියාණන් වහන්සේ විසින් දේශිත ධම්මචක්ක සූත්‍රයමයි මතු අනාගතයේ පහල වන මෛත්‍රී ශාක්‍ය මුනින්ද්‍රයාණන් වහන්සේත් දේශනා කරන්නේ. ගෞතම ශාක්‍ය මුනි දේශනාව තවමත් ජීවමානයි. ඒ පිවිතුරු දහම අද ද අවබෝධ කට හැකිය. අද අවබෝධ කරගත නොහැකි දහමක් මතු අනාගතයේ අවබෝධ කර ගැනීමට අමුතු හැකියාවක් අමුතු දක්‍ෂතාවයක් කෙලේ නම් ඇතිවේද? ඔබ ඔබේ හැකියාව අවතක්සේරු කරගෙන නැවත මේවගේ උත්තම බුද්ධෝත්පාද කාලයක මනුෂ්‍යාත්ම භාවයක් කෙසේ නම් ලැබේදැයි කිසිවෙකුට කෙසේ නම් කිව හැකිද? නොහැකිමය. කිසිම දෙයක් ප්‍රාර්ථනා කිරීමෙන් ලැබෙන්නේ නැත. ධර්මය නම් වූ පහුරට ඔබ තවම නැග නැත. කර තියාගෙන ඇත. එයට පුද පූජා පවත්වමින් සිටී. වැඳ වැටෙමින් දහම් පද ගීතවත්ව ගායනා කරමින් සිටී. ආමිස පූජාවෙන් චිත්ත පාරිශුද්ධිය ඇතිවී සත්‍යාවබෝධය නොවනු ඇත. මම නැමැත්තා පෙරටුවේ තබාගෙන ඔහුට සුබිත මුදිත අනාගතයක් සලසාදීමේ අභිලාෂයෙන් භව තණ්හාවෙන් පිං දහම් කරයි. සසර ගමන සැපවත් කිරීමට පින අවශ්‍යයයි. බුදුදහමේ බුද්ධිමත් ප්‍රතිපදාව වනුයේ සසර ගමන නතර කිරීමේ



# ආමිසයෙන් භවය - ප්‍රතිපත්තියෙන් නිවන

ප්‍රතිපත්ති පූජාවයි. ආමිසය තමාට පුදා ගැනීමකි. ප්‍රතිපත්තියෙන් පමණි බුදුන්ට පිදිය හැක්කේ.

කුසල කර්ම හෝ අකුසල කර්ම භව නිරෝධය සඳහා කිසිසේත් පාදක නොවේ. භවගමන එමගින් දික්කරයි. මුළු ජීවිත කාලයම දානාදී පිංකම් කළ ජේතවනාරාමය ආරාම පූජා කළ අනේපිඩු සිටුවරයාට සෝවාන් ඵලය ලැබීමට හැකියාව ඇති වී නමුත් මහ රහත් වීමට හේතු කාරක නොවීය. අසූ හාරදහසක් වෙහෙර විහාර කළ තෙවන ධර්ම සංගායනාව කළ තම එකම දුව පුතා සසුනට පූජා කළ ධර්මාශෝක මහරජතුමාට ඒ පිංකම් භව නිරෝධය සඳහා උපනිශ්‍රය නොවුණි. අසදෘෂ මහ දන් දුන් පසේ නදී කොසොල් මහරජතුමාටත් කෝසල මල්ලිකා දේවියටත් පිනෙන් අඩුවක් තිබුණේද? භව නිරෝධය සඳහා එසා මහත් කුසල සම්භාරය හේතු කාරක නොවීය. අංගුලිමාල නම් මහ සොරු දහස් ගණන් මිනිසුන් මැරුවත් ඒ සා පාපකර්මය මහරහත් භාවය ලැබීමට බාධාවක් නොවුණි. පිංකම් කාමාවචරයි. භවගාමී බවට අදාලයි. අභ්‍යන්තර චිත්ත පාරිශුද්ධිය සඳහා පෙර සූදානමක් සඳහා පමණක් උපනිශ්‍රය වේ.

කිසියම් හෝ ප්‍රාර්ථනාවක් වේ නම් කෙලෙස් ලෙඩ හදන විෂබීජ වේ. කිසියම් හෝ අනාගත අපේක්ෂාවක් වේ නම් ඒ කෙළෙස් ලෙඩ හදන විෂබීජ වේ. මේ කෙලෙස් ලෙඩ සසර භයානක දුකකට උරුමකම් ඇතිකර දෙයි. මනසින් ලෙඩ උනාම ධර්මය හැර ඖෂධයක් නැත. කායික ලෙඩ මෙලොවට පමණි. බෙහෙතකින් නිට්ටාවට සුවකර ගත ද හැක. රාගයෙන් ආතුරවීම, ද්වේෂයෙන් ආතුරවීම, මෝහයෙන් ආතුර වීම භවයේ කල්ප ගණන් දුක විදීම සඳහාම හේතු වේ.

නිදහස් විය යුත්තේ කොතනින්ද? ලෝකයෙන්
නිදහස් විය යුත්තේ කාගෙන්ද? මගෙන්
නිදහස් විය හැක්කේ කෙසේද? ප්‍රතිපදාවෙන්
නිදහස් විම සඳහා යායුතු මාර්ගය ? අරිඅටගි මග
නිදහස් විය යුත්තේ කුමකින්ද? අවිද්‍යාවෙන්
නිදහස් වීමට නොකළ යුත්තේ කුමක්ද? කර්ම රැස්කිරීමයි.

යෝ පන භික්ඛු ධම්මානු ධම්ම පටිපන්නෝ විහරති. සාමිචිපටිපන්නෝ විහරති. අනුධම්මචාරි, සො තථාගතා නං සක්කරොති, ගරු කරොති, මානේනි පුජෙති පරමාය පූජාය, පටිපත්ති පූජාය.

යම් භික්‍ෂුවක් සද්ධර්මයට අන්ගතව ජීවත්වන්නේ නම් දැහැමි කථාබහෙන් යුක්ත නම් බුද්ධාදී උතුමන්ගේ දෝෂ දර්ශන යට ලක්නොවන සියලු දුෂ්චරිතයන්ගෙන් මිදුනේ වේ නම් තථාගතයාණන් වහන්සේට ගරු කරන්නෙක් වේ. තථාගත යාණන් වහන්සේට සත්කාර කරන්නෙක් වේ. මානනය කරන්නෙක් වේ. උතුම්ම පූජාව වන්නේ ප්‍රතිපත්ති පූජාවමයි.

ඉහත දක්වූ ධාර්මික ප්‍රතිපදාවට අනුගතව ඔබ ජීවත්වන්නේ නම් මුළු දවසම තථාගතයාණන් වහන්සේ පූජෝපහාර පවත්වන උතුමෙක් වේ. මෙහිදී උන්වහන්සේ ආමිස පූජාව ගැන කිසිදු සඳහනක් කරන්නේ නැත. කර්ම රැස් කිරීම ආමිසයයි. කර්මය ක්‍ෂය කිරීම ප්‍රතිපත්තියයි. නහි මයිහං මාලා ගන්ධාදී හී පූජං කරොන්තා. මම පූජං කරොන්ති. නම ධම්මානු ධම්මං පටිපජ්ජන්ත එවපන මං පූජෙන්ති නාම (ධම්මපදට්ඨ කථා) මල් ගඳ විලවුන් මගින් කෙරෙන පිදීම බුද්ධ පූජාවක් නොවේ. ප්‍රතිපත්තිමය වශයෙන් ධර්මානුකූලව හැසිරීමම බුදුපියාණන් වහන්සේට කරන බුද්ධ පූජාව වන්නේය.

මිනිස්සු මුළු ජීවිත කාලයම දිවා රාත්‍රී නොමැතිව කති, බොති, නටති, ගී කියති, ප්‍රීති වෙති, රැස් කරති, රකිති, බෙදා ගනිති, රැකියා කරති, හම්බ කරති, වෙහෙසෙති, පොහොසත් වෙති, දුප්පත් වෙති, ඇණ කොටා ගනිති, මරා ගනිති, මරණයේ දොරටුව ලඟට පැමිණි විට පෙර සූදානම් නොවීම නිසා හඩති, වැලපෙති, සෝක කරති, භීතියට පත්වෙති, අසරණ වෙති, මහා ධන සම්පත් භෞතික ගේ දොර ඉඩකඩම් ස්වාමි, භාර්යා, දූ දරුවන් බොහෝ මනාප දෑ බෑ කියද්දී අතහැර දමා මහත්සේ අසරණ වෙලා අභිමිකම් කියාගෙන නොපෙනන නොදකපු සිහිනයකින් වත් නොසිතූ මහා භයානක ව්‍යසනයෙන් යුත් ප්‍රපාතයකට වැටෙනු ඇත. මේ සියලු ව්‍යසනයට වගකිව යුත්තේ නොදමුණු තම සිතයි. එනිසාම ආමිසයෙන් මිදී ප්‍රතිපත්තිය කරා පියමං කිරීම ප්‍රඥාගෝචරයි.

**පූජ්‍ය ගම්පහ සිරිසීවලී හිමි**

### භාවනා කිරීමට සහ සිත දියුණු කරගැනීමට කැමති පුද්ගලයන් විසින් අනුගමනය කළ යුතු කරුණු

1. අලෝභ අදහස් දියුණු කර ගැනීම.
2. ලෝභය සියලු දුකට මුල බව සිතීම.
3. මෛත්‍රී අදහස් වැඩිදියුණු කරගැනීම.
4. වෛරී සිතුවිලි වලින් බැහැරවීම.
5. ප්‍රඥාවන්ත අදහස් ඇතිකර ගැනීම.
6. මෝහය (මුලාව) එලොව මෙලොව අඳුරට මුල බව සිතීම.
7. කාම තෘෂ්ණාදියෙන් දුරුවීමට උත්සුකවීම.
8. විවේකීව භාවනා කිරීමේ අදහස් වැඩි දියුණු කරගැනීම.
9. පිරිසගෙන් ඈත්ව තනිව භාවනා කිරීමට යොමුවීම.
10. සිත, කය, වචනය සංවර කරගැනීම පිණිස සැම විටම උත්සුක වීම.

# නිස්චල චිත්තය



''යථින්දඛීලො පඨවිංසිතො සියා - චතුබ්භි වාතේහි අසම්පකම්පියො" යම් සේ පොළොවෙහි බැසගත් ඉන්ද්‍රඛීලය සිව්දිගින් හමන සුලඟින් සෙලවිය නොහැක. "තථූපමං සප්පුරිසං වදාමි - යො අරිය සච්චානි අවෙච්ච පස්සති" ආර්ය සත්‍ය නුවණින් අවබෝධ කළ සත්පුරුෂයා ඉන්ද්‍රඛීලයක් ලෙස නොසැලී සිටියි.

අෂ්ඨ ලෝක ධර්මයන්හි අකම්පිතව සිටීමට නම් තමන් ලැබෙන ඕනෑම දේකට උපේක්ෂාවෙන් මූණදීමේ හැකියාව තිබිය යුතුය. ලාභ - අලාභ, යස - අයස, නින්දා - ප්‍රශංසා, සැප - දුක, එදිනෙදා ජීවිතයේ තමන්ට ලැබෙන දේවල්ය. සාමාන්‍යයෙන් මේවායින් ධනාත්මක දේ ලැබෙන විට සතුටු වෙයි. ඍණාත්මක දේ ලැබෙන විට දුක් වෙයි. මීට හේතු වන්නේ ලාභ, යස, ප්‍රසංසා, සැප යනාදී යහපත් ප්‍රතිඵල බලාපොරොත්තු වෙන් සිටීමත් සහ ඒවාට ඇලීමත්, අලාභ, අයස, නින්දා, දුක, ආදිය බලාපොරොත්තු නොවීමත් සහ ඒවාට ගැටීමත්ය.

තමන්ගේ ජීවන පැවැත්ම හෙවත් පංච උපාදානස්කන්ධ ක්‍රියාදාමය අවබෝධ කරගෙන කිසිවිට නොසැලෙන සිතක් ඇතිකරගත හැකිය. අප සැලෙන්නේ සෑම සිතකම පවතින රූප, වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ යන පංච උපාදානස්කන්ධයේ යථාර්ථය නොදන්නා නිසාය. යමක් දිහා බලාගෙන සිටියත්, යමක් අහගෙන සිටියත්, යමක් ආඝ්‍රාණය කරගෙන සිටියත්, යමක් රස විඳගෙන සිටියත් යමක ස්පර්ෂය ලබමින් සිටියත්, යමක් මෙනෙහි කරමින් සිටියත්, කමින් බොමින් ඇවිදිමින් ආදී සෑම ක්‍රියාවක යෙදී සිටියත් ඒ සෑම සිතකම පංච උපාදානස්කන්ධය හටගනී. මෙම සිත උපාදානය නොකරගන්නේ නම්, එම සිත නොසැලේ.

<u>රූපය අවබෝධයෙන් නොසැලීම.</u>

මහණෙනි, "බිදේ" නුයි එයින් රූපයයි කියනු ලැබේ. ශීතයෙන්, උෂ්ණයෙන්, සා පිපාසාදියෙන් ද, මැසි මදුරු සර්පයින් ආදී සත්තුන්ගේ ස්පර්ෂයෙන් බිඳෙන දේ රූප වේ. එමෙන්ම පඨවි, ආපෝ, තේජෝ, වායෝ යන සතර මහා ධාතුන්ගෙන් සෑදුන දේ රූප යැයි කියනු ලැබේ.

තමන්ගේ කය ද රූපයකි. ගස්ගල් පර්වත ආදියත් රූප වේ. මේවා කඩා වෙන්කර බැලූවිට පෙර ස්වභාවය දක්නට නොලැබේ. උදාහරණයක් ලෙස කාන්තාවක් හෝ පුරුෂයෙක් කෙස්, ලොම් ආදී කොටස් වලට වෙන්කළ පසු එතන එවැනි කෙනෙක් නැත. එම කොටස් ද නැවත කඩා බිඳ වෙන්කර බැලූ විට මුල් රූපය එතන නොපවතී. මෙලෙස වෙන්කළ හැකි කුඩාම කොටස බුදුපියාණන් වහන්සේ "රූප කලාපයක්" ලෙස නම් කර ඇත. එහි ඇත්තේ පඨවි - තද ගතිය, ආපෝ - වැගිරෙන හෝ ඇලෙන සුළු ගතිය, තේජෝ - උෂ්ණ සීතල බව, වායෝ - හමායන ස්වභාවය එනම් පිම්බෙන හැකිලෙන ස්වභාවය. මේවා ස්වභාව ධර්මයේ ශක්තීන් හතරකි. කිසිවිටක වෙන්කළ කිසිවිටක වෙන්කළ නොහැක. සෑමවිටම විවිධ ස්වභාවයන්ට වේගයෙන් වෙනස් වේ. මෙවැනි රූප කලාප අසංඛ්‍යය කෝටි ප්‍රකෝටි ගණන් එකතු වී සෑදී ඇති අපගේ කය වැනි රූප ද ගස්වැල් ආදියද දිරන්නේ වයසට යන්නේ මෙම රූප කලාපයන් වේගයෙන් වෙනස් වන නිසාය. මෙවැනි රූපයන් නැවත නැවත පතන්නේ එහි යථාර්ථය නොදැනීම නිසාය. රූප වේගයෙන් වෙනස්වන නිසාත්, තමන්ට එය පාලනය කළ නොහැකි නිසාත්, එය මගේ කියා අල්ලා ගැනීමෙන් දුකක් ඇතිවන නිසාත්, පෙණ ගොඩක් මෙන් හරශුන්‍ය දෙයක් ලෙස සැලකීමෙන් රූපය පිළිසිඳ දැකිය හැකිය. එවිට ඕනෑම රූපයක් ඇතිවුනත් නැතිවුනත් තමන්ගේ සිත නොසැලේ. ඊට හේතුව වන්නේ රූපය කියන්නේ මගේ දෙයක් නොවන බව අවබෝධයයි.

<u>වේදනාව අවබෝධයෙන් නොසැලීම.</u>

මහණෙනි, "වළඳ කෙරේ" නුයි එයින් වේදනායි කියනු ලැබේ. එනම් යම් අරමුණක් ස්පර්ෂයෙන් ලබන සුඛ, දුක්ඛ, අදුක්ඛමසුඛ වේදනාවෝය. එනම් වේදනාව හටගන්නේ ස්පර්ෂයෙනි. "ඵස්ස පච්චයා වේදනා" යම් මනාප අරමුණක් තුළින් සුඛ වේදනාවත් එමනිසා විපරිනාම දුක්ඛතාවය ඇතිවන බව ධර්මයේ සඳහන් වේ. උදාහරණයක් ලෙස තමන්ට වාහනයක් ඇත්නම් හොඳයි කියන මනාප අරමුණින් ඇතිවන සුඛ වේදනාව අත්පත් කරගැනීම සඳහා මහත් උපායාසයකින් ණය ආදිය ලබා ගනිමින් ගමන් කරයි. වාහනය ගැනීමත් සමඟම සුඛ වේදනාව අත්පත් වුවද එය ඒ මොහොතේම දුක්ඛයක් බවට පත්වේ. එනම් දැන් වාහනය පරිස්සම් කිරීමට සිදුවේ. එය පීඩාවකි. එමෙන්ම පෙර නොවූ බියක් දැන් ඇත. දියබුබුලක් මෙන් සුඛ වේදනාව මෙන් සුඛ වේදනාව නැතිවන විටම දුක්ඛ වේදනාව නැතිවන විටම දුක්ඛ වේදනාව ඇතිවීමෙන් විපරිනාම දුක්ඛතාව ඇතිවී ඇත.

අත්පත් කරගත් වාහනය නඩත්තු කිරීමට සිදුවේ. තෙල් ගැසීමට, ගරාජ් ගානේ රස්තියාදු වීමට, කල්බදු වාරික ගෙවීමට, ආදායම් බලපත්‍ර ලබාගැනීමට, රක්‍ෂණය කිරීමට සිදුවේ. මේවා කරන්නේ අමනාප සිතකිනි. එනම් අමනාප අරමුණක් සමඟම දුක්ඛ වේදනාවත්, දුක්ඛ දුක්ඛතාවයත් ඇතිවේ.

කාලයක් යන විට දුක්ඛයන්ට සිත පදම්වීමක් සිදුවේ. දැන් වාහනය පරණ වෙලා. ඒකේ පොලුත් පටවයි. කඹවලිනුත් ගැට ගසයි. නමුත් තමන්ට වාහනයක් තියෙන බව පිළිගෙන කටයුතු කරයි. මෙසේ මෝහය නිසා අදුක්ඛම සුඛ වේදනාවෙන් සාදන සංඛාරත් සාදන මොහොතේම බිඳෙන බව නොවැටහේ. එහිදී ඇතිවන දුක්ඛතාව සංඛාර දුක්ඛතාව ලෙස හැඳින්වේ.

එනම් ඇස, කණ, නාසය, කය, මන ආදී ඉන්ද්‍රීන්ට මනාප අරමුණක් ආවත් අමනාප අරමුණක් ආවත් මනාපත් නැති අමනාපත් නැති අරමුණක් ආවත්, ඒවා ඇවිත් ආපසු යන දේවල්, දිය බුබුලක් වගේ විනාශවන දේවල්, ඇතිවන නැතිවන දේවල්, ඒවගේම මගේ කියා ගත්තොත් දුක් විඳින දේවල් යනාදී වශයෙන් නුවණින් මෙනෙහි කරයි නම්, වේදනා අවබෝධයෙන් නොසැලෙන සිතක් ඇතිකරගත හැකිය.

<u>සංඥාව අවබෝධයෙන් නොසැලීම.</u>

මහණෙනි, "හඳුනාගනී" නුයි එයින් සංඥා යි කියනු ලැබේ. එනම් නිල්, කහ, ලේ, සුදු එනම් වර්ණ, හැඩය පාට යනාදී ලෙස හඳුනාගැනීමයි. අප කුඩා කාලයේ සිට රූපයන්ට විවිධ සංඥා දමා හඳුනාගෙන ඇත. පොල් ගස, ස්ත්‍රිය, පුරුෂයා, කොවුල් හඬ, පිච්ච මල් සුවඳ, පරිප්පු රස ආදී වශයෙන් පඨවි, ආපෝ, තේජෝ, වායෝ යන සතර මහ ධාතුන්ගෙන් සෑදුන රූප වලට විවිධ නම් දමා ඇත. මෙසේ දමාගෙන ඇති සංඥා මිරිඟුවක් වැනිය. මිරිඟුවක් ඇතින් තියෙන බව පෙණුනත් ලඟට ගිය පසු එවැනි දෙයක් නොමැත. අප කුඩා කාලයේ සිට විවිධ දේ ඉගෙන ගන්නවා යනු රූප, වේදනා සහ විවිධ ක්‍රියාකාරීත්වයන් වලට නම් දමා සංඥා වශයෙන් ගොඩගසා ගැනීමකි. කථාකරන භාෂාව අනුව සිංහල, ඉංග්‍රීසි, දෙමළ යනාදී වශයෙන්ද අදහන ආගම අනුව මුස්ලිම්, බෞද්ධ, කතෝලික හින්දු, ඉස්ලාම් වශයෙන් ද, ජීවත්වන රට අනුව ඇමරිකාව, ඉන්දියාව, ශ්‍රී ලංකාව වශයෙන්ද, ඉපදුන කුළ අනුව ගොවිගම, කරාව, දුරාව, රදා, බෙර, හකුරු වශයෙන්ද සම්මුතිය තුළ සංඥා දමාගෙන හඳුනාගැනීම සිදුකරයි. නමුත් සත්‍ය වශයෙන්ම සංඥාව මුසාවකි.

උදාහරණයක් ලෙස තමන්ගේ ශරීරය කොටස් වශයෙන් වෙන් කළ විට, එතන එසේ නමක් දමාගත් කෙනා නොමැත. එමෙන්ම පොල් ගසක් කපා කොටස් කළ විට එතන එවැනි රූපයක් නොමැත. එමෙන්ම ශබ්ද, ගන්ධ, රස සහ ස්පර්ෂයන් සඳහා දමාගෙන ඇති සංඥාවන්ද ස

<u>සත්‍ය වශයෙන් නොපවතින දේ වෙයි.</u>

එමෙන්ම යමෙක් බනින විට තමන්ට තරහ යන්නේ එම පිටකරන වචන තමන්ට බනින වචන ලෙස සංඥා දාගෙන ඇති නිසාය. අපට නොතේරෙන භාෂාවකින් බැන්නොත් අපට තරහ නොයයි. මන්ද එම වචන වලට පෙර ලෙස සංඥා දමාගෙන නොමැති බැවිනි. එමෙන්ම තමන්ට හොඳ කියන විට ඒ අය සමඟ සුහද වේ. නමුත් නොතේරෙන භාෂාවකින් තමන්ට හොඳකින්වත් තමන් ගණන් නො ගන්නේ, තමන් එම භාෂාවේ ශබ්ද හඳුනාගෙන නොමැති නිසාය. කෙනෙක් තමන්ට හොඳ කියන විට ඇලීමත්, බනින විට ගැටීමත් ඇතිවනවා නම් තමන්ගේ සිත සැලෙයි.

මෙලෙස සංඥා යනු මිරිඟුවක් මෙන් ඇත කියා පෙණුනත්, සත්‍යය වශයෙන් නොපවතින දෙයක් බව යථාභූත ඥාණයෙන් අවබෝධ කරගත් විට කිසිඳු සංඥාවකට නොසැලෙන සිතක් සාදා ගත හැකිය. සංඥාව සම්පූර්ණයෙන් ම නැතිකර ගැනීමේ දී සංඥා වේදයිත නිරෝධය හෙවත් නිරෝධ සමාපත්තියට පත්විය හැකිය.

<u>සංඛාර අවබෝධයෙන් නොසැලීම.</u>

මහණෙනි, "සඞඛත කොට අභිසංස්කරණ කෙරෙත්" - (සඞඛතං අභිසඞඛරොන්ති) නුයි එයින් සංස්කාර යි කියනු ලැබේ. එනම් සකස්කරන ලද රූප, වේදනා, සංඥා, සංඛාර සහ විඤ්ඤාණය යලිත් යලිත් සකස් කිරීමයි.

15 පිටුවට...

පූජ්‍ය මැල්සිරිපුර ධම්මකුසල හිමි

# අනුත්තර ධම්ම චක්කය - නිර්වාණ ධාතුව

සම්මා සම්බුද්ධ මහා ප්‍රඥාවේ යථාර්ථය නම් සතර මහා භූතයන්ගේ පටිච්ච සමුප්පන්න භාවය (ආකාශ විඤ්ඤාන ඇතුලු ව) ඉදප්පච්චය තාවය (ඉමස්මිං සති - ඉදං හොති) නිසා මනසේ රූප සංඥා සංජාත නොවී නොයෙදී අක්‍රියත්වයට පත්වීමේ ස්වභාවයයි. මෙහි අනුසස් වශයෙන් සංඥා විරහිත වන නිසා ශූන්‍යත්වය තුල ආකාර සටහන් වශයෙන් හැඩ රුව වශයෙන් හෝ ගති ලක්‍ෂණ වශයෙන් හෝ ස්ත්‍රී පුරුෂ ලිංග වශයෙන් හෝ ළදරු, ළමා, තරුණ, වැඩිහිටි, මහලු වශයෙන් හෝ අතීත, අනාගත, වර්තමාන, කාල වශයෙන් හෝ පැනවීම් වශයෙන් හෝ කලු සුදු වර්ණ වශයෙන් හෝ ප්‍රඥප්ති, අන්වර්ථ, ආරූඪ වශයෙන් නම් කිරීමට හැඳින්වීමට කිසිසේත් අදාල බවක් යෝග්‍ය බවක් ප්‍රකට කිරීමක් සිදු නොවේමය.

අනිමිත්ත චේතො විමුක්තිය
සුඤ්ඤක චේතො විමුක්තිය
අප්පනිහිත චේතො විමුක්තිය

චේතනය නොවීම හෙවත් විමුක්තිය අනිමිත්තයයි. හෙවත් "නිමිති" නොමැතිවීමමයි. "අනිමිත්තය" යනු චේතනය නොවීමය. "ඉමස්මිං සති - ඉදං හොති. ඉමස්මිං අසති - ඉදං නහොති"

චේතනය නොවීම හෙවත් විමුක්තිය "සුඤ්ඤත" හෙවත් හිස් බවයි. "සුඤ්ඤතය" යනු චේතනය නොවීමයි.

ඉමස්මිං සති - ඉදං හොති
ඉමස්මිං අසති - ඉදං නහොති

චේතනය නොවීම හෙවත් විමුක්තිය යනු "අප්පනිහිත" බවයි. (අප්පනි හිත - කෙළෙස් ධර්මවලින් දුරවූ) අප්පනිහිත යනු චේතනය නොවීමයි.

ඉමස්මිං සති - ඉදං හොති
ඉමස්මිං අසති - ඉදං නහොති

ඉහත සම්බුද්ධ දේශනය ඔබ දර්ශනයට යොමු කරවයි. එනම් සංඥා අනිශ්‍රිත බවයි. සංඥා නිරෝධයයි. ඵස්ස නිරෝධයයි. බුද්ධ මනසයි. අමනසිකාරයයි. මහා සුන්‍යතාවයේදී විඤ්ඤාන, නාම, රූප, ප්‍රකට නොවන්නේ
ය. විඤ්ඥාන විරහිත මහා ප්‍රඥාව බුද්ධත්වය හෙවත් නිරෝධ සමාපත්තියයි. අර්හත් ඵලයයි.


"අනුත්තර ධම්ම චක්කං පවත්තිතං" (අනු + උත්තර ධම්ම + චක්කය + පවත්තති) අනු ශක්ති හෙවත් පරමාණු (පරම + අනු) ඉතාමත් සියුම් විද්‍යුත් ශක්ති ප්‍රභවයන් පැනවීම් වශයෙන් ඉක්මවාගිය (උත්තර + ඉක්මවූ) ධර්ම චක්‍රය - ස්වභාව ධර්මය ප්‍රවර්තනයේදී සංඥා විරහිත බවට පත්වීම හෙවත් විඤ්ඤාන, නාම, රූපයාගේ ප්‍රකට නොවීම ධර්මතාවය "නිරෝධය" නම් වේ. ඒ අතිපරිශුද්ධ සිතයි. ධම්ම + චක්ක + ධම්ම චක්ක + ප්‍රවර්තනය වන්නාවූ ධර්මය. "ධම්ම" යනු ස්වභාව ධර්මයයි. එනම් පඨවි, ආපෝ, තේජෝ, වායෝ, ආකාශ විඤ්ඤාණන යයි. චක්කය, ප්‍රවර්තනය, වහා වෙනස්වීම ධර්මතාවයට යටත්ය. එම නිසාම "ශක්ති" වශයෙන් ප්‍රකටය. මේ ප්‍රවර්තනයේදී ඇති බවත් "අස්ථි" නොයෙදෙන නැති බවත්, නොයෙදෙන නස්ථි නොවන නිසා පැනවීම්, හටගැනීම්, ප්‍රකට කිරීම් නොයෙදෙන ශූන්‍යත්වයය. අනිමිතිත සුඤ්ඤ. භාවයයි.

1.පුබ්බේ අනනුස්සුතේසු ධමෙමසු - පෙර නොඇසුවිරූ ධර්මයෙහි (දු + ඛ + දුක්ඛ + දෙකක ක්‍ෂයවීම) දුක්ඛ සත්‍යය
2.පුබ්බේ අනනුස්සුතේසු ධමෙමසු - පෙර නොඇසූවිරූ ධර්මයෙහි සමුදය සත්‍යය (තණ්හාව)
3.පුබ්බේ අනනුස්සුතේසු ධමෙමසු - පෙර නොඇසුවිරූ ධර්මයෙහි නිරෝධ සත්‍යය
4.පුබ්බේ අනනුස්සුතේසු ධමෙමසු - පෙර නොඇසුවිරූ ධර්මයෙහි "මාර්ග ඤාණ සත්‍යය" පහල විය.චතුරාර්‍ය සත්‍යයෙහි,

දහම් ඇස පහල විය
ඤාණය පහල විය
ආලෝකය පහල විය
ප්‍රඥාව පහල විය
විද්‍යාව පහල විය

"ඇති" බවත් "නැති" බවත් පැනවීම් නැති හෙවත් නොයෙදෙන තැන විඤ්ඤානයේ හටගැනීමක් නැත. සියලුම සංඥාවෙන් විරහිත සංකල්ප විරහිත "ඒ අනුත්තර ධම්ම චක්කයයි. ශාක්‍ය මුනින්ද්‍රයාණන් වහන්සේ වදාළ අනුත්තර ධම්ම චක්කය යනුයෙන් අනුදැන වදාළේ "අනු" ඉක්මවා ගිය දහම් සක ප්‍රවර්තනයේදී,

සිතෙහි සිත ක්‍රියා විරහිතය - නිවන
චින්තනයේ අචින්තයයි - නිවන
රූපයේ රූපය ක්‍රියා විරහිතය (අරූපාය) - නිවන
නිමිත්තයේ අනිමිත්තය - නිවන
සංඥාවේ සංඥා නිරෝධය - නිවන
මනසිකාරයේ අමනසිකාරය - නිවන
ප්‍රඥප්තියේ විඤ්ඤප්තියයි (ප්‍රපංචනය නොවීම) - නිවන
ප්‍රකටයේ අප්‍රකට බවයි - නිවන
රෝධයේ නිරෝධයයි - නිවන
ආගමනයේ විගමනයයි - නිවන
පැනවීමේ නොපැනවීමයි - නිවන
සම්මුතියේ පරමාර්යයි - නිවන
අසාරයේ සාරත්‍වයයි - නිවන
අවිද්‍යාවේ විද්‍යාවයි - නිවන
ලෞකිකත්‍වයෙන් ලෝකෝත්තරයි - නිවන
දිට්ඨිංච අනුපගම්ම - මිච්ඡාදිට්ඨියක් සම්මා දිට්ඨියක් නොයෙදනු - නිවන



මේ අනුත්තර දහම් ඇස පහලවීමේ අසිරියයි. දස සහශ්‍රී ලෝක ධාතූන්හි සියලු දෙව් මිනිස් බඹුන් හමුවේ විශ්මය දනවන අමන්දා නන්දයට පත්කල ප්‍රකට කිරීම පැනවීමයි.

අදෘශ්‍යමාන වූ ඉන්ද්‍රිය විෂය ගෝචර නොවන අචින්තය වූ අමනසිකාර වූ සීමා මායිම් නොමැති විශ්ව පදාර්ථයන් ගේ සැබෑ අරුත ලෝකයා හමුවේ ප්‍රකට කලහ. ආජීවක, ශ්‍රමණ, බ්‍රාහ්මණ, නිගන්ඨ, ජටිල, පරිබ්‍රාජක, සියලු ආගමික නිකායිකයන් භෞතිකත්වය පදනම්ව ඉගැන්වීම් හා දුෂ්ටිගත සාම්ප්‍රදායානුගත ඇදහිලි පුද පූජා පිලිගැනීම් පිලිපැදීම් වත් පිලිවෙත් යාගහෝම දුක්ඛදායි සුඛදායී උපවාස ආත්මගත දෘෂ්ටි නිරර්ථක බව ප්‍රකට කර එහ ඇති අර්ථ ශූන්‍යත්වය හේතු සහිතව ලෝකයා හමුවේ ගෙනහැර දැක්වූහ.

නාම රූප පැනවීම් කල නොහැකි විශ්වයේ යථාභූත තත්වය ප්‍රකටකර වදාළහ. යථාභූත යනු අවබෝධ ඥාණයයි. ප්‍රත්‍යක්‍ෂ ඤාණයයි. හෙවත් විඤ්ඤානයාගේ අවසානයයි.

"විඤ්ඤානස්ස නිරොධෙන
නත්ථි දුක්ඛසස සම්භවෝ"

විඤ්ඤානයාගේ නිරෝධයෙන් දුක් හටගැනීමක් නොමැත. මේ සොයා ගැනීම විශ්වාසයෙන් නොය. ඇදහිලි වලින් නොරය. පොත පතේ ඉගැන්වීම් වලින් නොරය. පාරම්පරික මතිමතාන්තර මිත්‍යා දෘෂ්ටි ජාලයෙන් තොරය. නිදහස්ය. මුඛ පරම්පරාවෙන් ආ දෙයක් නොවේ. පූජනීයයි සම්මත වූ පරිද්දෙන් හෝ ගරු කටයුතු යයි සම්මත වූ පමණින් සම්මානනීයයි. සම්මත වූ පමණින් බොහෝ දෙනාගේ ගෞරවාදරයට පාත්‍ර වූ පමණින් පිලිගත යුත්තක් නොවේ.

මේ සොයා ගැනීම සම්ප්‍රධායට වහල්වීමෙන් තොරය. අනුගතවීමෙන් තොරය. එමගින් ප්‍රතිවේධ ඥාණය ලැබිය නොහැක. එමෙන් සොයන විමුක්තිය කරා ලංවිය නොහැක. ප්‍රඥාව යනු විමුක්තිය යනු ආධ්‍යාත්මික වර්ධනයේ ගුණාත්මක පැත්තයි.

"පඤ්ඤභාවේ තබ්මා"
(ප්‍රඥාව ආධ්‍යාත්මික ශක්තියය)
"විඤ්ඤාණං පරිඤ්ඤෙයාං''
(විඤ්ඤානය ඇසූවිරූ දෙයකි)

ප්‍රඥාවෙන් අවධිවීම නැගී සිටිම රහතන් වහන්සේගේ "කිසයි" එහි අමනසිකාරයයි. එය ලෝකෝත්තරයි. විඤ්ඤාණයෙන් අවධිවීම, පුහුදුන් ස්වභාවයයි. මනසිකාරයයි. එය ලෞකිකයි.

ජාත භූත යනු "සංකත" වේ. හෙවත් "කත" වේ. (ලෝකය) අජාත අභූත අසංකත වේ.හෙවත් අකත වේ. (නිවනයි) හේතු ප්‍රත්‍යයන්ගෙන් හටනොගත් යනුයි.

"කතමානි භික්ඛවේ අසංකතං?
යෝභික්ඛවේ රාගක්ඛයෝ දෝෂක්ඛයෝ
මෝහක්ඛයෝ - ඉදං උච්චති අසංකතං"

රාග ක්‍ෂය කල, ද්වේශය ක්‍ෂය කළ, මෝහය ක්‍ෂය කල සිත අසංකතය. සංස්කාර නොවූ සිත විසංකාර සිත, භව නිරෝධ කල සිත (නිවන),අජාත යනු හටනොගත් යනුයි.
අභූත යනු නොවූ යනුයි.
අසංකත යනු කිසිවක් නොකල යනුයි.

නිවනෙහි ස්වභාවය
න උප්පාදෝ විඤ්ඤායති
න වයෝ විඤ්ඤායති
න ඨිත්‍යය අඤ්ඤතත්ථං පඤ්ඤායති.

හටගැනීමක් ප්‍රකට කල නොහැක.
වැයවීමක් නැති වීමක් ප්‍රකට කල නොහැක.
තිබූ හෙවත් තිබෙන ස්වභාවයෙන් වෙනස් ස්වභාවයකට පත්මක් ප්‍රකට කල නොහැක.

එහෙත් සවිඤ්ඤාණක අවිඤ්ඤාණක ලෝකය සංකතයක්
උප්පාදෝ පඤ්ඤායති
වයෝ පඤ්ඤායති
ඨිතස්ස අඤ්ඤතත්ථං පඤ්ඤායති.

උපන් බවක් ප්‍රකට කරයි. නැති බවක් ප්‍රකට කරයි. ඇති ස්වභාවය වෙනස්වන ස්වභාවය ප්‍රකට කරයි. ධාතු හයේ ක්‍රියාකාරීත්වයෙන් සංකත ලෝකයේ ස්වභාවය එසේය.

**පූජ්‍ය ගම්පහ සිරි සීවලී හිමි**

රංගිරි ශ්‍රී ලංකා RSL NEWSPAPER
රංගිරි - ශ්‍රී ලංකා මාධ්‍ය ජාලය
රංගිරි දඹුල්ල සංවර්ධන පදනම,
අංක 130, දඹුල්ල.

දුරකථනය: 066-2283606 (දිගුව 161) හෝ 071 5361328
ෆැක්ස්: 066-2284603
ඊමේල්: rangirinewspapers@gmail.com
වෙබ් අඩවිය: www.rangirisrilanka.lk

# හොඳ මිනිසුන් ගොඩනගමු

බුදු දහමට අනුව පුද්ගල ජීවිතය උපත සහ විපත අතර විහිද කෙළවර වන්නක් නොවේ. සංසාරිකව ගලා යන පුද්ගල ජීවිතය කෙළවර වන්නේ නිවන් අවබෝධයෙනි.

නමුත් මේ බව පසක් කර ගෙන සිටින්නේ කවුරුන්ද? ත්‍රිපිටකය පුරාම දක්නට ලැබෙන විශිෂ්ඨ බුදුවදන් තුළින් සංසාරික ජීවිතයේ යථාර්ථය මෙන්ම පෙර ආත්ම භවයන් පිළිබඳවද තොරතුරු මැනවින් ප්‍රකාශිතය. පුනර්භවය, පටිච්ච සමුප්පාදය, කර්මය යන බුදුදහමේ මූලික ඉගැන්වීම් තුළින්ම පෙර හා පසු භවයන් පිළිබඳව කියැවෙයි.

අප මේ කරුණු සිහිපත් කිරීමට යොමුවන්නේ වර්තමාන ශ්‍රී ලාංකීය ජන සමාජයේ හැසිරීම දැක ඇතිවන චිත්ත සංවේගය නිසාය.

ස්ත්‍රී පුරුෂ භේදයකින් තොරවත් වයස් භේදයකින් තොරවත් පුද්ගල හා සමාජීය බෙදීම් වලින් තොරවත් දාන, ශීල, භාවනාදී පිංකම්වල යෙදෙමින් ප්‍රඥාව වැඩිදියුණු කර ගතයුතු ආකාරය බුදුදහම අපට උගන්වා තිබේ.

ගෘහය හෙවත් පවුල් ඒකකය සකසාගැනීමේ සිට මහා පරිමාණ සමාජයක් යහමඟට යොමු කිරීම දක්වා වන දාර්ශනික පසුබිම බුදුදහමින් අපට පෙන්වා දෙයි.

වසර 2565ක් පුරා ගොඩනැගුණු බෞද්ධ සංස්කෘතියකින් අප රට පොහොසත්ය. ඒ තුළ ජාති භේද, ආගම් භේද නැත. සංහිඳියාව සමානාත්මතාවද ඒ තුළ දක්නට ලැබෙයි. පරපුරෙන් පරපුරට සංස්කෘතිය සහ දේශජ ඥානය ගෙන යනු ලබන්නේ අධ්‍යාපනය මඟිනි. බෞද්ධ අධ්‍යාපන ක්‍රමය නම් යාව නිබ්බාන වූවකි. එයනම් නිවන් දක්නා තුරු අධ්‍යාපනය ලැබිය යුතු බවය.

මෙරට සමාජ, ආර්ථික, දේශපාලනික රටාවට ගැලපෙන පුරවැසියන් බිහිකිරීමෙහිලා අප තවමත් පසුගාමීය. සාක්‍ෂරතාව ඉහළ අගයක් ගත්තද ප්‍රායෝගික භාවිතයේදී මිනිසුන් තෙකරම් නූගත්දැයි හිතෙන ආකාරයේ පුවත් සුලභය. විපත්, අපරාධ, අනතුරු, වංචා, දූෂණ හා පරිසර විනාශයත් ඇතුළු මෙරට සිදුවන විවිධ තලයේ සිදුවීම් මගින් ඒ බව අපට පසක් වෙයි.

මෑත කාලයේ මෙරටින් වාර්තා වූ ඇතැම් අපරාධ ජාත්‍යන්තරයද මවිත කරවන සුළුවිය. සාමකාමී, දැහැමි මිනිසුන් සහිත යහපත් සමාජයක් බිහිකරගැනීමේ වගකීම වර්තමානයේ දිවිගෙවන අප සතුය. නැතහොත් අනාගත පුරවැසියන් අපට වෛර කරනු, ද්වේශ කරනු නොඅනුමානය.

අපි නැවත ගමෙන් පංසලෙන් පාසලෙන් මෙරට සංවර්ධන ගමන ආරම්භ කළ යුතුව ඇත. දේශපාලන පරිවර්ථනයන් සිදුවූ තරමට සමාජ රටාව වෙනස් වන්නේ නැත. එය සැලසුම් සහගතව සහ අරමුණු සහගතව වෙනස් කළ යුතුය ඒ සඳහා යහපත් චේතනාවන් මෙන්ම පරිපූර්ණ මිනිසුන්ද යොදාගත යුතුය.

බුදුදහමේ පදනම එවන් උදාර මිනිසුන් බිහි කිරීමය. බුදුදහම ජනහදවත් වෙත ගෙනයාමේත් බුදු සසුන පෝෂණය කිරීමේත් වගකීම අප සැම සතු කාර්යභාරයකි.

# සංසාර ගමන

බුදුරජාණන් වහන්සේ ලොව පහළ වන විට ශාස්වත දෘෂ්ඨිය හා උච්ඡේදවාදය ඇසුරු කොට ගෙන පැවති දෙසැටක් වූ මිත්‍යා දෘෂ්ඨි ප්‍රතික්ෂේප කොට සත්ත්වයා භවයෙන් භවයට ආත්මයෙන් ආත්මයට රැගෙන යන්නේ මැවුම්කාර දෙවියෙකුගේ හෝ මහා බ්‍රහ්මයාණ කැමැත්තට අනුව නොව ඒ පුද්ගලයා විසින් ගොඩනඟා ගන්නා ලද කර්ම ශක්තියට අනුවය. මේ ආකාරයට නැවත නැවත ඉපදීමට බලපාන ප්‍රධාන හේතු සාධක නම් තෘෂ්ණාව ප්‍රධානව ඇති කරගන්නා ලද ක්ලේෂයන් නිසා බව බුදුරජාණන් වහන්සේ විවිධ අවස්ථාවල දේශනා කළ සේක. මෙලොව පවතින යථාර්ථය හෙවත් කිසිවෙකුට මෙය සත්‍යය නොවේය යනුවෙන් ප්‍රකාශ කළ නොහැකි සත්‍යය සතරාකාරය. එය චතුරාර්ය සත්‍යය ලෙස හඳුන්වයි. ලෝකයේ පවතින සදාතනික උතුම් සත්‍යය යන අර්ථයෙන් මෙය චතුරාර්ය සත්‍යය ලෙස සලකයි. බුද්ධත්වයට පත්ව පළමු ධර්ම දේශනාවේදීම ලෝකයේ පවතින සත්‍යය මනාව විග්‍රහ කොට පැහැදිලි කොට ඇති බව ධම්මචක්ක පවත්තන සූත්‍රය පිළිබඳ විමසා බැලීමේදී පැහැදිලි වේ. එම සත්‍යය සතර මෙසේය.

දුක්ඛ සත්‍යය
දුක්ඛ සමුදය සත්‍යය
දුක්ඛ නිරෝධ සත්‍යය
දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදා සත්‍යය

ඉහත දැක්වූ චතුරාර්ය සත්‍ය පැහැදිලි කළ බුදුරජාණන් වහන්සේ සත්වයා තුළ සන්තානගතව පවතින දුකට ප්‍රධාන හේතු සාධකයක් ලෙස තෘෂ්ණාව පැහැදිලි කරයි. මහණෙනි, මෙම චතුරාර්ය සත්‍යය ධර්මය අවබෝධ නොකර ගැනීම නිසා මටත් ඔබටත් බොහෝ කාලයක් මේ සසර තුළ සැරි සරන්නට සිදුවූ බව සංයුක්ත නිකායේ කෝටිගාම වග්ගයේ දේශනා කොට ඇත. ඉපදීමට හේතු සාධක වන කෙලෙස් ධර්මයන් සම්පූර්ණයෙන්ම නැති කිරීම තුළින් දුකින් එතෙර විය හැකිය. මෙම කෙලෙස් ධර්මයන් අතර තණ්හාව මූලික වන්නේ අල්ලා ගැනීම හේතුකොට ගෙන පුනර්භවය ඇතිවන බවයි. එම නිසා තව තවත් දුකට පත්වන බවයි. සත්ත්වයා දුකට පත් කරවමින් භවයෙන් භවයට ගමන් කරවන තෘෂ්ණාව පිළිබඳ විමසා බැලීම වැදගත් වේ.

**"න නහාපණ වස්සෙන තිත්ති කාමෙසු විජ්ජති අපපස්සදා දුඛා කාමා ඉති විඤ්ඤාය පණ්ඩිතො"**

ධම්මපදයේ බුද්ධ වග්ගයේ සඳහන් ඉහත ගාථාව තෘෂ්ණාව නිසා දුකට පත්වන බව පෙන්වා දෙයි. මිනිසාට කහවණු වැස්සකිනුත් කාමයන්හි තෘප්තියක් ඇති නොවේ. මේ නිසා කාමයෝ සිහිනයෙන් පානය කළ පැන් මෙන් මඳ ආස්වාස ඇත්තාහ. බොහෝ දුක් ඇති බව පණ්ඩිතයෝ නුවණින් දැනගත යුතුය යනු එහි අදහසයි.

මේ ආකාරයට බලනවිට විෂම වූ කෙලෙස් ධර්මයන්ගෙන් පිරුණු පුහුදුන් සත්වයා තෘෂ්ණාව හේතුකොට ගෙන දුක්ඛිත ස්වභාවයට පත්වෙයි. තමන්ගේ සසර ගමන දික්කර ගනියි. තණ්හාව දුකෙහි උපත බවත් දුක උපදවන දෙය බවත් තණ්හාව දෙවැනි කොටගත් පුද්ගලයා සසරින් එතෙර විය නොහැකි බවත් 'අංගුත්තර නිකායේ තණ්හා සූත්‍රයේදී' මෙන්ම ඉතිවුත්තක පාලයේ එන තණ්හුප්පාද සූත්‍රයේ දී බුදුරජාණන් වහන්සේ දේශනා කළහ. සත්ත්වයා කවරෙකු විසින් උපදවන්නේදැයි දෙවියෙකු විසින් අසන ලද ප්‍රශ්නයකට බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කළ පිළිතුර වූයේ සත්‍වයා විසින් උපදවන බවයි. ඒ බව 'ජානෙති සූත්‍රයේ' මැනවින් විස්තර වේ.

තෘෂ්ණාව හෙවත් තණ්හාව ප්‍රධාන වශයෙන් කොටස් තුනකට බෙදෙයි. එයින් පළමුවැන්න කාම තණ්හාවයි. එනම් ඇස, කන, නාසය, දිව, ශරීරය යන පංචකාම ඉන්ද්‍රියන් තුළින් රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ යන අරමුණු පිනවීමට දක්වන කැමැත්තයි. යමෙක් තම ඇසට පෙනෙන ලස්සන රුවක් කෙරෙහි ඇල්මක් ඇති කරගනියි. ඉන්පසු එය තමා සන්තක කරගන්නට නොයෙක් දුක් කම්කටොලු විඳියි. තමා කැමති දේ ලබාගත්තද එය රැකගැනීමට තව තවත් දුක් විඳියි. එය නොලැබුණහොත් නොලැබීම හේතුකොටගෙන දුකට පත්වෙයි. මෙය පහසුවෙන් තේරුම් ගැනිමට උදාහරණයක් ලෙස පුද්ගලයෙක් ලස්සන නිවසක් සෑදීමට ආශා කරයි. ඔහු ඒ වෙනුවෙන් බොහො සේ වෙහෙසෙයි. විවිධ දුක් ගැහැට ඒ වෙනුවෙන් විඳියි. එම නිවසත් සාදා අවසන් වුවත් ඊටපසු එය රැකගැනීමට ජීවිතය කැප කරයි. දුකට පත්වෙයි. එම නිවස නිමකර ගැනීමට නොහැකි වුවහොත් ඒ පිළිබඳව සිතමින් දුක විඳියි. ඇස මෙන්ම කන, නාසය, දිව, ශරීරය යන අනෙක් ඉන්ද්‍රියන් පිනවීමට ගන්නා උත්සාහය අවසානයේ දුකක් බවට පත්වෙයි. මෙය කාම තණ්හා යනුවෙන් හඳුන්වයි.

තණ්හාවේ දෙවැන්න භව තණ්හාවයි. ශාස්වත දෘෂ්ඨිය හේතුකොටගෙන රූප ලෝකවල හා අරූපී ලෝකවල ඉපදීම පිළිබඳව ඇති කැමැත්ත හා ධ්‍යාන සුවය පිළිබඳව ඇති සියුම් ආශාව ද භව තණ්හාව ලෙස හඳුන්වයි. ලෝභය හා ජීවිතය පිළිබඳ තදින් අල්ලා ගැනීම පිණිස හේතුවන ආශාව හෙවත් කැමැත්ත ද භව තණ්හාව ලෙස දැක්විය හැකිය. ආත්මය හා සත්වයා සදාකාලිකය වෙනස් නොවේය යනුවෙන් ඇතිකරගන්නා වැරදි විස්වාමය ශාස්වත දෘෂ්ඨිය ලෙස හඳුන්වයි. ඉහත දැක්වූ රූපි භව නම් රූපී බ්‍රහ්මලෝක දාසයයි. අරූපී භව යනුවෙන් දැක්වූයේ අරූපී බ්‍රහ්මලෝක සතරයි. මෙම විසිවැදෑරුම් වූ භවයන් පිළිබඳව ඇති කැමැත්ත හෙවත් ආශාව භව තණ්හාවයි.

තණ්හාවේ තෙවැන්න විභව තණ්හාවයි. මරණින් මත්තෙහි සත්වයාගේ යළි ඉපදීමක් නොවන බපවත් මේ ජීවිතයෙන්ම අවසන් වන බව කියවෙන උප්ජේද දෘෂ්ටිය සමඟ ඇති කරගන්නා කැමැත්ත හෙවත් ආශාව විභව තණ්හා යනුවෙන් හඳුන්වයි. මේ ආකාරයට කාම තණ්හා, භව තණ්හා, විභව තණ්හා යනුවෙන් තෙවැදෑරුම් වූ තෘෂ්ණාව තවදුරටත් කොටස් වලට බෙදී එකසිට අටවැදෑරුම් බව වන අටුවා ග්‍රන්ථවල සඳහන් වේ.

තෘෂ්ණාව හේතු කොටගෙන භවයෙන් භවයට ආත්මයෙන් ආත්මය ගමන් කරන සත්වයාගේ ඉපදීම හෙවත් පුනර්භවය නැති කිරීමට නම් තෘෂ්ණාව හෙවත් තණ්හාව ආශාව සම්පූර්ණයෙන් නැතිකළ යුතු බව නොයෙක් දේශනා තුළ සංක්‍ෂිප්තව දක්වා තිබේ. මේ අයුරින් තෘෂ්ණාව ප්‍රහීන කිරීම හේතුකොට ගෙන සදාතනික සුවය හෙවත් නිර්වාණය පසක් කර ගැනීමට හැකිය. ලෝකය පිළිබඳව සත්වයා පිළිබඳව නිවැරදි අවබෝධ කොටගෙන තෘෂ්ණාව ප්‍රධාන සියලු කෙලෙස් ප්‍රහීන කරමින් දානාදී පුණ්‍ය කටයුතුවල නියැලිය යුතුය.

තෘෂ්ණාව නැති කිරීමට නම් අනිවාර්යෙන් දාන පාරමිතාව පූරණය කළ යුතුය. දානය තුළින් ලෝභය ක්‍රමයෙන් අඩුවෙයි. අත්හැරීම ප්‍රගුණ කිරීම දානය තුළින් සිදුකිරීම නිසා සියලු දේ පිළිබඳව ඇති තණ්හාව ප්‍රධාන කෙලෙස් ධර්මයෝ නසා පාරමී ධර්මයන් සම්පූර්ණ කොට ධර්මානුකූලව ජීවත්ව පඤ්ඤාවෙන් යුක්තව කටයුතු කොට උතුම් නිර්වාණය පසක් කරගැනීමට පිණැති නුවණැති සත්වයෝ අප්‍රමාදීව කටයුතු කෙරෙත්වා...

පූජ්‍ය ගල්නෑවේ පඤ්ඤාරාම හිමි

# සඳ සිසිල

සංස්කාරක
"සඳ සිසිල"
රංගිරි ශ්‍රී ලංකා පුවත්පත
අංක 130,
නුවර පාර,
දඹුල්ල.

## සැර්දේවා මහ නාහිමි සඳ...

සුපතල ලක්බිමෙහි මැද සුපිහිටි මනරම්
කඳු සිකරයන්ගෙන් නිම කළ ලෙන් පෙරකම්
පෙති පිළිමයන් හා ලෙන් තුල ඇඳි බිතු සිතුවම්
පෙන්වා දෙන්නෙ පෙර රජකළ හෙළ විරුකම්

රංගිරි වෙහෙරෙ ඇති සුවිසල් පිළිම ගෙවල්
මතුකර දෙන්නේ අද ඇති දියුණේ සුවිසල්
ගුවනට මුසුවූ රංගිරි බොදු හඬ මනකල්
මෙහි එන ජනී ජනයා අගයති සැමකල්

මෙම දියුණුවේ හිමිකරු ගරු මහ නා සමිඳ
සහයට සිටියේ සැමදා ගරු හිමි අනඳ
සැලසුම් කලේ තම සිතුවිලි ගෙන නිබඳ
ආලෝකය පැතුරුනේ රංගිරි ලෙන තුලද

දෙස් හා විදෙස් බොදු හදවත් දිනාගෙන
රංගිරි වෙහෙර බැබලූ මුල දරාගෙන
සැමටම මෙත් වැඩූ කරුණාබර ගුණෙන
තෙරුවන් බෙලෙන් වැජඹේවා නිති තුටින

**ඇම්. ඞී. විජයවර්ධන**

## මගෙ පින්බර අම්මා...

නන් විසිතුරු දසුන් මා නෙත ගැටෙන්නේ
කන් කළු සකුණ මියැසිය සිත නිවන්නේ
තුන් පැහැ සුවඳ කුසුමන් නිති පිපෙන්නේ
පින් බිම හෙළ දිවයි මා මෙහි උපන්නේ

ඇල දොල මහා ගංගා සයුරට ඇදුනේ
දිය පිරී සුනිල වැව් පොකුණුද අඩුනූනේ
කෙත් යායකින් මුණු මුණු ගීතය ඇසුනේ
පින් බිම මගේ වෙන කාටද සම කෙරුණේ

දළදා මැඳුරෙ රන් වියනෙන් එළිය සැදේ
සිරිමා සමිඳු ළඟ හදවත් දුකින් මිදේ
සමනළ හිමේ වම් සිරිපා පිහිට රැදේ
වෙන කොයිබකද සැනසුම නම් මෙහිම සැදේ

පෙර කළ විසූ විරුවන් සිහි කරවන්නේ
සිගිරි පොළොන්නරු ගල් කණු දෙස්දෙන්නේ
මහවැලි එදා මෙන් අප රුධිරය වන්නේ
මගෙ හෙළ බිමයි මගේ දිවියට පණ දෙන්නේ

මව්බිම වටා බැඳි පවුරයි සාගරය
මුතු මුතු සිනා පානා මුතු ආකරය
සිත සනසනා නිල්මිණි බැඳි ආකරය
මව්බිම මගේ සිනහව පිරී සාගරය

ඇත් අස් ආදි විරුවන් පෙර කළ උන්නා
නාවික ගුවන් තුන් හමුදා දිවි දුන්නා
මගෙ මව රකින සටනේ මුල්තැන උන්නා
අභිමානයකි විරුවන් රටකට ඉන්නා

මා ඉපදුණු රටයි මට වෙන රටක් නැති
මගෙ මව් බිමට සමවෙන අන් කිසිත් නැති
සිව් මහ දෙවි රඳුන් ඒ දැක මුදුන් දෙති
මගෙ අම්මා රකින දෙවි බඹ සුරන් ඇති

**මහව සිරිධම්මචාරී මෙහෙණින් වහන්සේ**




## මිනිස් ඉරණම

දිවි අතරේ හමුවන
තැවේ කිසිදා නොමැකෙන
සැම හදවත් තුල රැඳුනා
ගලායන ජීවිත මං කතරේ
විඳිය යුතුම වේ...
නැතත් එය ජීවිතයක් නොවේ
සිතට දැනේ නොයෙක්
කල්පනා සයුරේ...
නමුදු එය මිනිස් ඉරණමකි
මෙලොවේ...
සැම හදවත් තුල රැව්දෙන
ජීවිත අර්ථය නොවැටහෙන
එක් මංපෙතකි
මෙය ලොවේ...
ආගම දම් අනුව
බුදුසමිඳුගේ ධර්මය අනුව
එක් කොටසක් වේය
මෙලොවේ...
සමිඳුනේ ඔබයි..
අප හදවත් තුළ
දුකින් මුදවා...
පහන් දැල්විය යුතු වන්නේ...

**සෙනාලි මධුෂිකා**

## සසර

පෙර පින් බෙලෙන්ලත් ලද
මේ මිනිස්කම
වටිනා බව නොදත් ජනී ජනයා
සසර දුක් විඳින්නේ මැයි
නිවණ සැනසුමයි
එය ලැබගැනුමට
වෙර දරමු අපි සැවොම...!

**චන්ද්‍රා - ගම්පහ**

## මම දුටු එදා ගම මනසින් දකිමි මම



වෙල් ඉපණැල්ල එළ මී ගවයන් රැඳුනු
තල් පොල් කිතුල් උස යන තරමට වැඩුනු
දෙල් කොස් එල දරන තරගෙට ගස් පිරුනු
ඇල් හාලේ බතේ රස මතකයි තිබුනු

යල් කන්නයත් මහ කන්නය මෙන් පෙණුනු
නිල්වන් ගොයම රන්වන් කරලින් නැමුණු
කල් යල් බලා එදවස ගොවිතැන් කෙරුණු
වල් කොල පොහොර වැඩි කෙරුවා වී අමුණු

විල් තෙර ජලාසේ ඇති පමණට හැදුනු
වැල් කෙකටියා ඕලුද මානෙල් පිපුනු
මල් පුබුදුවා කංකුං ගතියෙන් නිවුනු
උල් හොට ගනියි කොකුනගෙ දැක සිල් රකිනු

ගල් කඳු කිපයක් යා කරමින් තැනුනු
එල්ලා වැටෙන තුරුලිය අතිනත බැඳුනු
පිල් විදහා රඟන මොණරකු සේ තුරුණු
නිල් දිය පිරුණ වැව කෙරුවේ දුටුගැමුණු

සල්පිල් වෙද ගෙදර හැම ගමනක යෙදුනු
ගැල් බැඳි ගොනුන්ගේ ඒ සේවය ලැබුනු
සෙල් බිම් විහාරෙට යනවිට මඟ ඇරුනු
සිල්වන්තයින් නොකියයි ඒකට කරුණු

මුල් බැසගත්ත ඇටුවන් සහිතව වැඩුනු
ඉල් මහ පුරාවට මී මල් ඇඳ හැලුනු
තෙල් සිඳ ගන්න මී ඇට බෙහෙතට ගැණුනු
කොල්ලන් එදා දුටුවා ගස්යට වැටුනු

කුල්ලට ගාන්නට තම්බා ගෙඩි පැසුනු
මල්ලට කඩාගත් මැන්ගුස් මෙන් තිබුණු
අල්ලට ගෙන තිඹිරි මද කනවිට ඉඳුනු
ගිල්ලට වලසුන්ට අපහසු නැත දරුණු

වැල් මී නෙල්ලි රසකිඳ සුරැකිව රැකුනු
අල්ලන්නට අහස උස ගිය ගස් දමුණු
හල්මිල්ලත් බුරුත පලු අතරින් ඇදුනු
මල්වර වෙලා ඇත මොරගස් බැහැ ගනිනු

**එම්. එම්. කුලසිරි ද සිල්වා**

## මිතුරා හඳුනාගනිමු

සම්බුදු දහම වෙත සිත තිසි යොදන විට
අප හට දැනෙයි මිතුරා යන පදය තුට
විපතක් සිදුවිටදි අතහැර යනෙන සෙට
අත්හැර දැමිය යුතු පව්වුන් පළමු කොට

ලාභ ප්‍රයෝජන ලබනා තැන සිටිනා
කළ ගුණදම් අමතක කර සිත තුටිනා
අත්හැර යන්නේ තම සැප විහරණය විනා
නැති දොස් පරොස් පවසයි සැමවිට එතිනා

කොපමණ ගුණ දහම් දැන සිටියත් ජනයා
ඒවා රකින බව නම් නැත එම විනයා
හදවත් තුලින් මතුවෙන දුස් චරිත යෙනා
කියවෙයි පව්වු සිතුවිලි ඔහුගේ මුවිනා

කළණ මිතු දහම යලි ජන හද රැඳිලා
එක්වනු මැනවි සැමවිට පියමය පතලා
රැකගන්නට සිතමු සමගියෙ මල් ඉසලා
අතහැර නොයමු මිතුදම ගැන තිති සිතලා

**අජන්තා ශිරෝමණී දිසානායක**

# බුදුරදුන්ගේ අනන්තවූ ගුණ සමුදාය



අප්‍රමාණ වූ ජලස්කන්ධයකින් පිරීගිය මහා සාගරයෙන් දිය ගැනුමට කැමැත්තන් තම තමන් අතට පත් පමණට සරිලනසේ මුහුදු දිය පුරවා ගන්නාක් මෙන් අනන්ත වූ අප්‍රමාණ වූ ගුණ සමුදායකින් හෙබි බුදුරජාණන් වහන්සේ තුළ පැවති ගුණ සමුදාය තම තමන්ගේ අවබෝධ ශක්තියේ පමණට තේරුම් ගනු විනා බුදුගුණ ලියා හෝ කියා නිමකළ නොහැකි බව අසහාය පඬිරුවනක් වූ ගුරුළු ගෝමීහු තමන් රචනා කළ අමාවතුර හා ධර්මප්‍රදීපිකාව යන ග්‍රන්ථයන්හි සඳහන් කොට ඇත. බුදුගුණ මහා සාගරය මෙන්ද, අහස මෙන්ද, අනන්ත වන්නේය. අටුවාචාරීන් වහන්සේලාගේ මතයට අනුව යමෙකු බුදුරජාණන් වහන්සේගේ ගුණයම කල්පයක් වැනි දීර්ඝ කාලයක් මුලුල්ලේ ප්‍රකාශ කරමින් සිටින විට කල්පය ගෙවී ගියද බුදුගුණ කියා නිමකළ නොහැකි බව පෙන්වා දී ඇත. මෙහිදී එකී අනන්ත වූ අප්‍රමාණ වූ බුදුගුණ වලින් හැකි ප්‍රමාණයක් පිළිබඳව පමණක් විමර්ෂණයක යෙදීමට අපේක්ෂා කරමි.

මෙම විෂය පථය යටතේ සූත්‍ර පිටකයේ සඳහන් වන අරිය පර්යේෂණ සූත්‍රය, මහා පරිනිබ්බාණ සූත්‍රය, විභජ්ජ සූත්‍රය, පදාන සූත්‍රය, මහා පදාන සූත්‍රය, දෝණාලෝක සූත්‍රය, මහා සීහනාද සූත්‍රය යන සූත්‍ර වලදී බුදුරජාණන් වහන්සේ පිළිබඳවත් උන්වහන්සේ තුළ විද්‍යාමාන වූ අප්‍රමාණ අනන්ත ගුණ සමුදාය ගැනත් තොරතුරු මැනවින් විග්‍රහ ටකාට දක්වා ඇත. ඒ නිසාම ඇතැම් තැනක සුබො බුද්ධානං උත්පාදො (බුදු උපත ලොවට සෙත සලයසි) කිච්ඡෝ බුද්ධානං උත්පාදො (බුදුන් වහන්සේ කෙනෙකුගේ ඉපදීම අතිශයින් දුර්ලභ කරුණකි.) යනුවෙන් සඳහන් කර ඇත.

බුද්ධත්වය යනු බෝධිසත්ව වරයෙකු විසින් අති දීර්ඝ කාලයක් මුලුල්ලෙහි (සාරා සංඛ්‍ය කල්ප ලක්‍ෂයක් තිස්සේ) සමතිස් පාරමී ධර්මයන් සම්පූර්ණ කොට ආධ්‍යාත්මික ශක්තිය දියුණුකර ගැනීමෙන් අත්පත් කරගත්තාවූ අත්‍යුත්තම තත්වයකි. ඉහතින් දැක්වූ අටුවා ග්‍රන්ථවල සඳහන් වන ආකාරයට බුදුවරු වනාහි හැම කල්පයකම පහළ නොවන්නාහුය. උන්වහන්සේලා උපතින් වාසනාවන්ත වන කාලය බුද්ධෝත්පාද කාලය යනුවෙන් දැක්වේ. ආධ්‍යාත්මික ශක්තිය දියුණුකරගෙන බුද්ධත්වයට පත්වන බුදුන් වහන්සේ වනාහි ඉන්ද්‍රිය ගෝචර ප්‍රකෘති ලෝකය ඉක්මවා යාමට තරම් උත්තරීතර බලයක් ඇති ලෝකෝත්තර පුද්ගලයෙකු බවට නිරායාසයෙන්ම පත්වේ. එසේ ලෝකෝත්තර තත්වයට පත්වූ උන්වහන්සේ සතු බලය විශ්වයේ පවතින ආධ්‍යාත්මික බලයක් බවට නිතැනින්ම පත්වේ. මෙකී විමුක්තිය පාදක කොටගෙන ඇතිවන බුදුරජාණන් වහන්සේගේ බලය විශ්වයේ සිටින සියලු සජීවී අජීවී බලවේගයන් අභිබවා යාමට තරම් ප්‍රබල වූ බලයක් බවට පත්වේ. බුදුන් වහන්සේ සතු මෙම බලය ආනුභාව බලය හා ආඥාබලය වශයෙන් දෙයාකාර වේ. ආඥාභාව බලය යනු බුදුරජාණන් වහන්සේ සතු අනුහස්ය. ආඥා බලය යනු උන්වහන්සේගේ අණකිරීමේ බලයයි.

අටුවා ග්‍රන්ථවලට අනුව මෙම බලශක්ති සංකල්ප දෙක වර්ධනය වී ඇත්තේ ත්‍රිවිධ ක්ෂේත්‍රයන් පදනම් කොටගෙනය. ඒ අනුව ජාති ක්ෂේත්‍රය යනුවෙන් දක්වා ඇත්තේ දසදහසක් සක්වලය. (දස සහස් සෙසු ලෝකධාතුස) මේ ක්ෂේත්‍රය බෝධි සත්වයෙකු බුද්ධත්වයට පත්වන අවස්ථාවෙහි කම්පාවට පත්වන්නේය. දෙවැන්න වූ විෂය ක්ෂේත්‍රය යනු බුදුරජාණන් වහන්සේගේ සර්වඥතා ඥාණයට ගෝචර වූ ධර්මස්කන්ධයයි. ආඥා ක්ෂේත්‍රය යනු කෙළ ලක්ෂ ගණන් සක්වලය(කෝටි සතසහස් සෙසු චක්ක වාලෙසු) මෙහි බුදුන් වහන්සේලාගේ ආඥා බලය පැතිර පවතින්නේය. (පාළි සිංහල පිරිත් පොත - 1956 - ප්‍රස්ථාවනාව - vii පිටුව)

ත්‍රිපිටක සාහිත්‍යයේ සඳහන් ආකාරයට ඇතැම් අවස්ථාවලදී බුදුරජණන් වහන්සේ විසින්ම යම් යම් පුද්ගලයන් අසන ලද ප්‍රශ්නවලට පිළිතුරු වශයෙන් ගෙනහැර දක්වීම වදාළ කරුණු වලින්ද උන්වහන්සේ කෙබඳු පුද්ගලයකු ද යන්න පැහැදිළි වේ. එක් දිනක් බුදුරජාණන් වහන්සේ උත්කට්ඨා - සේතව්‍යා යන නගර දෙක අතර පා ගමනින් වඩින අවස්ථාවේදී හමුවූ දෝණ නම් බමුණෙක් උන්වහන්සේගේ පා සටහන් දැක ඒවා ඒකාන්තයෙන්ම මනුෂ්‍යයෙකුගේ නොවේ යයි සිතා විපරම් කරමින් යන විට එම මාර්ගයේ ගසක් මුල වැඩ හුන් බුදුරජාණන් වහන්සේ වෙත පැමිණ ඔබ දෙවියෙක් ද?, ගාන්ධර්වයෙක්ද? යක්ෂයෙක්ද? මනුෂ්‍යයෙක්ද? අසමින් ප්‍රශ්න කළේය. එහිදි බුදුරජාණන් වහන්සේ බමුණ මා ඔබ විසින් දක්වන ලද කිසිවෙක් නොවන අතර මා සියලු කාමාදී ක්ලේෂයන් ප්‍රශ්න කළ නිසා දෙවියෙක්, ගාන්ධර්වයෙක්, යක්ෂයෙක් හෝ සාමාන්‍ය මනුෂ්‍යයෙක් නොවෙමි බමුණ උපුලක් හෝ පියුමක් දියෙහි ඉපිද දියෙහි වැඩී දියෙන් ඉස්මතු වී දියෙහි නොගෑවී තිබෙන්නාක් මෙන් මමත් ලෝකයාගේත් මිනිසුන්ගෙන් ඉස්මතුවී ලෝකයා සමඟ නොගැටී, නොගෑවී, නොබැඳී සිටින උත්තරීතර මනුෂ්‍යයෙකු වන්නෙමි. කෙටියෙන් මා බුදුවරයෙක් වන්නෙමි. මා හැඳින්විය යුතු හොඳම නම "බුද්ධ" යැයි පැවසූ සේක. එය "බුද්ධෝති මං බ්‍රාහ්මණ ධාරේහි" යනුවෙන් වදාල බව අංගුත්තර නිකායේ එන අංගුත්තර නිකායේ එන "දෝණාලෝක" සූත්‍රයෙහි සඳහන් වේ. තවත් අවස්ථාවක අංගුත්තරාප ජනපදයෙන් චාරිකාවේ වැඩම කරන බුදුරජාණන් වහන්සේ මුණගැසුණු "තේණිය"නම් ජටිල බුදුරජාණන් වහන්සේට දානයකට ආරාධනා කළේය. එම අවස්ථාවට පැමිණ සහභාගිවූ ඒ ගම් වැසි "සේල්" නම් බ්‍රාහ්මණයා බුදුරජාණන් වහන් සේගෙන් ඔබ කවුරුන්දැයි විමසූ අවස්ථාවේදී

"අභිඤ්ඤෙය්‍යං අභිඤ්ඤාතං - භාවේතබ්බඤ්ච භාවිතං
පහතබ්බං පහිනං මේ - තස්මා බුද්ධෝස්මි බ්‍රාහ්මණ" යනුවෙන් බමුණ මා විසින් ලබාගත් විශිෂ්ඨවූ ඥාණයෙන් දුක්ඛ ෂත්‍ය සමුදාය සත්‍ය, නිරෝධ සත්‍ය, මාර්ග සත්‍ය යන චතුරාර්‍ය සත්‍ය අවබෝධ කළ හෙයින් "බුද්ධ" නම් වන බැව් වදාළ සේක. එසේම බුදුරජාණන් වහන්සේට බරණැස් නුවරදී හමුවූ "උපක" නම් ආජීවක නගන ලද ප්‍රශ්ණ වලට පිළිතුරු දෙමින් "මම සියල්ල අභිබවා සිටියෙමි දත යුතු සියල්ල දැනගෙන සිටිමි. සියලු කෙළෙස් දුරුකර තෘෂ්ණාව ආශාව නැති කළෙමි" යන ආකාරයට වදාළ බව මජ්ඣිම නිකායේ එන අර්ය පර්යේෂණ සූත්‍රයෙහි සඳහන් වේ. එසේම තවත් අවස්ථාවක මජ්ඣිම නිකායේ එන "බ්‍රහ්මායු" සූත්‍රයේ "බ්‍රහ්මායු බ්‍රාහ්මණයාගේ නියමයෙන් බුදුන් වහන්සේ තමන් කවරෙක්දැයි කියා ප්‍රකාශ කොට ඇත. ඒ අනුව බුදුරජණන් වහන්සේ "යමෙක් පුබ්බේනිවාසානු (පෙර විවුජාති) දන්නේද දිබ්බචක්ඛුඥාණයද ඇත්තේ ද (ස්වර්ගයත් අපායත් දකීද) නැවත ඉපදීමක් නැති කරන ලද්දේද අර්හත් නාමය ලැබ කෙළවරට පැමිණියේ ද, එහෙයින් මුණිවරයෙක් බවට පත් වුයේ ද සියලු ලෙසින් රාගයෙන් මිදුණේද ඒ නිසාම විසුද්ධ වූ සිත දන්නේද පහ වූත් ජාති ජාරා මරණ ඇත්තේද සියලු බඹසර ඇත්තේද සියලු ලෝකෝත්තර ධර්මයේ කෙළවරට පැමිණියේද එබඳු පුද්ගල තෙමේ "බුද්ධ"නම් වන්නේ යැයි වදාළ සේක. මේ ආකාරයට බුදු කෙනෙකුන් වන තැනැත්තා පිළිබඳව කරුණු ගෙනහැර දැක්වූ අප තිලෝගුරු බුදුරජාණන් වහන්සේ ට බ්‍රාහ්මණ වේදගූ, තේවිජ්ජා, සොත්තිය, අරහ කේවලී මුනි ආදී විවිධ අර්ථ ඇති ගුණවාචක නාම රාශියක් භාවිතා කරනු ලැබීය.

අප තථාගතයන් වහන්සේ මනුෂ්‍යයින් අතර ඉපදුන ශ්‍රේෂ්ඨතම මනුෂ්‍යයෙකි. උන්වහන්සේට සම කල හැකි වෙනත් අයෙකු නැති නිසා අසාමාන්‍ය මනුෂ්‍යයෙකි. මේ පිළිබඳව "ලෝකාවබෝධ සූත්‍රයේ" සදෙව් ලොවෙහිම ඔබ වහන්සේ හා සමාන කිසිවෙකු නැත. ඔබමය බුදුසමිදාණන් වහන්සේ ආදී වශයෙන් සටහන් වේ. බුදුරජාණන් වහන්සේ සමාන වන්නේ තවත් බුදුකෙනෙකුන්ට පමණක් බව රතන සූත්‍රයෙදි "යං කිඤ්චි චිත්තං ඉධවාහුරාවා" ආදී වශයෙන් අර්ථ ගන්වා ඇත. මෙලොව හෝ පරලොව ඇති කිසියම් හෝ වස්තුවකට හෝ දෙව්ලොව තිබෙන යම් උතුම් මැණිකකට හෝ බුදුරජාණන් වහන්සේ සමාන කොට දැක්විය නොහැක. ලොව ඇත්තාවු සිතා අවසන් කළ නොහැකි කරුණු සතරක් ඇත. එනම් බුද්ධ විෂය, ධ්‍යාන විෂය, කර්ම විෂය, ලෝක විෂය යන ඒවා ගැන සිතීමට, තර්ක කිරීමට යාමේදී සීමාවල් දැක්විය නොහැකි බැවින් ඒවා ගැන සීතිමෙන් වළකිණ ලෙස අංගුත්තර නිකායේ චතුක්ක නිපාතයේ එන "අචින්තයය සූත්‍රයේ" සඳහන් කොට ඇත. එහි බුදුන් වහන්සේ ගැනද සිතා හෝ කියා නොහැකි බව "එවං අචින්තියා බුද්ධා" යනුවෙන් දැක්වේ.

උන්වහන්සේ විසින් ලෝකයෙහි ඇත්තා වූ පදවි අතරින් උසස්ම පදවිය වු "බුද්ධත්වය" ලබා ගැනීම සඳහා යටත් පිරිසෙන් සාරසංඛ්‍ය කල්ප ලක්ෂයක් මුළුල්ලේ ධන පරිත්‍යාග පුත්‍ර පරිත්‍යාග, භාර්‍යා පරිත්‍යාග, ශරීරික අංග පරිත්‍යාග, ජීවිත පරිත්‍යාග යන මේවා පූජා කරමින් පෙරුම් දම් පුරන ලදී. බුදුරජාණන් වහන්සේගේ අනන්ත වූ ගුණයන් තබා උන්වහන්සේගේ හිස් මුදන කොතරම් උස කෙනෙකුට වුවද බැලිය නොහැක. ලොව සැමටම වඩා සෝභන වු, සුන්දරවූ තැනැත්තා උන්වහන්සේමය. මිනිස් ලොව දෙව් ලොව බඹ ලොව රූප ශෝභාවෙන් උන්වහන්සේට සමකළ කෙනෙකු නොවීය. උන්වහන්සේගේ ශරීරය ඔප දැමූ රන් කඳක් සේ බබලන්නේය.

සකල විද ක්ලේෂ ධර්මයන් නැසූ හෙයින් උන්වහසේගේ සිත අති පාරිශුද්ධය. කරුණාවෙන් තෙත්ය. උන්වහන්සේ අතීත වර්තමාන අනාගත යන කාලත්‍රයටම අයත් වූද කාළමුක්ඛ වූවද සියල්ල ඇතැඹුලක් සේ දත් සේක. උන්වහන්සේගේ දිවැසට කොතරම් දුර

12 පිටුවට....

**විශ්‍රාමලත් සහකාර සංස්කෘතික අධ්‍යක්ෂක ඩී.එම්.එච්.කරුණාරත්න මහත්මාගේ අභාවයෙන් පසු උපහාර පිණිස පළ කෙරේ.**

11 පිටුවෙන්...

# බුදුරදුන්ගේ අනන්තවූ ගුණ සමුදාය

තිබෙන දෙයක් වුවද කොතරම් සියුම් දෙයක් වුවද දර්ශනය වන්නේය. උන්වහන්සේගේ දිව, කනට ඉතා දුර ශබ්ද හා පියවි කනට නොඇසෙන ශබ්ද මැනවින් ඇසෙන්නේය. උන්වහන්සේට අනුන්ගේ සිත් අදහස් හා ගතිගුණ පෙනෙන්නේය. මිය යන අය උපදින ස්ථාන ඒ ඉපදීම් වලට හේතු වන පින් පව් පෙනෙන්නේය. බුදුරජාණන් වහන්සේගේ ධර්ම දේශනය ඉතාමත් ආශ්වර්යමත්ය. දහම් දේශනා කරන විට උන්වහන්සේගේ මුහුණ සෘජුවම සතර දිශාවෙහි සිට දහම් අසන සෑම දෙනාටම වෙනස්ව පෙනේ. උන්වහන්සේ එකම භාෂාවකින් කරන දේශනාවකින් අසන්නාවූ සෑම දෙනා හටම තමන්ගේ භාෂාවෙන් තේරෙන්නේය. උන්වහන්සේගේ මිහිරි කටහඬ තිරිසන් සතුන් පවා සතුටින් අසා සිටිති.

බුදුරජාණන් වහන්සේ මිනිස් ලොව සිටි අශ්වර්යමත් මනුෂ්‍යයෙකු බව ත්‍රිපිටක පාළියෙහි එන "අච්චරිය මනුස්සෝ" යන්නෙන් පැහැදිලි කොට ඇත. එසේ බුදුන් වහන්සේ ලොව සිටි "අසමසම" ආශ්වර්යමත් මනුෂයෙකු ලෙස සලකනු ලැබීමට හේතු වූ කරුණු කිහිපයක් වේ. එනම්

I. බුදුරජාණන් වහන්සේ සතු වූ අසම සම රූපවිලාශය

II උන්වහන්සේ සතු අසම සම වාග් විලාශය

III අසම සම ඥාණ විලාශය යන ඒවා වේ.

අසම සම රූප විලාශයට අනුව උන්වහන්සේට සාමාන්‍ය මිනිසුන්ට නොමැති වූ රූ විලාසය වඩාත් අලංකාර වූයේ උන්වහන්සේගේ සිරුරෙහි පිහිටි දෙතිස් මහා පුරුෂ ලක්ෂණයන් හා අසූවක් වූ අනු ව්‍යඤ්ජක නිසායත එසේම උන්වහන්සේ තුල පැවැති මනහර වාග් විලාසය අපූර්ව ජනකය.

ඒ සියල්ලටම වඩා බුදුරජාණන් වහන්සේ ආශ්වර්යමත් මෙන්ම අසම සම මනුෂ්‍යයකු වීමට බලපෑ සුවිශේෂි වූ කරුණක් වූයේ උන් වහන්සේ තුළ විද්‍යමාන වූ අනන්ත වූ ඥාණ සම්භාරයයි. ෂඩ් අසංබාරණ ඥාණය, චුද්දස ඥාණය, දශබල ඥාණ, අෂ්ඨවිද්‍යා ඥාණ, චතුර් වෛශාරද්‍ය ඥාණ, තිවිද්‍යා ඥාණ මෙන්ම දෙසැත්තෑ බුද්ධ ඥාණ යන ඒවා එසේ අනන්ත වූ ඥාණ වලින් විශේෂත්වයක් ගනී.

ලෝකයේ වෙනත් කිසිදු ශාස්තෘවරයෙකුට නොතිබුණු බුදුරජාණන් වහන්සේට පමණක් විශේෂ වූ විශාරද භාවයන් සතරක් වේ. එනම්,

1. සම්මා සම්බුද්ධ යයි කරන ප්‍රකාශයට එසේ නොවේ යයි කිසිවකුට කිව නොහැකි බව.

2. ක්ෂිණාශ්‍රව යයි කරන ප්‍රකාශයට එසේ නොවේ යයි කිසිවකුට කිව නොහැකි බව.

3. මෙම ධර්ම මාර්ග ඵලයන්ට අන්තරාකාරි යැයි කරන ප්‍රකාශයට එසේ නෙවේ යයි කිව නොහැකි බව.

4. ධර්මය නිවනට පමුණුවන සුළු යයි කරන ප්‍රකාශයට එසේ නොවේ යයි කිසිවකුට කිව නොහැකි බව.

යන චතුර්විධ විශාරද භාවයන් වේ. බුදුරජාණන් වහන්සේ සතුවූ මෙම විශාරද භාවයන් නිසාම ක්ෂත්‍රිය, බ්‍රාහ්මණ, ගහපති, ශ්‍රමණ, චාතුර්මහාරාජික, තව්තිසා, මාර, බ්‍රහ්ම යන කවර පිරිසක් ඉදිරියේ වුවද කෙරුණු සියලු සාකච්ඡා වලදී නිර්භයව, අභීතව, විශාරදව ඉදිරිපත් වීමේ භාග්‍ය හැකියාව උන්වහන්සේ තුළ තිබුණි. එසේම සියලු සත්වයන් පිළිබඳවද නිර්මල වූ අවබෝධයක් උන්වහන්සේ තුළ පැවතුණි.

බුදුරජාණන් වහන්සේ ශ්‍රේෂ්ඨ උතුරු මිනිස් දහමින් පරිපූර්ණ උතුමෙකු බව මජ්ඣිම නිකායේ එන චූල පණ්ණාසකයට අයත් මහා සීහනාද සූත්‍රයෙන් අනාවරණය වේ. එහිදී බුදුන් වහන්සේ වෙත පැවිදිව සිට සිවුරු හැර ගිය සුනක්ඛත්ත නැමැත්තෙකු විසින් උතුරු මිනිස් දහම් පිළිබඳව උන්වහන්සේ තුළ එතරම් විශාරද බවක් නැතැයි පැවසීමේ දුර්මතය දුරුකරලීම අරභයා ඉහත දක්වූ සූත්‍ර දේශනය පවත්වා ඇත. එසේම පිරිස් මධ්‍යයේ සීහනාද කොට ධර්ම චක්‍රය පැවැත්වීමටද සමත් දශබල ඥාණයක් බුදුන් වහන්සේට ඇති බවද බුද්ධත්වයේ ශ්‍රේෂ්ඨත්වය පිළිඹිබු කරන්නකි.

බුදුරජාණන් වහන්සේ තුළ පැවැති විශේෂ ගුණයක් වූයේ මහා කරුණාව හා සමානාත්මතාවයයි. මහා කරුණාව සමාධි ගුණය වශයෙන්ද ඇතැම් තැනක සඳහන් වේ. බුදුරජාණන් වහන්සේට එක් වරකට දෙලොස් කෝටි ලක්ෂ වාරයක් මහා කරුණා සමාපතීයට සමවැදිය හැක. අප සිද්ධාර්ථ ගෞතම ශාක්‍ය මුනීන්ද්‍රයාණන් වහන්සේට මීට චතුර සංඛ කල්ප ලක්ෂයකට පෙර නිර්වාණය සත්වානුකම්පාවෙන් ද හැරදමා සසරට පිවිස සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයක් වූ අති දීර්ඝ කාලයක් මුලුල්ලෙහි මහා වණයාමයක යෙදුණ සේක. එසේ කරනු ලදුයේ ලෝක සත්වයාට පිහිටවනු පිණිසමය.

බුදුරජාණන් වහන්සේ කෝශලාදී නරේන්ද්‍රයන්ගේ මාලිගාවට මෙන්ම කරුණක් ඇතිවී නම් රොඩී කුප්පායමටද වැඩි සේක. පුද්ගලයන් අතර උස් පහත් කුලීන කුලහීන බව ආදී තරාතිරම නොතකා කටයුතු කළ සේක. සුනීත, සෝපාක, රජ්ජුමාලා වැනි කුල හීනයන්ටත්, අනේපිඩු සිටු, විශාඛාව ආදී ධනවතුන්ටත් එක හා සමානව සලකමින් ධර්ම දේශනා කිරීමෙන් ඒ බැව් ප්‍රකට වේ. මේ නිසා රජවරුන් සිටුවරුන්ට මෙන්ම දුප්පතුන්ටද, අසරණයින්ටද, ලොව්තුරා නිවන් සැප ලගා කරගත හැකිවුණි. බුදුරජාණන් වහන්සේ දෙව්, බඹ, සුර, නරන් ආදි කොට ඇති සියලු සත්වයන් කෙරෙහි පතළ මහා කුළුණු මෙත් සිතින් සිදුකළ සේවය අති විශාලය.

චරත භික්ඛවෙ චාරිකං බහුජන හිතාය, බහුජන සුඛාය අත්‍ථාය හිතාය, දෙව මනුස්සානං.... මා එකෙනදවෙ අගමිත්‍ථ... (මහණෙනි, දෙව් මිනිසුන්ගේ යහපත පිණිස චාරිකාවෙහි හැසිරෙන්න. දෙදෙනෙක් එකමඟ නොයන්න) යනුවෙන් බුදු සසුනේ ප්‍රථම ධර්මදූත පිරිසට උපදෙස් දී උන්වහන්සේ ලෝක චර්යාවෙහි යෙදීම පිණිස උරුවෙල් දනව්ව කරා වැඩම කිරීමේම ඒ බව සනාථ වේ.

තිලෝගුරු බුදුරජාණන් වහන්සේ ශ්‍රේෂ්ඨ ශාස්තෘවරයෙකු බවට පත්වීමට තුඩුදුන් විශේෂ වූ කරුණක් වූයේ උන්වහන්සේ අරහං, සම්මා සම්බුද්ධ, විජ්ජාචරණ සම්පන්න, සුගත, ලෝකවිදූ, අනුත්තරෝ, පුරිස ධම්ම සාරථී, සත්ථා, දේවමනුස්සානං බුද්ධ, භගවා යන සුවිශේෂ වූ නව අරහාදී බුදුගුණ වලින් සම්ප්‍රයුක්ත වීමයි. එසේම උන්වහන්සේ තුළ පැවැති සීල ගුණයට සමකළ හැකි ලොව වෙනත් කෙනෙකු නොවීය. තවද උන්වහන්සේ තුළ පැවති සමාධි ගුණය, ප්‍රඥා ගුණය, අමිත ගුණය යන ගුණ සමුදාය ඉතා අති විශිෂ්ට වූ ඒවා වේ. එපමණකුදු නොව විමුක්ති ගුණය, විමුක්ති ඥාණ දර්ශන ගුණය, දමිත ගුණය (දමනය වූ අය දමනය කිරීමට හා දමනය නොවූ අය දමනය කිරීමට තිබූ) ඉතාමත් මැනවින් ප්‍රකට වූ ගුණ සමුදායන් වේ. රජගහ නුවර විසූ සභිය නම් පරිබ්‍රාජකයාත් සච්චක නම් පඩිවරයාත් නිගණ්ඨනාථ පුත්තගේ ශ්‍රාවකයෙකු වූ උපාලි ගෘහපතියාත් මිනීමරු සොරෙකු වූ අංගුලිමාලත්, රූප මදයෙන් මත්වූ ඛේමා බිසවත්, දරුණු ආලවක යක්ෂයාත්, නාලාගිරි හස්ති රාජයාත් බුදුරජාණන් වහන්සේ කිසිදු ආයුධයක් නොමැතිව බුද්ධ බලයෙන් (පුරිසධම්ම සාරථී) දමනය කළ සේක.

උන්වහන්සේ තුළ ලෝක සත්වයා කෙරෙහි පතළ මහා කරුණාව ඉමහත්ය. දිනයේ කටයුතු පෙර බත් කිස, පසුබත් කිස, පෙරයම් කිස, මැදියම් කිස, පැසුළුයම් කිස යනුවෙන් කොටස් පහකට බෙදා කටයුතු කරන ලද අතර පෙරයම් කිසෙහිදී අලුයම නැගිට මහා කරුණා සමාපත්තියට සමවැදී තමන් වහන්සේගෙන් පිහිටක් විය යුතු දුකට පත් පුද්ගලයන් පිළිබඳව ඵලකා බලා පා ගමනින් හෝ සෘද්ධියෙන් හෝ වැඩම කොට ඔවුනු සුවපත් කළහ. අංගුලිමාල තම මව ඝාතනය කිරීමට අදහස් කර සිටින විට ඒ අපරාධයෙන් වළක්වා ගැනීම සඳහා එම ස්ථානයට වැඩම කිරීම, මරණ මංචකයේ සිටි මට්ටකුණ්ඩලී දරුවාට පිහිටවීම, සුනීත සෝපාක ආදීන්ට පිහිටවීම මෙන්ම පසේ නදී කොසොල් සුද්ධෝදන ලිච්ඡවි ආදී රජදරුවන්ට මෙන්ම ජෝතිය, මෙණ්ඩක, අනාථපිණ්ඩික වැනි සිටුවරුද උන්වහන්සේ නිසා සුවපත් වූහ.

වඩතෙ දෙව දත්තමහි - චොරෙ අංගුලිමාලකෙ

ධනපාලෙ රාහුලෙ චෙව - සබ්බත්‍ථ සම මානසො යනුවෙන් දක්වා ඇති පරිදි තමන් වහන්සේ මැරීමට උපායෙදූ දේවදත්තටද, ඇඟිල්ලක් කපා ගැනීමට තමන් වහන්සේ ලුහුබැඳ ආ අංගුලිමාලයන්ටද, රා බී මත්වී පොළොව දෙදරවමින් දමා ඉදිරියට ආ නාලාගිරි ඇතාටද, උදෙනි රජු නිසා අසරණ වූ භද්‍රවතිකා ඇතින්නටද, තම අතිජාත පුත් රාහුල කුමරු වෙත දක්වූ ස්නේහයමය පෙන්වූ සේක. එසේම සිගමන් යැදි සිව්දරු පියා සුමන මාලාකරු බමුණු ගෙදරක වහල් වැඩ කළ මාලා දාසිය මෙන්ම නැතිවූ තම හරකුන් සොයා ගිය දුප්පත් ගොවියා පූතිගත්ත තිස්ස තෙරුන් වැනි නොයෙක් අයට තරාතිරම නොසලකා හැර උන්වහන්සේලාගෙන් සිදුවූ සේවය අතිමහත් බව ත්‍රිපිටක සාහිත්‍යයේ එන සිදුවීම් වලින් අනාවරණය වේ.

බුදුන් වන්සේ එවකට භාරත දේශයෙහි ව්‍යාප්තව පැවති විවිධ ආගමික ලබ්ධීන් අනුගමනය කළ අය කෙරෙහි ද දයාව, අනුකම්පාව, දක්වූ සේක. නිගණ්ඨ ආජීවක ජටිල, පරිබ්‍රාජක වැනි ආගමික පූජකවරුන්ට මෙන්ම තෙමන් හා සමාන කෙනෙකු නැතැයි පැවසූ සච්චක , බකබ්‍රාහ්මණ, ජානුස්සෝනි ආදීන් සමඟද වාද විවාද කොට යහමගෙහි යෙදූහ. එමෙන්ම මෝර නිවස, හග්ගවගොතක, පරිබ්‍රාජක වැනි ආරාම වලටද සකුළුදායි .නම් පිරිවැජියා හමුවීමට ද ගිය බව සඳහන් වෙයි. අම්බට්ඨ, සෝණදණ්ඩ, පායාසි වැනි බමුණන් ද සුවය ලබා ගන්නා ලද්දේ බුදුරජාණන් වහන්සේගෙන්ය.

බුදුන් වහන්සේගේ ලොව සිටි උතුම් වූ අසහාය වූ ශාස්තෘවරයෙකු වීමට හේතු කාරණා වූ කරුණක් වූයේ උන්වහන්සේගේ සිය ශරීරයෙන් නික්මුණු බුද්ධ රශ්මියයි. සිද්ධාර්ථ බෝධිසත්වයන් වහන්සේ වෙසක් මස පුර පසලොස්වක පොහොය දිනයේ සකල විධ ක්ලේශයන් නසා දස මරුන් පරදවා ලොව්තුරා බුද්ධත්වයට පත්වී තමන් වහන්සේ වැඩහුන් බෝධි මූලයේ අනේකවිධ සමවත් වලට සම වදිමින් සමවත් සුවයෙන් සතියක්ම ගතකළ සේක. අනතුරුව ඒ පළගින් නැගී සිට සාරසංකල්ප කල්ප ලක්ෂයක් මුළුල්ලෙහි මා විසින් සෙවූ මේ ධර්මය මෙම පර්යංකයෙදී අවබෝධ කර ගතිමියි සිතා දෙවන සතියේ බෝධීන් වහන්සේට දෑස් නොපියා අනිමිස ලෝචන පූජාව පැවැත්වූ සේක. මෙහිදී දෙවියන්ට ඇතිවූ සැකය දුරුකරලීම සඳහා අහසට පැන නැගී පලක් බැඳ යමක මහා ප්‍රාතිහාර්ය දක්වූ සේක. ඉන්පසුව උන්වහන්සේ ආකාසයෙන් බැස පර්යංකයටත් සිටි තැනටකත් අතර සතියක් සක්මන් කළ සේක. ඒ එක් විසි දිනයේම තථාගත ශරීරයෙන් රැස් විහිදීමක් සිදු නොවීය. සතර වන සතියේ උන්වහන්සේ බෝධීන් වහන්සේට වයඹ දිග එක් ස්ථානයක වැඩ හිඳ අභිධර්ම පිටකයේ සප්ත ප්‍රාකාරයෙන් මෙනෙහි කිරීම ආරම්භ කළ සේක. ධම්ම සඞ්ගිනි, විභඞ්ග, ධාතු කථා, පුද්ගල ප්‍රඥප්ති කථාවත්ථු යමක යන සය වහන්සේගේ තියුණු නුවනට නොදනුණු නිසා එතරම් ප්‍රීතියක් සතුටක් ඇති නොවුණි.

එහෙත් පට්ඨානප්‍රකාරණය මෙනෙහි කිරීමත් සමග ඉමහත් ප්‍රීතියක් පහළ විය. එයින් උන්වහන්සේගේ සකල ශරීරයම පැහැදින. ගින්න පැහැදිලි දෙයක් වන නිසා එයින් පිටතට ආලෝකයක් නික්මෙන්නාක් මෙන් තථාගතයන් වහන්සේලාගේ ශරීරයෙන් ආලෝකයක් නික්මෙන්නට විය. අප බුදුරැස් යනුවෙන් හඳුන්වනුයේ එම ආලෝකයයි. බුදුන් වහන්සේගේ කෙස් ලෝම වලින් හා නේත්‍රා වලින් නිල් රතු තැන් වලින් නීල රශ්මිය විහිදෙන්නට විය. ලේ මස් වලින් හා නේත්‍රාවන්හි රතු තැන් වලින් ලෝහිත රශ්මිය නික්මිය. ශරීරයේ ඇට වලින් හා දත් වලින්ද නේත්‍රායන්හි සුදු තැන්වලින් ද ඕදාත රශ්මිය නිකුත්වන්නට විය. මාංජිෂ්ඨ හා ප්‍රභාෂ්වර පීත රශ්මීහු ශරීරයේ ඒ ඒ තැන්වලින් නික්මුණාහ. ඒ රශ්මීහු ලොව පුරා අහසෙහි පැතිර ගියහ. පට්ඨාන ප්‍රකාරණය සම්මර්ෂණය පසු තථාගත ශරීරයෙන් පසු අසු රියනක් තැන් පැතිර සිටින නිශ්චල රශ්මියක් ඇති කේතුමාලා යයි කියන්නාවූ නීල රශ්මිය විහිදින. ව්‍යාම ප්‍රභාව යයි කියනුයේ බුදුන් වහන්සේගේ දේහය වටා බඹයක් තැන පැතිර නිශ්චලව පවතින රශ්මියයි.

බුදුන් වහන්සේ තුළ පැවති විශේෂ ගුණයක් වූයේ අටලෝ දහමින් (ලාභ-අලාභ, යස-අයස, නින්දා-ප්‍රශංසා, සුඛ-දුක්ඛ) කම්පා නොවීමයි. මේ සඳහා නොයෙක් ආකාරයේ සිද්ධීන් නිදසුන් ලෙස දක්වාලිය හැක. මාගන්දියගේ බැන වැදීම් වලින්ද සුන්දරි පරිබ්‍රාජිකාව මරා දෙව්රම් වෙහෙර මල් ගොඩෙහි

15 පිටුවට...

# ධන සම්පත් නිසා වියැකී යන මනුස්සකම



මිනිසා පරිභෝග කරන වස්තූන් අතර ධන සම්පත් ප්‍රධානත්වයක් ගනු ඇත. මිල - මුදල්, යාන - වාහන, හරක - බාන, වතු - පිටි, ඉඩ - කඩම්, රන් - රිදී, මුතු - මැණික්, ආදී සියලු වස්තූන් මිනිසාගේ දෛනික අවශ්‍යතා උදෙසා භාවිතා කරනු ඇත. ඒ සියල්ල ලබාගැනීම උදෙසා සත්වයා බොහෝ වෙහෙසෙනු ඇත. උපතේ පටන් මියෙන තුරා වෙහෙසෙන්නේ භෞතික වස්තු සම්පත් උදෙසාය.

කාලීන වශයෙන් ගත් කල්හි අද බොහෝ දුරට ධනයට මුල් තැනදී ඇත. ධනය ඇත්නම් ඔහු සියලු දේ තුළින් පරිපූර්ණ කෙනෙකු ලෙස දැකීමටද පුහුදුන් සත්වයා හුරුවී ඇත. මිල මුදල් සෙවීමට වෙහෙසීම කොතරම් දුරට උග්‍ර වී ඇද්ද යන්න ඒ ඒ ජීවිත වල අභ්‍යන්තරය පරීක්ෂාකර බැලීමෙන් ප්‍රත්‍යක්ෂ වේ. හරියට ආහාර පානවත්, ඇඳුම් පැළඳුම්වත් පරිභෝග නොකර ධනයම ඉපයීමට සත්වයා හුරුවී තිබේ. මේ පිළිබඳ සාකච්ඡා කළ යුත්තේ ධනය පසුපසම හඹා යන පුද්ගලයන් තුළ ගුණධර්ම, යුතුකම් ක්‍රම ක්‍රමයෙන් ගිලිහී ඇති බැවිනි.

බුදුන් කල මුදල් වෙනුවට කහවණු භාවිතා කරන ලදී. ධනය සම්බන්ධව බුදු හිමිගේ දෘෂ්ඨිය සඳහන් වන පුවතක් බුද්ධ චරිතය තුළ ප්‍රකට වේ.

වරක් සැවැත්නුවර ධනවතකුගේ ගෙයක් බිඳ මුදල් සොරාගත් සොර කණ්ඩායමක් එම රාත්‍රියේම අසල කුඹුරකට ගොස් සොරගත් මුදල් බෙදා ගනිද්දී ඔවුන් අතින් එක් මුදල් පොදියක් කුඹුරේ වැටී තිබිණ. කුඹුරු හිමි ගොවියා උදෑසන සිරිත් පරිදි කුඹුරට ගොස් කුඹුර සාන්නට පටන් ගත්තේය. අළුයම කරුණා සමාපත්තියට සමවන් බුදුරජාණන් වහන්සේ මේ අහිංසක ගොවියා කරදරයට පත්වන බවත් ඔහුට පිහිට වීමට හැකිබවත් දැන උදෑසනම ආනන්ද තෙරුන් සමඟ ගොවියා කුඹුර සාමින් සිටි ස්ථානයෙන් වැඩම කරන්නේ කුඹුරෙහි වූ මුදල් පොදිය දැක ආනන්ද තෙරුන්ට කථාකර "ආනන්ද... සර්පයෙක් දුටුවෙහිදැයි විමසූහ. "ස්වාමීන් දුටුමියි" කියා පිළිතුරු දුන් ආනන්ද තෙරණුවෝ පසුම්බිය දකිමින්ම බුදුරදුන් පසුපස වැඩම කළහ. මේ කථාව අසා ගොවියා සීසෑම නතර කර සර්පයා කොහිදැයි විමසන්නේ මුදල් පසුම්බිය දැක "බුදුරජාණන් වහන්සේ මෙයට සර්පයෙකැයි" ප්‍රකාශ කළේ කිසියම් හේතුවක් නිසා වියයුතුයැයි සිතා එය රැගෙන පෙනෙන ස්ථානයක තබා සීසාන්නට පටන් ගත්තේය. ගෙහිමියෝ සොරු සොයා ඒ මේ අත යන්නේ කුඹුරෙහි වූ සලකුණු දැක විමසන විට මුදල් පසුම්බිය දැක හැඳින ගොවියා ගැන සැක උපදවා ඔහුව රජුට අල්වා දුන්හ.

රජු ඔහුව මැරවීමට නියම කළේය. වධකයෝ ඔහු වධකස්ථානය කරා ගෙන යද්දී "ආනන්දය සර්පයා දුටුවාද? ස්වාමීනී, දුටිමි" යි යන්න දිගටම කියන්නට වූයෙන් කුමක් නිසා එසේ කියන්නේ දැයි රාජ පුරුෂයෝ ඔහුගෙන් විමසූහ. "රජු ඉදිරියට ගෙන ගියහොත් කියමි" යි ඔහු කීයෙන් ඔහු වහා රජු ඉදිරියට පමුණුවන ලදී. එවැන්නක් කීමට හේතු කවරේදැයි රජු ඔහුගෙන් විමසිය. උදෑසන බුදුරදුන් කුඹුර මැදින් වඩනා ගමනේදී එසේ කී පුවත ඔහු රජතුමාට හෙළි කළේය.

එදින සන්ධ්‍යාවෙහි ගොවියා ද රැගෙන රජතුමා විහාරයට ගොස් බුදුරජාණන් වහන්සේගෙන් මේ ගැන විමසීය. බුදුහු කුඹුර මැදින් වැඩම කළ බවත්, ආනන්ද තෙරුන්ට මුදල් පොදිය පෙන්වා සර්පයෙයැයි ප්‍රකාශ කළ බවත්, බුදුහු රජතුමාට විස්තර කළහ. ස්වාමීනි, "මේ සිද්ධිය නොවුණි නම් මේ අසරණයාගේ ජීවිතය අද විනාශ වන්නට තිබිණි. ඔබවහන්සේ නිසා අද ඔහු ජීවිත දානය ලද්දේයැ"යි ප්‍රකාශ කළේය. බුදුරදුන් මේ සිද්ධිය මුල්කොට දෙසූ දහම අසා ගොවියා සෝවාන් වූයේය.

මෙම කතා පුවතින් පැහැදිලි වන්නේ මුදල් සර්පයෙකුට උපමා කර තිබීමය. මුදල් පසුපස හඹා යෑමේදී ගුණ ධර්ම පසකට දමනු ඇත. පුහුදුන් සත්වයාට මුදල් සෙවීමේ ඇතිවීමක් කිසිදා ඇති නොවේ. පැරණි සමාජය තුළ පැවැතියේ ධාර්මික ජීවන ප්‍රතිපදාවකි. අපේ රටේ ඉතිහාසය පරිශීලනය කර බැලීමෙන් ඒ බව මනාව පැහැදිලි වේ. පැරණි වැසියා ආගන්තුක සත්කාරයට මුල් තැනක් දුන්හ.

දානය, ප්‍රියවචනය, අර්ථචර්යාව, සමානත්මතාවය යන සංග්‍රහ තුළින් පිරිපුන් වූහ. කරුණාව, දයාව, මෛත්‍රිය වර්ධනය කළහ. කළගුණ සැලකීම, මව්පිය උපස්ථානය, අසරණ අයට සැලකීම වැනි උතුම් ගුණාංග වලින් ජීවන ගමන් මඟ සැළසුම් කොටගෙන එය ප්‍රායෝගික ජීවන මාර්ගයට සම්බන්ධ කරගත් ආකාරය ඉතා අගනේය. නුමුදු අද සමාජය දෙස බැලීමේදී එම උසස් ගුණාංග වලපල්ලට දමා මුදල් පසුපසම හඹා යමින් මිනිසත්කමේ වටිනාකම පවා අමතක කොට ඇත.

මුදල් මත හඹා යන අද සමාජය තුළ කරුණාවක්, දයාවක්, ඉවසීමක් නැත. දෙමව්පියන්ට සැලකීම, වැඩිහිටියන්ට සැලකීම, කළගුණ සැලකීම, අසරණයින්ට පිහිටවීම වැනි උතුම් ගුණාංග ක්ෂය වී යමින් පවතී. ඒ සියලු දෙයටම හේතුව වී ඇත්තේ අද මුදල් වලට මිනිසත්කම පවා පරදුවට තබා ප්‍රමුඛස්ථානය දී තිබීමය. කෙනෙකුට කෙනෙක් පරයා ඉහළට යෑමට කරන උත්සාහය තුළ තරඟකාරී ස්වභාවයකින් සටනක් බිහිවී ඇත. මුදල් මත ජීවිත පවා විනාශ කිරීමට තරම් සමහර පිරිස් අඥාන වී ඇත.

සමාජයේ සෑම අංශයක් දෙසම බැලීමේදී එම තරඟකාරී ස්වභාවය දැකීමට පුලුවන. මුදල රජ වී ඇත. ගුණධර්ම කැලෑ වැදී ඇත. උසස් මනසක් ලැබූ සත්වයා මිනිසා වුවද සමහර තැන් වලදී තිරිසන් සත්වයින්ටත් අන්ත විධියට කටයුතු කිරීමට පෙළඹෙනු ඇත. මුදල්, ධන සම්පත්, පරිහරණ කරන අඥාන සත්වයින්ට මිනිස්කමේ වටිනාකමක් නොපෙනෙනු ඇත. දුර්ලභව ලබාගත මිනිස් දිවියේ ඇති වටිනාම නොතේරීමට තරම් අන්ධ වී ඇත. පංචකාම සම්පත් තුළම ඇලී ගැලී මිරිඟුව පසු පස හඹා යන මුව පෝතකයින් බවට පත්වී ඇත.

බුදුහිමි ව්‍යග්ගපජ්ජ සූත්‍රය තුළින් ගිහි ජීවිතයක් ගතකරන අයුරුත් ධන සම්පත් පරිහරණය කරන අයුරුත් දක්වා ඇත. නමුදු එහි නොපෙනෙන පැත්ත පිළිබඳවද අවධානය යොමුකොට ඇත. සෑම දෙයකටම දෙපැත්තක් ඇති බැවින් අප අන්තයකට වැටීමට තරම් අඥාන නොවිය යුතුය. හොඳ - නරක, කුසල් - අකුසල්, මෙලොව - පරලොව මේ ආදී වශයෙන් සිතා බැලිය යුතුය. පුහුදුන් සත්වයා කාමභෝගී ජීවිතයක් ගතකිරීමේදී ඒ ගැන ද නිරන්තරයෙන් සිතිය යුතුය.

බුද්ධ චරිතයෙන් ඒ සම්බන්ධව අවශ්‍ය පිටුවහල ලබාගත යුතුය. ඉපදී ටික කලක් ජීවත් වී මරණයට පත්වන සත්වයා එම ජීවිත කාලය තුළ සිතිය යුත්තේ අවසන් ගමන යෑමේදී කුමක්ද ගෙන යා යුත්තේ හා මොනවද අප පසු පස්සෙ ගමන් කරන ධන සම්පත් යන වගය. අපට භෞතික ධනය වස්තුව ගෙන යෑමට නොපුළුවන. එබැවින් ඒ මතම ඇලී ගැටී මනුස්සකම, ගුණධර්ම අමතක නොකිරීමට වගබලා ගත යුතුය. ශ්‍රද්ධා, ශීල, හිරි, ඔත්තප්ප, සුත, චාග, පඤ්ඤා ආදී ආධ්‍යාත්මික ගුණ වගාව දියුණු කරන ඊළඟ ආත්මභාවය යහපත් කරන ධනයම වර්ධනය කරගත යුතුය. එසේ වර්ධනය කොටගෙන දුර්ලභව ලැබූ මිනිසත්කම ගුණධර්ම තුළින් ඔපවත් කර ගැනීමටත් මිනිසත්කම රැකගැනීමටත් පුණ්‍ය ශක්තියෙන් පොහොසත් වීමටත් අධිෂ්ඨාන කර ගැනීමම උතුම් වන්නේය.

**ගලගෙදර රතනවංශ හිමි**






තොටිල්ලෙ ලී වැටෙන් එහා
තව වැටවල් ගොඩක් ඇතී
තොටිලි වැටෙන් පනින පුතා
ඒ වැටවල් බිඳිනු ඇතී

බුදුන් දවස මර දූවරු
ම පුතණුවන් මුණ ගැසෙතී
උන්ගේ සිව් සැට මායම්
මගේ පුතුට අරුම නැතී

බිතු සිතුවම් රූ මෙන් සිටි
මිතුරෝ හෙට සතුරු වෙතී
උන් සදනා මල පුඩු වල
මගේ පුතා බැඳෙනු නැතී

ගේය පදː-
මහාචාර්ය සුනිල් ආරියරත්න
තනුව හා සංගීතයː-
වික්ටර් රත්නායක
ගායනයː-
අබේවර්ධන බාලසූරිය



# තොටිල්ලේ ලී වැටෙන් එහා

මවගේ ක්ෂීරයෙන් පෝෂණය වන දරුවා ගුණෙන් ද නැණෙන් ද බලයෙන් ද වැඩෙයි. මව විසින් දරුවාට පොවන්නේ කිරි පමණක් නොවේ. නරකින් හොඳ වෙන් කරගැනීමේ හැකියාව ද ලබා දෙන බව ජනශ්‍රැතියේ සඳහන් වේ. ඇය දරුවා නළවන්නේ තාලයට ගයන දරු නැළවිලි ගීතයකිනි. මේ නැළවිලි ගීතය තුළින් මව පියා ඇතුළු පවුලේ අය ගැනත් සමාජය ගැනත් අවබෝධයක් දරුවාගේ සියුම් මනසට ලබා දෙයි.

"ඔන්න බබෝ ඇතින්නියා
ගල් අරඹේ සිටින්නියා
ගලින් ගලට පනින්නියා
බබුට බයේ දුවන්නියා "

යනුවෙන් දරුවා වීරත්වයට නංවන්නට මව උත්සාහයක් ගනියි. ගීතයට තේමා වන්නේ ද මෙවැන්නකි. තොටිලි වැටෙන් පනින පුතාට තමන් වටා ඉදි වන ඕනෑම වැටක් පනින්නට හැකියාව ඇතැයි පියා පවසයි. මවගේ කිරෙන් ලැබෙන ශක්තියත් පියාගේ රැකවරණය හා මග පෙන්වීම මත දරුවාට තම ජීවිතයේ හමුවන සියලුම බාධක ජයගන්නට හැකි වනු ඇතැයි ඔහු සිතයි. තමන්ගේ ආරක්ෂාව ආදරය යටතේ දිවි ගෙවන දරුවා යහපත් දක්ෂ දරුවකු වනු දැකීම සියලුම මාපියන්ගේ පැතුමයි. එමෙන්ම තමන්ගේ අවවාද අනුශාසනා මග පෙන්වීම් යටතේ දිවි ගෙවන දරුවා කිසිදු දිනක නොමග නොයනු ඇතැයි ද බහුතරයක් දෙමාපියෝ සිතති. එහෙත් මේ දරුවා ඉපදී ඇත්තේ සංකීර්ණ වූ විවිධ දුක් කම් කටොළු මධ්‍යයේ දිවි ගෙවන නීතියට පටහැනිව ක්‍රියා කරන මිනිසුන් බහුලව වෙසෙන සමාජයක ය. බර්ටොල් බ්‍රෙෂ්ට් මෙලෙස පවසයි.

දරුවකු නො ඉපදිය යුතු යුගයෙක මම ඔබ බිහි කළෙමි, මක් නිසා ද ඔබ පිළිසිඳ ගැනීම නිර්භීත ක්‍රියාවක් හා ඔබට ජීවත් වීමට සැලසීම උග්‍ර සටනක් වන නිසාය. යුධ හමුදාවක් පවා යුද්ධයකින් පරාජය කළ හැකිය. එහෙත් බිළිඳුට රෙදි කඩක් සොයා ගැනීම යුද්ධයකින් ජය ගැන්මටත් වඩා අමාරුය.

''ඇත්තෙන් ම පාන් සහ කිරි පවා
කුටිය උණුසුම් කිරීම පවා මහා සටනෙකි
ඉතින් ඔබ මිනිසෙකු බවට පත් කිරීමට
මේ ජය ගැනීම් මැද මා දිවා රෑය යුද්ධ කළ යුතුය "

බ්‍රෙෂ්ට් පවසන පරිදි ම තැනූ දරුවන් උස්මහත් කිරීම ද අද යුද්ධයකට වඩා අසීරු දෙයකි. දරුවකු ඉපදීමෙන් අනතුරුව ඔවුන් නූතන ව්‍යාධීන් ගෙන් ආරක්ෂා කළ යුතුය. දරුවන් අපයෝජනය කිරීමට මග බලන අමනුෂ්‍යයන්ගෙන් දරුවන් ආරක්ෂා කළ යුතුය. වැඩිහිටි දරුවන් මත් උවදුරු වලින් ද මනස වියවුල් කරන්නන් නොමනා ප්‍රේම සම්බන්ධතා මුවාවෙන් ඔවුන් බිලි ගන්නට මාන බලන්නවුන්ගෙන් ආරක්ෂා කළ යුතුය. එපමණක් ද නොව ස්වභාවික උවදුරු වලින් ද දරුවන් බේරා ගත යුතුව ඇත. රිය අනතුරු නිසා යුද්ධය හා සමානව මිනිසුන් මියයෑම සිදු වන බැවින් උදෑසන නිවසෙන් පිටවන දරුවා යළිත් නිවසට පැමිණේදැයි අනියත බියකින් සිටින්නට දෙමාපියන්ට සිදුව තිබේ. ඇතැම් මව් පියන්ගේ අනිසි ක්‍රියා හෝ විවිධ ගැටළු නිසා සිය දිවි නසා ගන්නට පෙළඹෙන දරුවෝ ද දුලභ නොවෙති.

කුස ගින්න නිවා ගැනීමට නොහැකිව හෝ පවුල් අර්බුධ නිසාත් ගඟට පැන හෝ ගෙල වැලලාගෙන මිය ගිය පවුල් පිළිබඳ ව ද අපට අසන්නට ලැබේ. නැතිනම් පියා විසින් අපහරණයට ලක් වූ දරුවෝ පිළිබඳව ද අසන්නට ලැබේ. වැටත් නියරත් ගොයම් කා නම් අන් අය පිළිබඳ කුමක් පවසන්න ද?
තොටිල්ලේ ලී වැටෙන් එහා ඇති වැටවල ප්‍රමාණය මෙතෙකැයි අපට කිව නොහැකිය. දුෂ්කර බාධක සහිත මාර්ග විස බුමුතුරුණු ඇතිරූ මාර්ග කිසිදු තැනක දක්නට නැත. එලෙසින්ම මෙලොවට ජනිත වන දරුවා සුමගට යොමු කරන මාර්ග වලට වඩා නොමගට යොමු කරන මාර්ග බහුලව දක්නට ලැබේ. වර්තමානයේ සෑම දිනම ප්‍රවෘත්ති තුළින් ප්‍රචාරය වන්නේ පාසල් සිසුන් ඉලක්ක කරගත් මත්ද්‍රව්‍ය වැටලීම් පිළිබඳවය.

ජනමාධ්‍ය පවා ළමුන්ට විෂ එන්නත්කරන මාධ්‍ය බවට පත්ව ඇත. ළමයින් ඉලක්ක කර ගත් කාටූන් මගින් පවා ළමුන්ට ලබා දෙන්නේ ප්‍රචණ්ඩත්වය, කලහකාරී බව , මත් ද්‍රව්‍ය භාවිතයට පෙළඹවීම් ය. ඇතැම් පරිගණක ක්‍රීඩා ළමුන් සිය දිවි නසා ගැනීම් වලට පවා යොමු කර ඇත. අන්තර් ජාලය ඔස්සේ අසැබි වෙබ් අඩවි වලට පිවිස සිය මනස වියවුල් කරගන්නා දරුවෝ ද දුලභ නොවෙති. මේ අයුරින් අතීත සමාජයට වඩා දියුණු යැයි සම්මත අද සමාජයේ ළමයින් බේරා ගත යුතු නොයෙක් උගුල් බහුලය. දෙමාපියන් අවදියෙන් නොසිටින්නේ නම් දරුවා ගේ ජීවිතය විනාශ වීම වළක්වා ගත නොහැකිව ඇත.

දරුවන් මළපුඩු වල බැඳෙනු වලක්වා ගැනීමට නම් දෙමාපියන් අවධියෙන් සිටිය යුතුය. එමෙන්ම දරුවන්ට එම උගුල් වලින් බේරීමට අවැසි දැනුවත් භාවයත්, බුද්ධිමත් භාවයත් , ප්‍රශ්න දරා ගැනීමට හැකි ප්‍රතිශක්තියත් ලබා දිය යුතුමය. එවිට තොටිලි වැටෙන් පනින දූ පුතුන්ට නොබියව අනෙකුත් වැටවලින් ද පනින්නට හැකියාව ලැබෙනු ඇත.

මහාචාර්ය සුනිල් ආරියරත්නයන්ගේ අරුත් බර පද වැල අබේවර්ධන බාලසූරිය ගේ හඬින් ගැයෙන විට එය සියලුම රට වාසී දරුවනට ආශිර්වාදයක් සේ හැඟෙයි.

චාමිකා ජනානි

# සිරිලක වැඩ වෙසෙන සර්වඥ ධාතූන් වහන්සේලා




ශාරීරික, උද්දේසික, හා පාරිභෝගික වශයෙන් සර්වඥ ධාතූන් වහන්සේලා කොටස් තුනකි. සර්වඥ ශ්‍රී දේහයට අයත් ධාතූන් වහන්සේලා ශාරීරික ධාතු ලෙසින් ගැනෙති. බුදුපිළිමය උද්දේසික ගණයටද, පාත්‍රය, චීවරය ආදිය පාරිභෝක ගණයෙහි ලා ෂලකනු ලැබේ. මෙහිදී අපේ විශේෂ අවධානය යොමුවන්නේ ශාරීරික ධාතූන් වහන්සේලා පිළිබඳ බව කිව යුතුය.

බුදුන් වහන්සේගේ ශ්‍රී දේහය ආදාහනය කිරීමෙන් පසු ධාතූන් වහන්සේලා හත් නමක් උණු නොවී තිබුණ බව ප්‍රකටය. ලලාට ධාතුව, අකුධාතු දෙක හා ෂතර දළදාත් ඒ හතයි. කඩ සහල් තරම්වූ මුතුවන් ධාතු ද, මුං පියළි තරම් වූ රන්වන් ධාතු ද අබ ඇට තරම් වූ කොඳ කැකුළුවන් ධාතු ද වශයෙන් ඥාණ සැටක් පමණ ධාතු හු උණු වී වැටුණාහ.

### දකුණු අකුධාතුව

සුමන සාමනේරයන් ශක්‍රයාගෙන් ඉල්ලාගෙන ආව දකුණු අකුධාතුව ථූපාරාමයේ නිදන් කරන ලදි. මෙම චෛත්‍යයේ පෙර කකුසඳ, කෝණාගමන හා කාශ්‍යප යන තුන් බුදුවරයන්ගේ ධබරා, ජලසාමිකා සහ පටිධාතු ද ඇතැයි සඳහන්ය.

### කේශධාතු

තපස්සු භල්ලුක වෙළඳ දෙබෑයන්ට ලැබුණු ජීවකේශ ධාතු තිරියායේ ගිරිහඬු සෑයේ තැන්පත් කර ඇත. බුදුරදුන් යක්ෂ දමනය සඳහා ප්‍රථම වරට මහියංගණයට වැඩම කළ අවස්ථාවේදි සුමන දෙවියන්ට ලැබුණු ජීවකේශධාතු මහියංගණ චෛත්‍යයේ තැන්පත් කොට ඇත. තුන්වන මිහිදු රජ මිරිසවැටියේ රන් කරඬුවක කෙස්ද නිදන් කළ බවද සඳහන් වේ. ජේතවනාරාමයේ ද චෛත්‍යයේද කේෂධාතු ඇතිබව විශ්වාස කරති.

### ග්‍රීවා ධාතුව

මෙය නොවිසුරුණු සප්ත ධාතූන්ට අයත් නැත. ශ්‍රී දේහය ආදාහනය කළ පසු ග්‍රීවය තිබූ පෙදෙසින් ගත් ධාතූන් වහන්සේ නමකි. සරභූ රහතන් වහන්සේ විසින් ගන්නා ලද මෙය මහියංගණ චෛත්‍යයේ නිදන් කළ බව දඨාවංශය සඳහන් කරයි.

### පටි ධාතුව

දෙවියන් පටිධාතුව දික්කර උඩට අදිද්දී රියන් අසූවක් උඩ පැන මහසෙන් රජ කඩුවෙන් බාගයක් කපාගෙන ජේතවනාාමයේ නිදදන් කළ බව පූජාවලිය සහ රාජාවලිය කියයි.

### ලලාට ධාතුව

ලලාට ධාතුව සේරුවාවිල පිහිටීම පිළිබඳව කියන ධාතු වංශය, දෝණ නම් බමුණා ධාතු බෙදන විට ලලාට ධාතුව මල්ල රජුට අත්විය. මහසුප් තෙරුන් එය ඉල්ලාගත් පසු සඟ පරපුරින් පැවත අවුත් මහාදේව රහත් තෙරණුවන් භාරයේ පැවතුණි. පරපුරින් පැවත අවුත් කාවන්තිස්ස රජු අතට පත්වූ පසු සෝමාදේවියගේ වල්ලභ සෝමා නුවර ගිරි අභය රජුද, සේරුනුවර සිව රජුද, ලෝබ නුවර මහානාග රජුද සහාය කොටගෙන ජයසේන නම් උළු වඩුවෙකු ලවා සේරු නුවර මංගල මහා විහාරය බඳවා ලලාට ධාතූන් වහන්සේ එහි වඩා හිඳුවී යයි ප්‍රකාශ කරයි.

### ඌර්ණ රෝම ධාතුව

මිහින්තලේ මහා සෑයෙහි ඌර්ණ රෝමධාතූන් වහන්සේ ඇතැයි රාජරත්නාකරය කියයි. දෙවන අග්බෝ රජතුමා නාගදීපයේ රාජයතන විහාරයට උණ්ණලොම සරයක් පිදූබව හෙළ උරුමය ගත්හී සඳහන්ය.

### දකුණු දළදාව

බුදුරදුන්ගේ උඩු යටි දත් ඇදි දෙකේ දළදා හතරක් උණුවී නොවැටුණ බව පැවසිණ. ඉන් එක් දකුණු දළදාවක් සෝමාවතී චෛත්‍යයේ පිහිටා ඇත.

### වම් දළදාව

මැද මහනුවර දළදාමාළි ගාවෙහි වැඩ වෙසෙන මෙම දළදා වහන්සේ සිරිමෙවන් රජු කළ දන්ත හේමමාලා දම්පතීන් විසින් ගෙනෙන ලදහ.

### පාත්‍රයක් පිරූ සර්වඥ ධාතු

සුමන සාමනේරයන් දඹදිවින් පාත්‍ර ධාතුව පුරවා සර්වඥ ධාතූන් වහන්සේලා සහ ශක්‍රයා ගෙන් දකුනු අකු ධාතුව ද ගෙනා බව කියවේ. එම සධාතුක පාත්‍ර ධාතුව සෑගිරියේ නිදන්කොට ඇත.

### ද්‍රෝණයක් සර්වඥ ධාතු

රුවන්මැලි සෑයට ධාතූන් වහන්සේලා ගෙනවිත් දීමට පොරොන්දු වූ සෝණුත්තර හෙරණ කෙමේ වාසුලදත්ත නාග රාජයාගෙන් ඔහුට නොදනීම ද්‍රෝණයක් පමණ සර්වඥ ධාතු රැගෙනිත් රුවන්මැලි සෑයේ නිදන් කළේය.

### මිරිසවැටියේ ධාතු

දුටුගැමුණු රජතුමන් ජලස්නානය සඳහා කුන්තා යුධය සහිත වස්ත්‍රාභරණ යම්කිසි ස්ථානයක තබා නහා අවසන්වී වස්ථාභරණාදිය ගත් නමුත් කුන්තායුධය එතැනින් සෙලවිය නොහැකි විය. ඉන්පසු තමා සංඝයා වහන්සේට මිරිසක් නොදී අනුභව කර තිබීම සඳහා දඩුවමටත් සමඟ එම සධාතුක කුන්තායුධය නිදන්කොට මිරිසවැටි චෛත්‍යය ඉදි කළේය.

### අභයගිරි ධාතු

වළගම්බා රජ නවරත්නයෙන් කළ ධාතු ගර්භයක ස්වර්ණ වෘෂභයෙකුගේ කුස පුරවා සර්වඥධාතු බහා අභයගිරි චෛත්‍යයේනිදන් කොට ඇත.

චෛත්‍ය ගොඩනැගෙන් නේද ධාතූන් වහන්සේලා තැන්පත් කරමිනි. කණ්ඨක යනු උගුරට නමකි. එම පෙදෙසට අයත් ධාතු තැන්පත් කොට කණ්ඨක චෛත්‍යය ඉදිකර ඇතැයි සිතිය හැක. නබා යනු නිය වලට නමකි. නබ ධාතුව තැන්පත් කොට නබා වෙහෙර ඉදිවන්නට ඇතැයි සිතිය හැක. පොලොන්නරුවේ පබළු වෙහෙරේ තිබී කොටු 25කින් යුත් ශෛලමය ධාතු කරඬුවක් හමුවී ඇත. දෙවන පෑතිස් රජ ඉසුරුමුණි විහාරයේ පිළිමයක ධාතූන් තැනපත් කළ බව සඳහන් ව ඇත.

පාරිභෝගික ද්‍රව්‍ය නිදන් කළ චෛත්‍ය කැලණි සෑයේ බුදුන් වහන්සේ කැළණියේදී දම්දෙසූ ධර්මාසනය වූ මිණි පළඟ තැන්පත් කර ඇත. නාගදීපයේ චූලෝදර, මහෝදර සහෝදරයන් බුදුරදුන්ට පිරිනැමූ මිණිපළඟ නිදන්කොට ඇත.

**ත්‍යාගය උතුම් ආර්යය ධනයකි. දානය ශ්‍රේෂ්ඨ ප්‍රතිපදාවක් ලෙස උගන්වන බුදු දහම ලෝකෝත්තරික අරමුණු තෙක් වර්ධනය නොවූ ලෞකික වූ අරමුණු සාධනයට ද ත්‍යාගය උතුම් පිළිවෙතකි. තමන් සතු ප්‍රිය වස්තූන් සුහද සිතින් හා සැදැහැ සිතින් අන් අයට දීමට තරම් හිත හදාගැනීම ජයග්‍රාහී තත්ත්වයකි. තම අයිතීන් හා මනාපයන් අන් සතුවීම වලක්වා ගැනීමට සොබා දහම දී ඇති මනෝමය මූලධර්ම තුනක් සොයාගෙන තිබේ. එනම් ලෝභ - දෝස - මෝහ යනුවෙනි.**

එම්.බී. රානී ද සිල්වා

# උතුම් ධනවතෙකුවීමේ ප්‍රතිපදාව



ත්‍යාගය උතුම් ආර්යය ධනයකි. දානය ශ්‍රේෂ්ඨ ප්‍රතිපදාවක් ලෙස උගන්වන බුදු දහම ලෝකෝත්තරික අරමුණු තෙක් වර්ධනය නොවූ ලෞකික වූ අරමුණු සාධනයට ද ත්‍යාගය උතුම් පිළිවෙතකි. තමන් සතු ප්‍රිය වස්තූන් සුහද සිතින් හා සැදැහැ සිතින් අන් අයට දීමට තරම් හිත හදාගැනීම ජයග්‍රාහී තත්ත්වයකි. තම අයිතීන් හා මනාපයන් අන් සතුවීම වලක්වා ගැනීමට සොබා දහම දී ඇති මනෝමය මූලධර්ම තුනක් සොයාගෙන තිබේ. එනම් ලෝභ - දෝස - මෝහ යනුවෙනි.

ධනවත් වීමට උත්සාහ කිරීම බුදු දහමට අනුව යහපත් ක්‍රියාවකි. මිච්ඡා ආජීව යන්නෙන් දක්වා ඇති පරිදි ජීවන ප්‍රතිපදාවන් අනුගමනය නොකොට යන මාර්ගය ඔස්සේ උත්සාහ කොට දිලිඳු බවින් අත මිදීමට බෞද්ධ ජීවන ප්‍රතිපදාවේ අවසර දී ඇත.

වත්මන් සමාජය ධනවත් විම යුද්ධයක් බවට පත් කරගෙන තිබේ. අනෙකා අනුකරණය නොකොට අනුන් අභිබවා නැගී සිටීමේ තරඟකාරී රැල්ලක් අද පවතී. සුඛෝපබෝගී භාණ්ඩ රැස් කිරීමත් අධික වියදම් කොට මංගල අවමංගල වැනි උත්සව පැවැත්වීමත්, විවිධ මාතෘකා යටතේ ප්‍රියසම්භාෂණ පැවැත්වීමත් ධනවතුන්ගේ අනන්‍යතාවය බවට අද පත් වි ඇත. මේ සියළු ධනවාදයන් කේන්ද්‍ර කොට ඇත්තේ ශරීරය අරමුණු කොට ගත් පංච කාම අභිමතාර්ථයන් වෙතය. එහෙත් මනසින් ධනවත් වීම සැබෑ උතුම් පොහොසතකු වීමේ න්‍යාය ධර්ම පද්ධතියක් සම්බුදු දහමේ උගන්වා ඇත. බුදු දහමේ දේශිත ආර්යය ධන හතකි.

**සද්ධාදනං සීල ධනං - හිරිඔත්තප්පියං ධනං**
**සුත ධනං ච චාගෝච - පඤ්ඤාමේ සත්තමං ධනං**

**ශ්‍රද්ධාව - තෙරුවන් කෙරෙහි පැහැදීම**
**සීලය - තුන්දොර සංවරය**
**හිරි - ලැජ්ජාව**
**ඔත්තප්ප - බිය**
**සුත - දැන උගත්කම**
**ත්‍යාග - පරිත්‍යාගශීලි බව**
**පඤ්ඤා - නුවණ**

පුද්ගලයකුගේ උතුම්ම සම්පත පිරිසිදු සිතයි. සිත පිරිසිදු කරගත හැකි ප්‍රබලම සම්පත ශ්‍රද්ධාවයි. සක්විති රජවරුන්ට අයත්ව තිබූ උතුම් මාණික්‍යයකි 'උදකප්ප සාදිනි මැණික' මෙය අපිරිසිදු ජලයකට දැමූ විට එම ජලය පිරිසිදු වන බව කියැවේ. බොහෝ ක්ලේෂ ධර්ම වලින් අපවිත්‍ර වි ඇති මේ මනස ශ්‍රද්ධා මැණික ලැබුණ විට පිරිසිදු වීමේ ශක්තියක් තිබෙනවා. ශ්‍රද්ධාව යනු තෙරුවන් කෙරෙහි ඇති පැහැදිම බවත් තෙරුවන් යනු බුද්ධ ධම්ම සංඝ යන උතුම් රත්නයන් තුන බවත් බණ පොතේ සඳහන්ය. බුද්ධ යනුවෙන් අදහස් කරන්නේ පුද්ගල තත්ත්වයක් වන පුද්ගලයකු විසින්ම ලබාගන්නා තත්ත්වයක් බවයි මගේ වැටහීම.

'යෝදම්මං පස්සති සෝමං පස්සති' යනුවෙන් බුදු හිමියන් දේශනා කළ වදාලේ ධර්මය අවබෝධ කර ගැනීම මගින් බුද්ධ තත්ත්වය දැකිය හැකි බවයි. එසේ නම් පුද්ගල සන්තානයේ ඇති වන ප්‍රබුද්ධ තත්වයන් මින් අර්ථවත් වන බවට කිසිදු සැකයක් නැත. ධර්මය පිළිබඳ විවිධ නිර්වචන පවතී. ධර්මය සරණ යාමට හෝ ධර්මය වටහා ගැනිමට ඒ සියලුම නිර්වචන සොයා වෙහෙසිය යුතු නොවේ. ප්‍රථම ධර්ම දේශනාවෙන්ම බුදුන් වහන්සේ ධර්මය අර්ථවත් කර දි තිබේ. එනම් ආර්යය සත්‍ය හතරයි.

**දුක්ඛ සත්‍යය - ගැටළුව**
**සමුදය සත්‍යය - ගැටළුවට හේතු**
**නිරෝධ සත්‍යය - විසඳීම**
**මාර්ග සත්‍යය - විසඳිය යුතු පිළිවෙල**

මෙම න්‍යාය ධර්මයට අනුව ධර්මය යනු සත්‍ය බවත් දහම් සරණ යනු සත්‍ය පිහිට කොට ගැනීම බවත් නිවැරදි නිගමනය ලෙස සැලකේ.

සංඝ යනු ආර්යය ශ්‍රාවකයන් වහන්සේය. කවරෙක් හෝ කියන්නේ නම් එය නිවැරදිය. නමුත් සඝ සරණ යනු භික්ෂූණ් වහන්සේලාගේ පිහිට නොව භික්ෂූණ් වහන්සේලා විසින් තොරා ගනු ලැබූ ඒ විමුක්ති මාර්ගය හඳුනාගෙන එහි ගමන් කිරිමයි. සුපටිපන්නාදි ගුණ සමුදායකින් හෙබි පිළිවෙත් මගකි. එය වටහා ගැනිම සඝ සරණ යෑමයි. මේ අනුව බුද්ධිමත් බව සත්‍යගරුක බව හා ප්‍රතිපත්ති ගරුක බව නියම තිසරණයයි.

තේරුම් ගැනීමට හැකිය. මේ තත්ත්වය ශ්‍රද්ධාව ලෙස පිලි ගන්නේ නම් සිත නිර්මල වීමටත් පිරිසිදු වීමටත් එය ප්‍රමාණවත්ය. කෙසේ හෝ මේ මහා සම්පත අපේ සදාතනික උරුමයක් බව තේරුම් ගැනීම ඉතා වැදගත්ය.

සීලය ධනයක් ලෙස උගන්වා ඇත්තේය. ශිෂ්ඨ සම්පන්න මිනිසකු සතු පෞරුෂය අගයනු පිණිසය. සිල්වතකු සතු සිල් සුවඳ උඩු සුළඟට හමා යන බව ප්‍රකාශ කරයි. බුදු සමය තුළ අර්ථවත් වන සිල්වත් මිනිසා නිදහස් නිවහල් පුද්ගලයකු ලෙස සැලකේ. ලෝකය ඉතා සුන්දර වනුයේ ද සැපවත් වන්නේ ද සියළු ලෝකාශ්වාදයන් වැරදි ලෙස පරිහරණය කරන පුද්ගලයාට නොව නිවැරදිව පසිදුරන් හික්මවන තැනැත්තාටය. හිතෙන හිතෙන දේ කියන කරන මිනිසා හිතට වහල් වූ දුබලයකු ලෙස සඳහන් කළ හැකිය.

පසිදුරන් කුමක් ඉල්ලා සිටියත් නිවැරදි දේ පමණක් කරන පුද්ගලයා පමණයි එඩිතර වන්නේ. ඉදුරන් සංවර කර ගැනීමේ හැකියාව උතුම් සම්පතකි. මිනිසාට පමණක් හිමි වන උතුම් සම්පතකි.

හිරි ඔතප් යනු ලැජ්ජා ඇති බවයි. මේවා දේව ධර්ම ලෙස ද සැලකේ. එයින් හැඟී යන්නේ ලැජ්ජා බය ඇති මිනිසා දෙවියකු හා සමාන බවයි. හිරි ඔතප් පුදගලයකු සතු වටිනා ධනයක් බව රටේ දැනට පවතින රාජ්‍ය නීතිය පවා පිලිගෙන තිබේ. එබැවින් යමෙකු විසින් යම් කෙනෙකුගේ හිරි ඔතප් බිදීම දඬුවම් ලැබිය හැකි වරදකි. මිනිසා පවට හා වරදට බිය විය යුතුය. එසේම ලැජ්ජාවිය යුතුය. දුබල සිත් ඇති වරදට ඇලුම් කරන ඇතැමුන් ලැජ්ජා බය දුර්වල ගති ගුණයක් බව හඟවන්නට උත්නාහ දරති. එය මුලාවකි. ආර්ය උතුමන් හැමවිටම මෙම හැඟීම් දෙක ශ්‍රේෂ්ඨ ප්‍රතිපදාවක් බවට පිළිගනිති.

සුත යනු ඇසීමයි. ඇසීමට සවන් ලද්දෝ හැමවිටම අසන්නේ නම් එය සුවිශේෂී ධනයක් වන්නේ කෙසේද? බුදුන් ද්‍රව්‍ය ඉගෙනීම සඳහා භාවිතා කළ එකම මාධ්‍යය සවන් දීමයි. මෙම ශ්‍රවණ මාධ්‍ය අධ්‍යාපන ක්‍රමය නිසා උගතුන් හැඳින්වූ වචන වන්නේ බහුශ්‍රැත යන්නයි. බොහෝ ඇසූ පිරූ තැන් අති බව මෙයින් අදහස් වෙයි. ඒ අනුව 'උගත්කම' ආර්ය ධනයක් ලෙස බුදු දහමේ සම්මත වෙයි. ලොව උපන් සෑම මිනිසෙක්ම යම්කිසි ශිල්ප කලාවකින් පරිපූර්ණ වූවෙකු විය හැකිය.

ත්‍යාගය උතුම් ආර්ය ධනයකි. දානය ශ්‍රේෂ්ඨ ප්‍රතිපදාවක් ලෙස උගන්වන බුදු දහම ලෝකෝත්තරික අරමුණු තෙක් වර්ධනය නොවූ ලෞකික වූ අරමුණු සාධනයට ද ත්‍යාගය උතුම් පිළිවෙතකි. තමන් සතු ප්‍රිය වස්තූන් සුහද සිතින් හා සැදැහැ සිතින් අන් අයට දීමට තරම් හිත හදාගැනීම ජයග්‍රාහී තත්ත්වයකි. තම අයිතීන් හා මනාපයන් අන් සතුවීම වලක්වා ගැනීමට සොබා දහම දී ඇති මනෝමය මූලධර්ම තුනක් සොයාගෙන තිබේ. මේවා දහමෙහි හඳුන්වා ඇත්තේ අකුසල මූල ලෙසටයි. එනම් ලෝභ - දෝස - මෝහ යනුවෙනි. ලෝභය නිසා ඇති වන බැඳීමක් ද්වේශය නිසා ඇති වන දැවීමත් - මෝහය නිසා සිදුවන වැඩීමත් පුද්ගල චරිතය සම්පූර්ණ වශයෙන්ම අඳුරට හෙලන බව පැහැදිලිය. අකුසල් මුල් බිඳ දමමින් තමා සතු යමක් අන්සතු කළ හැකි යමෙක් වෙත්ද ඔහු උතුම් ධනයකට හිමිකම් කියයි.

ප්‍රඥාව ද ආර්ය උතුමන්ගේ ධනයකි. බුදු දහම ප්‍රඥාව ආලෝකයක් ලෙසටයි සලකන්නේ. මෝහය හෙවත් මෝඩකම අඳුරකි. ලෝකය දකින්නට ඇස් දෙක පමණක් තිබීම ප්‍රමාණවත් නොවේ. දෙනෙතට හමුවන දේ පමණක් ඇස - කන - නාසය - දිව - ශරීරය යන පසිඳුරන්ට ගොදුරු වන සියළු අරමුණුවල සැබෑ තත්ත්වය විනිවිද දකින්නේ ප්‍රඥාවයි. එබැවින් එය ආලෝකයකි. උතුම් ආර්ය ධනයකි. මහෞෂධ පණ්ඩිතයන් සිය ප්‍රඥාව නුවණ මෙහෙයවා තියුණු පැන විසඳූ බව උම්මග්ග ජාතකයේ දැක්වේ. මහෞෂධ කුමරු උපදින විට සඳුන් ලීයක් මිට මොලවාගෙන පැමිණ බවද කියයි.

මෙය යතාර්ථවාදීව කියන්නේ නම් ඒ සඳුන් ලී කැබැල්ලෙන් සංකේතවත් කොට ඇත්තේ එතුමෝ උපතින් රැගෙන ආ ප්‍රඥාව විය හැකිය. මෙම ආර්ය ධන හතම සෑම දරුවෙක්ම උපතින් රැගෙන එයි. එය ආරක්ෂා කර ගැනීමට ඉඩ නොදෙන්නේ නම් එය බර පතල වරදකි.

ශාස්ත්‍රපති වික්‍රමසිංහ අතපත්තු

# නූතන සිංහල ගීතයෙහි උපමා භාවිතය

සංගීතය හා බැඳුණු වචනයෙහි ඖචිත්‍ය (උචිත බව) තුළින් කෙරෙන ප්‍රබල භාවාත්මක ප්‍රකාශනය ගීතය නම් වෙයි. වර්තමාන ජන සමාජය වඩාත්ම අභිරුචියෙන් රස විඳින සහ වඩාත් ලන්ව ඇලුම් කරන කලාංගය ලෙස ද ගීතය හඳුනාගත හැකිය.

"ගීතය නැමැති මේ කලාංග හා සම්ප්‍රදාය අතර ඇත්තේ කෙබඳු සම්බන්ධතාවයක්ද? අන් සාහිත්‍යාංගයන්හි දී මෙන්ම ගීතයේ දී ද ජන විඥ්ඥාණය හා වාග් සම්ප්‍රදායන් ඇසුරු කිරිම සන්නිවේදන ප්‍රබලතාව හා ශක්තිය වර්ධනය කර ගැනීමට උපාකරී වේ."

(සංසාරේ අපි, පල්ලේගම හේමරතන හිමි ඇතුළු පිරිස 2006)

"බොහෝ විදේශීය කවීන් හා ගීත රචකයින් සිය නිර්මාණ පෝෂණය කර ගැනීම සඳහා මෙම උපක්‍රමය එනම් පාරම්පරික විඥ්ඥාණය හා ඥාන සම්භාරය ඇසුරු කිරීමේ මේ උපා උපයෝගී කොට ගෙන ඇත." (සංසාරේ අපි. එම)

සාම්ප්‍රදායික ආභාෂයන් ග්‍රහණය කර ගැනීමේ දී ගීතය ආවේණික ගති ලකුණු අහිමි කර නොගෙන ගේය කාව්‍යයක් ලෙස ඉදිරිය බලා ඇදෙන අයුරු දැකිය හැකිය.

"කවිය වෙනස් ගමන් මාර්ගයකට අවතීර්ණ වෙමින් ගේය පදයක් බිහි වන්නේ එකී අවස්ථාවේදිය. ගේය පදය හුදු කවියක් නොවිය යුතුය. එමෙන්ම එය හඬනගා ගායනා කළ හැකි හුදු වාංමාලාවක් ද නොවිය යුතුය." (අරුමැසිය ගී සර 2002)

"ගීතය සඳහා අවශ්‍ය වනුයේ ගේය පදයක්ම බැව් වටහා ගැනීම යෙහෙකි. කවීත්වයෙන් පෝෂිත අර්ථාලංකාරයෙන් මෙන්ම ශබ්දාලංකාරයෙන් ද විශිෂ්ට වූ ගේය පද රචනා ඉතාම විරලය." (කවිය ගීතය හා සමාජය 2005)

"ගීතය අදාල පරස්ථිතිය තුළ පද්‍යයක් ලෙස ද කවියක් ලෙස ද අර්ථ නිරූපණය කොට දැක්වීමේ හැකියාව ඇත. එහෙත් ගීතය එයටම විශේෂ වූ අනන්‍යතාවයක් ඇති කලාවක් බවට දැන් පත්ව තිබේ. එහි සාහිත්‍යය ලෙසම හඳුන්වනු විනා අන්‍ය ආකාරයකින් විවරණය කරනු නොයෙදේ. නොසෑහේ.

(සොඳුරුම හදවත ගී පද මාලා)

ආසන්න කාලය තුළ ගීතය ලෙස "සුසුම් පද" බහුල ගේය පද රචනා ආර්ථිකමය අවශ්‍යතා මත භාවිතා කරන බවට නැගෙන චෝදනාවකි. නමුත් නූතන සිංහල ගීතාවලිය තුළ රස ජනනය අරමුණු කරගත් ශෝභාමත් ගේය කාව්‍ය රචනා විරල නොවේ.

"ගීතයක් වැටහෙන්න ඕන බව ඇත්ත. වැටහුණු පලියට ඒක බොහොම සිල්ලර තනිකර ස්වභාවෝක්තියෙන් නැත්නම් වාර්තා කතනයෙන් කරන නිර්මාණයක් වෙන්න ඕන නෑ. එහෙම වුනොත් එහි අගයක් නැති වෙයි. මොකද අපි ප්‍රිය කරන අහපු මතකයේ රැඳි තිබෙන එකක්වත් ඒ වගේ ගීත නෙවෙයි. සේකර ලියපුවා, මානවසිංහ ලියපුවා මෙතෙක් අපි අනුස්මරණය කරන්නේ මතකයේ තියෙන්නේ නිකම්ම නිකම් වාගාලාප නිසා නොවෙයි. .. නිකම්ම නිකම් ස්වභාවෝක්ති නිසා නොවෙයි. කාව්‍යමය ගුණයක් තිබෙන නිසා. ඒ නිසා කාව්‍යමය ගුණය කියන දෙය ගීතයට අත්‍යවශ්‍යයි." (දිනමිණ මංසල අතිරේකය 2007.11.09)

ගීතයට කාව්‍යමය ගුණය පෙවීම උදෙසා මෙන්ම ශබ්දාර්ථ ශෝභනය උදෙසා ද නූතන පිරිපුන් ගේය කාව්‍ය රචකයින් ශබ්දාලංකාර සහ අර්ථාලංකාර උචිත ලෙස ගේය කාව්‍ය රචනාව තුළ යෝජනය කරන අයුරු දැකිය හැකිය.

"නූතන සිංහල ගේය කාව්‍යාවලිය අධ්‍යයනය කිරීමේදී වඩාත් පැහැදිලිව හා චමත්කාර ජනක ලෙස යොදාගත් අර්ථාලංකාර බහුල ලෙසින් දැකිය හැක. සාහිත්‍යාත්මක පක්ෂයෙහිලා ගැනෙන ගේය පද මාලාවෙහි යොදාගෙන ඇති වචනය, උපමාරූපකය ආදී කාව්‍යෝක්ති පිළිබඳ වර්තමානයේදී බහුලව කතාබහට ලක් වී තිබේ."

(ලාංකික සංගීතයේ රෝහණ ලකුණ 2002)

එලෙසින් භාවිතා ලංකාර අතුරිනුත් උපමා ලංකාරයෙහි බහුල භාවිතයක් දැකිය හැකිය. ඒ නිසාම ඒ පිළිබඳ අධ්‍යයනයක් කිරීම නිසි යැයි

"නූතන සිංහල ගේය කාව්‍යාවලිය අධ්‍යයනය කිරීමේදී වඩාත් පැහැදිලිව හා චමත්කාර ජනක ලෙස යොදාගත් අර්ථාලංකාර බහුල ලෙසින් දැකිය හැක. සාහිත්‍යාත්මක පක්ෂයෙහිලා ගැනෙන ගේය පද මාලාවෙහි යොදාගෙන ඇති වචනය, උපමාරූපකය ආදී කාව්‍යෝක්ති පිළිබඳ වර්තමානයේදී බහුලව කතාබහට ලක් වී තිබේ."

හැඟිමි.

**"කැල්මෙනා සඳ සේ සදිසි ඇයගේ වත මනා**
**ගමනිනා මසිත බැඳුනි තිසර රූ මෙනා**
**ළඟ එනා සීත දුරුතු මහට පෙර දිනා**
**දෙනු මැනා බහට බහක් මසිත පොඹ යනා**

**නිදියනා රැයට නැගෙන මියුරු ගී මනා**
**දෙනුවනා පැතුම් ලොවට නිබඳ පුබුදනා**
**මුතු මෙනා සුමුදු සිනා මුග නග මිනා**
**එනතුරා එළඳ උදෙන් හිඳිමි මග බලා"**

"යම් කිසි වස්තු දෙකක සමාන බව පෙනේ නම් එය උපමා නම් වේ. මෙම සමානත්වය ගුණයක් නිසා හෝ වෙනයම් ලක්ෂණයක් නිසා විය හැක. දේශපාලකයා ආදිය නිසා වෙනස් වූ යම් කිසි උපමානයක් සහිත උපමේය යම්තම් හෝ ගුණයකින් සමාන වීම උපමා අලංකාරයට සෑහේ." (ගුත්තිල කාව්‍ය වර්ණනා)

**"කියත එක් පලඟක් තැනෙක්හි වූ යම්සේ**
**උවමිනමෙහි විතර නියර කියනෙම් හේ මෙසේ**

(සියබස්ලකර)

එකම තැනක පිහිටි පදාර්ථයන් දෙකක එක සදෘශ වූ ආකාරයක් යම් කිසි අයුරකින් කියද්ද ඒ උපමා නම් වේ යැයි යනුවෙන් සියබස්ලකර කතුවරයා උපමාවේ විස්තර කරයි.

ඉහත දක්වන ලද ගේය කාව්‍යයෙහි පළමු පාදත්ද්වයෙහි දැක් වෙන උපමාද්වය පූර්ණ උපමා නම් වේ. උපමාවක අවශ්‍ය උපමානය, උපමේය සාධාරණ ධර්මය, වාචක යන චතුස් අංගයෙන් සමන්විත වීම පූර්ණ උපමාවෙහි ලක්ෂණ ලෙස විරත් තන ආලං කාරි කයින් විසින් හඳුන්වාදී ඇත.

**"කැල්මෙනා සඳ සේ සදිසි ඇයගේ වත මනා"**

යන්න අපූරු චමත්කාර ජනක උපමාවකි. මෙහි සඳ උපමානයයි. උපමේය ඇගේ මුහුණයි. සාධාරණ ධර්මය කැල්මෙනා ලෙසත් සදිසි යන්න වාචකය ලෙසත් පෙන්වාදිය හැකිය. මෙම අංගයන්හි එකකුදු, දෙකකුදු හෝ තුනකුදු ලුප්ත කල්හි එය ලුප්තෝපමා ලෙස හඳුන්වනු ලැබේ.

(ගුත්තිල කාව්‍ය වර්ණනා)

සිංහල ගේය කාව්‍යයන් අධ්‍යයනයන් කිරීමේදි බහුල වශයෙන්ම භාවිතා වි ඇති අර්ථාලංකාර ලෙස උපමාලංකාරය හැඳින් වුව ද වරදක් නොවේ.

**"උකුලේ ළමැදේ සමබර උසුලන**
**ගැමි ලිය යන ගමනේ**
**මුදු බඳ නැලවෙන සේ**

**කඳුවැටි ගංගා සාගර එකසේ**
**පොළවට සමබර වේ**
**මේ ජීවන කතරේ..**
**සැපදුක සමබර වේ..**
**(මානව සිංහ ගීත නිබන්ධ)**

**කිරිලිය සේ දුර පියා සලලා**
**අත්තටු රිදුනා පමණයි**
**දෑල විදාහල දෑත මගේ**
**ඔබටත් ඔහුටත් උරුමයි..**
**හිරු සඳු එකවර දෙපස නැගේ**
**කළුවර ඇයි විජිතයම මගේ**

**කුණාටු සුළගේ**
**දුහුල් මලකි අද වල් මත් වී පාවෙන්නේ**
**ඔබගෙන්දෝ ඔහුගෙන් දෝ**
**මා හෙට දින සමුගන්නේ...**

(අජන්තා රණසිංහ)

මෙහි ඉහතින් දැක්වූ අමරදේවයන් විසින් ගායනා කරන ගීතය මුදු ලියගේ ගමන් විලාසයෙහි සමබර තාවය කඳු වැටි ගංගා සාගර ආදිය පොළවට සමබර වන ආකාරය උපමා කොට තිබේ. උපමානය හා උපමේය සාම්ප්‍රදායිකත්වයෙන් සම්බන්ධයක් නැත. ගැඹුරු සංකල්පයක් සරළව විස්තර කිරීමට කතුවරයාට ප්‍රතිභාසම්පන්න හැකියාවක් ලැබී ඇත්තේ උපමා භාවිතය නිසායි. මෙය උපමා ප්‍රභේද අතර ධර්ම උපමාවෙහි ලක්ෂණ ඇසුරු කරයි. දෙවැනියට දැක්වූ ගේය පද මාලාවෙහි ද උපමායෝජනයක් වේ.

**"හිරු සඳු එකවර දෙපස නැගේ"**
**"කුණාටු සුළගේ දුහුල් මලකි අද "**

මේ පාදද්වයෙහිම උපමේය ලොප් කොට උපමානය පමණක් දක්වා තිබේ. ගේය පද මාලාව අධ්‍යයනය කිරීමේදී මෙහි හිරු සඳු යනු ස්වාමි පුරුෂයා හා අනියම් පුරුෂයා බවත් දුහුල් මල් යනුවෙන් විවාහක ජීවිතයේ කාමකුණාටුවට හසු වූ කාන්තාව බවත් පැහැදිලිය. කාව්‍යයක පැවති යුතු වක්‍රෝක්තිය මනාව පිහිටුවා චමත්කාරය දැන වීමට රචකයාට හැකි වූයේ උපමා භාවිතය නිසාය. මෙය උපමේය වාචකය ධර්මය ලොප් කර ලුප්තෝපමායි.

**"වෙහෙරක් වගේ පින් දුන් කෙනෙක්**
**දෙවොලක් වගේ දුක් ඇහු කෙනෙක්**
**කුඹුරක් වගේ බත් දුන් කෙනෙක්**
**වේනම් ලොව නුඹයි අපෙ අම්මා"**

**සයුරක් වෙලා කිරි දුන් කෙනෙක්**
**වෙරළක් වෙලා පණ දුන් කෙනෙක්**
**ඔරුවක් වගේ අත දුන් කෙනෙක්**
**වේනම් ලොවේ නුඹයි අපෙ අම්මා..**

(රඹුක්කන සිද්ධාර්ථ හිමි)

උපමාවම උපමේය කොට ගෙන මව් ගුණ වයන උක්ත ගීතය රසවත් චමත්කාර ජනක ගේය කාව්‍යයකි. 'අම්මා' යන උපමේය විස්තර කිරීමට ඇය හා සමාන ධර්මතා ඇති බොහෝ උපමානයන් යොදා ගනී.

**"කුඹුරක් වගේ බත් දුන් කෙනෙක්**
**වේනම් ලොවේ නුඹයි අපෙ අම්මා.."**

නවමු උපමා සංකලනයක් වන මෙහි කුඹුරක් වගේ බත් දුන් කෙනෙක් වේනම් ලොවෙහි එය අම්මාම පමණකි යන අදහස ඉදිරිපත් කරයි. අනෙකෙකු හා සමාන කම වැළකූ හෙයින් මේ උපමා තොමෝ 'නියමෝපමා' නම් වේ. එමෙන්ම එකම උපමේයකට බහු උපමානයන් දක්වන බැවින් බහුපමා ද වේ.

**"සිකුරා නළල් තලේ**
**සිඹිණා ලෙසින්ම හිනැහේවී..**
**අඹරා නීල වරළ**
**සිකි පිල සේම දෙපස සලාවී**
**මොනරා නොවේ දෙවියනි**
**ඒ මේ ලන්දේ දේවතාවි..."**

**දර බිඳ පතන කැලේ**
**දා දිය මුතු නළලේ බඳීවී**
**කිණිහිරි මල් කඩලා**
**ගෙල පලඳා හැඩ වැඩ වෙයි**
**මයුරා වන්නමක් ද**
**නොදැනේ කියාපන්න කුමාරි....**

මෙම කාව්‍යයෙහි වර්ණිත කාන්තාවගේ සිනාසීම. සිකුරා නළල සිඹින ලෙසින්ම යැයි උපමා කොට ඇත. ඇගේ නිල වරල ගොතා දෙපස සැලීම සිකි පිල සේ උපමා කොට ඇත. නියමෝපමාවක් ලෙස දැක්වෙන මෙහි මැය මොනරෙක් නොවන බව දක්වයි. දාඩිය මුතු සේ නළලත බැඳි මද අපූරු උපමාවකි. බහු උපමාවන් යෙදීමෙන් මැගේ රූසිරිය වනන අතර රචකයා එය තව තවත් උද්දීපනය කරනු පිණිස සංශයෝපමාව ද යොදා ගනී. වනයෙහි කිණිහිරි මල් කඩාගෙන පලඳා හැඩ වැඩ බලන කුමාරියගේ ලීලාව මයුරා වන්නමක් ද යැයි ඔහු සැක කරයි. එම සැකයම රචනයෙහි අර්ථ ශෝභාව උද්දීපනයට ඉවහල් වීඇත.

**"ලා දළු බෝපත් සෙමින් සැලෙන සේ**
**යසෝදරා දේවි..**
**වාවනු බැරිතැන රහසේ හැඬුවා**
**පෙර සංසාරේ ඇසුර මතක් වී"**
**(රඹුක්කන සිද්ධාර්ත හිමි)**

**මානිබ්‍ය සේ පොලෝ තලේ නිදාන වී**
**ඇත්තේ ඒ අභිත දූපුතුන්**
**ජාතියේ නාමයෙන් සංග්‍රාම භූමියේ**
**ජීවිතේ පුදා හෙලූ ලේ කඳයි..**

(මහගමසේකර)

උක්ත ගේය කාව්‍යද්වයෙහි ද රචකයින්ට අභිමත පරිදි යෝජනය කළ අපූරු උපමා සංකලනයක් දැකයි හැකිය. මව් සෙනෙහස ජාතිකත්වය ආදී උදාර අරමුණු සමාජ ගත කිරීමට ගීත රචිකයින් ප්‍රධාන වශයෙන් වඩාත් උචිත උපමාවන් යෝජනයට යත්නයක් දරණ බව පෙනේ. නමුත් ඒ කෘතිම වූවක් නොවේ.

**"ටික්කි ටිකිරි සුරතල් ලැදැරියක වගේ**
**ටිකිරි සිනා බැස ආ ගමන අගේ"** (ආනන්ද රාජකරුණා)

ළමා ගීතයක වුව තම රසවතාට උචිත පරිදි උපමා යෝජනයට නූතන ගේය කරුවා දක්වා ඇති හැකියාව ප්‍රසංසනාර්හකය. ගංගාවක ගමන් විලාසය පොඩි දරුවන්ට හුරු පුරුදු ටිකිරි ළදැරියකට උපමා කිරීම අපූරු චමත්කාරයක් දනවන්නකි.

"සිංහල ගීතය කවියේ බොහෝ අභිවර්ධනයන් හා ප්‍රගමනයන් උකහා ගන්නා ලද්දේ බොහෝ කලක් ගත වීමෙන් පසුවය. මෙසමයෙහි වනාහි අපගේ ගීතය යථාර්ථවත් සාහිත්‍ය භාෂණයක් බවට පත්ව තිබෙනු පෙනේ. රචනය අතින් පමණක් නොව සංගීතය හා ගායන ස්වරූපය අතින් ද යථාර්ථ ගුණයෙන් සපිරි නව පන්නයේ ගීත දැන් බිහි වී ඇත්තේය."

(සසර දනව්ව, සිද්ධාර්ථ හිමි)

උපමාව පැරණි භාරතීය ආලංකාරිකයන් අතර බෙහෙවින් සම්මානයට පත් වූ අලංකාරයකි. සෘජු උත්තිය පමණක් කාව්‍ය ලෙස පිලිගැනිමට ඔවුහු එකග නොවූහ. උපමාලංකාරය ද එලෙස හුදු උත්තියක පවතින සෘජු බව මකා වක්‍රෝක්තියක් බවට පත් කරන කාව්‍ය ධර්මයක් ලෙස ඔවුහු හඳුනාගත්හ. සිංහල ගේය කාව්‍ය පද මාලාව තුළට ද උපමා ලංකාරය මෙම කාව්‍යම ගුණය නොවඩුව සේන්දු කරනු අයුරු පැහැදිලිය.

නූතන ගීත වෙස්ගත් තාක්ෂණයේ උපකාරයෙන් නිර්මිත සුසුම් පද මාලාවන් තුළ චමත්කාරය කාව්‍ය රසය තුළින් උද්දීපිත බ්‍රහ්මාස්වාදයක් සැබෑ ලෙසම ලැබෙන්නේ දැයි විමසිය යුතු කරුණකි.උපමා ආදී ගේය කාව්‍ය ශෝභාකාරක ධර්මයන් තුළින් සැමට රස විඳිය හැකි ලෙස විරචිත ගේය කාව්‍ය රචනාවන්හි අකාලික කාව්‍යාත්මක බව ද ඒ හාම සැසඳිය යුතුය.

ගෞරව ශාස්ත්‍රවේදී
ඕපල්ගල චන්ද්‍රරතන හිමි

03 පිටුවෙන්..

## බුදුරජාණන් වහන්සේගේ මහා ප්‍රඥාව

පරිච්ඡේදක ඤාණයද නිරය, තිරිසන්, ප්‍රේත, මනුෂ්‍ය, දිව්‍ය යන ගණවල උපත ලද බව දැකීම පංචගති පරිච්පේදක ඤාණයද ෂඩ් අසාධාරණ ඤාණයෙන්ද යුක්ත වූහ.

ඉහත සඳහන් ඤාණයන්ගෙන්ම පමණක් නොව දහම් කරුණු අවබෝධ කරදීමේ ක්‍රමය මගින් ද මහා ප්‍රඥාවේ බලමහිමය පෙන්නුම් කෙරේ. දේශනා කළයුතු දේ පමණක් පුද්ගලයාට මෙලොව ජීවිතයට අදාළ දේ පමණක් දේශනා කිරීම විස්තර වශයෙන් පුද්ගලයාට පැහැදිලි වෙන ආකාරයට දේශනා කිරීම පමණක් නොව ඒ දේශනාකරන ධර්ම කරුණු තේරුම් යන ආකාරයට සැලැස්වීමද ප්‍රධාන වේ.පැහැදිලි උපමා උපමේය දක්වමින් අවිය තහවුරු කැමින් අවබෝධකරවීම එකිනෙකාට මනාව හේතු දැක්වීමද කොටස්වලට බෙදා දැක්වීමෙන් දේශනා කිරීමද පුද්ගලයාට ගැඹුරු නොවන ආකාරයෙන් ධර්මදේශනා කිරීමද සුවිශේෂි ලක්‍ෂණයකි.

මේ ආකාරයෙන් බුදුරජාණන් වහන්සේගේ මහා ප්‍රඥාවේ ආශ්චර්යය කිසිවෙකුට සමාන කළ නොහැකිය. බෝසත් කාලයේද ප්‍රඥාවෙන් යුක්තව කටයුතු සිදුකළ ආකාරය පිළිබඳව උමංදුවෙන් මනාව පැහැදිලි වේ.

07 පිටුවෙන්...

## නිශ්චල චිත්තය

සංඛාර මගින් සිදුවන්නේ රූපය රූපය පිණිසත්, වේදනාව වේදනාව පිණිසත්, සංඥාව සංඥාව පිණිසත්, සංඛාරය සංඛාරය පිණිසත්, විඤ්ඤාණය විඤ්ඤාණය පිණිසත් නැවත නැවත සැදීමයි. යම් මලක් වැනි රූපයක් දෙස බලා සිටීමේදී, සිංදුවක් වැනි ශබ්දයක් අසා සිටීමේදී, එය ලස්සනයි හොඳයි මැනවැයි යනාදී වශයෙන් සිතිවිලි ගොඩනගා ගනිමින් සංඛාර සාදයි. අපගේ උප්පත්තිය පවා ඇතිවන්නේ සංඛාරයක් අල්ලාගෙනය. එය පුඤ්ඤාභි සංඛාරයක් නම් සුගතියකද, අපුඤ්ඤාභි සංඛාරයක් නම් දුගතියකද, අනෙඤ්ජාභි සංඛාරයක් නම් අරූපාවචර බ්‍රහ්ම ලෝකවලද උප්පත්තිය ලබයි. උප්පත්තියෙන් පසු දිගින් දිගටම කෙසෙල් කඳක කොල එක එක හදනවා මෙන් සංස්කාර පොදියක් සකස් කරයි. උදාහරණයක් ලෙස පුංචි කාලේ බෝණික්කෙක්, ටොෆියක්, බෝලයක් වැනි දේවල් අල්ලාගෙන සංස්කාර සාදයි. ඉන්පසු අධ්‍යාපනය, රැකී යාව, විවාහය, යුතුකම්, වගකීම් ආදිය අල්ලාගෙන සංස්කාර සාදයි. වයසට යන්න යන්න ධර්මය නොදන්නා කෙනාගේ සංස්කාර වැඩිය. ඒවායේම ඇලී ගැලී සිටී. එකින් එක සංස්කාර කෙසෙල් කඳක කොළ ගල වනවා මෙන් ඉවත් කළහොත් අරටුවක් නැති බඩයක් හමුවෙයි. ඒ ආකාරයෙන් හරයක් නැති දෙයක එතිලා ඇතිබව අවබෝධ වීමෙන් නැවත සංස්කාර නොසාදන තැනට චිත්තය පත්කර ගත හැකිය. එවිට සිත විසංඛාර බවට පත්වේ. එවිට නැවත තණ්හාවක් ඇති නොවේ. මෙය අවබෝධයෙන් කිසිඳු දේකට නොසැලෙන සිතක් ඇතිකරගත හැකිය.

<u>විඤ්ඤාණ අවබෝධයෙන් නොසැලීම.</u>

මහණෙනි, "විජානනය නෙරේ" නුයි එයින් විඤ්ඤානය යි කියනු ලැබේ. එනම් රූප, වේදනා, සංඥා, සංඛාර පිළිබඳ දැනුවත්වීමයි.

විඤ්ඤාණය යනු දැනුවත්වීමයි. මොනවාද දැනුවත් වෙන්නේ, වැනි හරයක් නැති, පෙණ ගොඩක් වැනි රූපය, දිය බුබුලක් වැනි වේදනාය, මිරිගුවක් වැනි සංඥාය, කෙසෙල් කඳක් වැනි සංඛාරයෝය. ඇත්තටම මෙසේ දැනුවත් වන්නේ නැති දේවල්ය. මායාවක ස්වභාවය වන්නේ නැති දේවල් සත්‍ය වශයෙන් පවතින බව පෙන්වීමයි. එසේ හෙයින් විඤ්ඤාණය මායාවක් ලෙස උපමා කොට ඇත. රූප දෙකක් එකතු වන විට විඤ්ඤාණය හටගනී. "ද්වයං පටිච්ච විඤ්ඤාණං සම්භෝති". රූප යනු ධාතු හතරකින් සෑදුනු දේවල්ය. පෙණ ගොඩක් සේ හර ශූන්‍ය රූප දෙකක් එකතුවී හටගන්නා විඤ්ඤාණයෙන් දැනුවත් වන්නේ ද හරශූන්‍ය රූපයකි. එනම් එම දැනුවත්භාවයද මුසාවකි. එමෙන්ම රූප වේගයෙන් වෙනස් වන බැවින් දැනුවත්වීමද වේගයෙන් වෙනස් වේ. රූපය ජරාවට පත්වන නිසා විඤ්ඤාණයෙන් දැනුවත් වන්නේ ජරාවට යන රූපයකි. මෙසේ ඇති වෙමින් නැතිවෙමින් යන විඤ්ඤාණය නැවත ඇති වුවත් අල්ලා ගන්නේ ජරාවට යන රූපයකි. එනම් විඤ්ඤාණය අනිත්‍ය, දුක්ඛ, අනාත්ම බව අවබෝධයෙන් නොසැලෙන සිතක් ඇතිකරගත හැකිය.

මෙලෙස පංච උපාදානස්කන්ධය උපාදානය නොකර සිටීමෙන් අෂ්ඨ ලෝක ධර්මයට අකම්පිත සිතක් ඇතිකර ගත හැකිය. කල යුත්තේ යමක් දිහා බලාගෙන සිටියත්, යමක් අහගෙන සිටියත්, යමක් ආඝ්‍රාණය කරගෙන සිටියත්, යමක් රස විඳගෙන සිටියත්, යමක ස්පර්ෂය ලබමින් සිටියත් යමක් මෙනෙහි කරමින් සිටියත්, කමින් බොමින් ඇවිදිමින් ආදී සෑම ක්‍රියාවක යෙදී සිටියත් ඒ සෑම සිතක ම මගේ කියා නොගෙන ස්වභාව ධර්මයේ ක්‍රියාවලියක් බව අඛණ්ඩව නුවණින් දැකීමයි. එවිට කෙදෙනක හෝ වහා වහා ඔබගේ සිත සියල්ලෙන් නිදහස් වනු ඇත.

12 පිටුවෙන්...

සඟවා තබා තීර්තකයින් වහන්සේට නොයෙක් චෝදනා කළ අතර එයින් ද නොසැලී සිටි සේක. අක්කෝස භාරද්වාජ බමුණා බුදුන් වහන්සේට දානයකට ආරාධනා කොට සිය නිවසට වැඩමවා දෝෂාරෝපණය කළේය. උන්වහන්සේ එයින් කිසිදු කම්පාවකට පත්නොවී නොසෙලී ඔහු කෙරේ අනුකම්පා කළ සේක.

බුදුන් වහන්සේ තුළ ඉහතින් දක්වූ ආකාරයට පිළිඹිබු වූයේ සමානාත්මකතා ගුණය හා සිතීමේ හා විමසීමේ නිදහස දීමේ ගුණය විෂයෙහි වසල සූත්‍රය හා කාලාම සූතරය යන සූත්‍ර දේශනා වලින් මනා ප්‍රකට වේ. යමෙකු උපතින් වසලයෙකු හෝ බ්‍රාහ්මණයෙකු නොවෙන බවත් ක්‍රියාවෙන් පමණක් බවත් වසලයෙකු වන බවත් දේශනා කළ සේක. එසේම සිතීමේ හා විමසීමේ නිදහස අගය කළ ශාස්තෘවරයෙකු බව අංගුත්තර නිකායේ එන කාලාම සූත්‍රයෙන් අනාවරණය වේ. එම සූත්‍රයෙන් යම් දෙයක් පරම්පරාවෙන් ආ නිසා හෝ ආරංචි වූ නිසා හෝ අනුගමනය නිසා හෝ දහමෙහි කියැවෙන නිසා හෝ ආරංචි වූ නිසා හෝ ගුරු ගෞරවය නිසා වෙන් පිළිනොගන්නා තමාට අවබෝධ වේ නම් පිළිගන්න යනුවෙන් සමුදයකින් සමන්විත වූ බුදුන් වහන්සේ සරණ යාමට අප සියලු දෙනාම ප්‍රයත්න දැරිය යුතු බැව් අවසන් ලෙස පෙන්වා දිය හැක.

04 පිටුවෙන්...

# කාලාම සූත්‍රයෙන් පෙන්වාදෙන බෞද්ධ නිදහස් චින්තනය

වැරදි කාමසේවනය, බොරුකීම යනාදිය කරනවා පමණක් නොව අනෙකුත් පිරිසත් ඒ දේවල් වලට පොළඹවන බවත් දක්වන ලදී. එසේම ඒ නිසාම යමෙකුගේ සිතේ ඇතිවන මුලාව මෝහය බොහෝ කාලයක් දුක් පිණිස පවතින බවත් එම සිතුවිලි පෙරදැරි කරගෙන දුෂ්චරිතයේ යෙදීම බුද්ධිමත් මිනිසුන් විසින් ගරහන දේවල් බව පෙන්වා දුන් සේක.

ඒ නිසාම ලෝභ, ද්වේශ, මෝහ යන අකුසල් මූලයන් නැති කෙනෙක් ඒවා දුරුකිරීම නිසාම ලෝභයෙන්, ද්වේශයෙන්, මෝහයෙන් ඈත්වීම නිසාම ඉහත කී ප්‍රාණඝාතය සොරකම් කිරීම, බොරුකීම, වැරදි කාමසේවනයේ යෙදීම නොකරන අතර ඒ සදහා තවත් කෙනෙකු පොළඹ වන්නේ ද නැත. මෛත්‍රී සහගත සිතින් උපේක්‍ෂා සහගත සිතින්, මෘදු සිතින් දස දිසාවට මෛත්‍රිය, කරුණාව, පතුරුවා ගෙන වාසය කරනවා නම් ඔහුට පරලොවක් ගැන හැඟීමක් තියෙනවා නම් ඔහු ස්ථිර වශයෙන්ම සුගතියේ උපදින බැව් පෙන්වා දෙන ලදී.

එසේම මේ ලෝකයේ ලෝභ, ද්වේශ, මෝහ ප්‍රහාණය කළෙහි නම් ඔහු අනිවාර්යෙන් ම බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවකයෙකුද වන්නේය. එසේම සක්කාය දිට්ඨිය, ප්‍රහාණය කළා නම් ද යමෙක් සෝවාන්, සකෘදාගාමී, අනාගාමී, අර්හත් යන තත්වයන්ට පත්වුනද සම්මා දිට්ඨියට පත්වී සුගතියේ උපන්නා නම්ද, සුගතියේ සිට දිගටම නිවන කරා යන්නේද ඔහු ද බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවකයෙකි.

බුදුරජාණන් වහන්සේගේ ධර්මයෙන් පිළිඹිබු කර පෙන්වන්නේ සසර ගමන සම්පූර්ණයෙන්ම නවත්වා ගන්නේ කෙසේද කියාය. අප සසර ගමනක යෙදී ඇත්තේ කෙලෙස් සමගයි. නැතහොත් දුක සමගයි. මිනිසුන්ගේ උපත ඇතිවන්නේ පටිච්ච සමුප්පාද න්‍යායට අනුකූලවයි. සියලුම සත්වයෝ සසරේ භව ගමනක යෙදී ඇත්තේ ඉහත දක්වන ලද ලෝභ, ද්වේශ, මෝහ යන අකුසල මූලයන්ට ගොදුරුවීම නිසාය. වෙනත් ලෙසකින් කිවහොත් චතුරාර් සත්‍ය අවබෝධ නොවීම නිසාය.





# චිත්ත සමාධිය

( මිනිස් සිතක පවතින ස්වාභාවය ඇති සැටියෙන්ම ලෝකයා හමුවේ ඉදිරිපත් කළ ශාස්තෘවරයා ලෙස බුදුරාජාණන් වහන්සේ, හඳුන්වාදිය හැකි ය.ධම්ම පදයේ සඳහන්වන මෙම ගාථාවෙන් මැනවින් ඒ බව පැහැදිලි වෙයි.

''දූරංගමං ඒකචරං - අසරීරං ගුහාසයං
යේ චිත්තං සඤ්ඤමෙසසන්ති මොක්ඛන්ති මාර බන්ධනා''

දුර ගමන් යන තනිව හැසිරෙන ශරීරයක් නැති සිත යම් කෙනෙක් දමනය කරගැනිමට සමත්වේ ද එබඳු තැනැත්තා මාර බන්ධනයෙන් මිදෙන්නේය. තවත් තැනක මෙසේ සඳහන් වෙයි. දියෙන් ගොඩටගත් මාළුවෙකු සැලෙන්නේ යම් සේද එපරිද්දෙන් මිනිසාගේ සිත ද සැලෙන්නේය.

මෙය කදිම උපමාවකි.

''පබසසර මිදං භික්ඛවෙ චිත්තං තඤ්චකො ආගන්තුකෙහි උප කෙකලසෙහි උපක්කිලට්ඨං''

මිනිසාගේ සිත උපදින අවස්ථාවේ දී ඉතා පිරිසිදුය. බාහිර වශයෙන් ඇතුලු වන කෙලෙස් වලින් සිත කිලිටි වන්නේය.(චිත්ත වගගය)

චිත්ත සමාධිය ලෙස සලකනු ලබන්නේ, විසිරී පවතින සිත එක්තැන් කිරීමය. බුදුදහම පහලවීමට පෙර සිටම හිමාලයේ වාසය කල ඉෂිවරුන් '' චිත්ත සමාධිය හෙවත් සිත එක්තැන් කර ගැනීම සිදු කරගෙන තිබේ.

''මනුෂ්මෘතිය''ග්‍රන්ථයේ ඒ බව සඳහන් වේ.ලෞකික වශයෙන් ලබාගත් ධ්‍යාන බලයක් මගින් ආකාසයෙන් ගමන් කිරීමට හැකියාව තිබු බව එකල පැවැති ග්‍රන්ථවලින් පෙනේ. (භගවාත් ගීත) ධ්‍යාන ක්‍රමයක් එමගින් වින්දනය කිරීම ඔවුන්ගේ මූලික අරමුණ වී තිබුණි. බුදු දහමට අනුව භාවනා ක්‍රම මගින් චිත්ත සමාධිය ලබාගත හැකි බව පෙන්වා දී තිබේ. සමථ භාවානාව සහ විදර්ශනා භාවනාව යන ක්‍රම දෙකක් ගැන සඳහන් වේ. සමථ භාවනාව ''පංච නීවරණනිසමෙතීති සමතො'' පස් වැදෑරුම් නීවරණ ධර්‍ම යටපත් කිරීම මෙයින් සිදුවේ. වාතය පිර වූ බෝලයක් ජලයට දමා අතින් තෙරපා සිටින විට ජලය යටට බෝලය ගමන් කරයි. අත ඉවත්කලවිට බෝලය යලි මතු පිටට එයි. කෙනෙකුට ඉතා පහසුවෙන් මෙය තේරුම් ගැනීමට පුළුවන.

මෙය කදිම උපමාවකි. සමථ භාවනාව මගින් ලබාගන්නා ''චිත්ත සමාධියද'' එසේ වෙනස් වෙයි. එබැවින් උතුම් පරමාර්‍ථයට එමගින් ලගාවිය නොහැකිය. බුදුදහමෙහි අනුදැන ඇත්තේ, දෙවන ප්‍රධාන භාවනාව වූ විදර්‍ශනා භාවනාවයි. සංසාර විමුක්තිය ලබාගැනීම සඳහා උපකාරවන මෙම භාවනාව ත්‍රිලක්‍ෂණ භාවනාව නමින් ද හැඳින්වේ. ලෝකයේ පවතින සෑම වස්තුවක්ම මෙම භාවනාවට යොමු කරගත හැකිය. විශේෂයෙන් ''පංචස්කනධය'' ගැන ත්‍රිලක්‍ෂණය මෙනෙහි කිරීම මෙයින් අපේක්ෂිතයි. (අනිත්‍ය,දුක්ඛ,අනාත්ම) දීඝ නිකායේ හා මජ්පිම නිකායේ දස වැන්නෙහි මේ ගැන දීර්ඝ විස්තරයක් දැක්වේ.එය සතිපට්ඨානය යනුවෙන් ද දැක්වේ.

කායනුපස්සනා, වේදානුපස්සනා, චිත්තානුපස්සනා, ධම්මානුපස්සනා යනුවෙන් විස්තරකර ඇත. මෙම කොටස් හතර ගැන සිත යොමුකර (යොනිසෝ මනසිකාරයෙන් ,එළඹගත් සිහියෙන් ) බැලීම, මෙයින් අදහස් කෙරේ. මෙම ක්‍රමය අනුගමනය කිරීම, සංසාර දුක නැති කරගෙන නිර්‍වාණය ලගා කර ගැනීමට හේතුවන බව බුදු දහමෙන් පෙන්වා දී තිබේ. යෝගාවචරයන් අනුගමනය කරනු ලබන්නේද විදර්‍ශනා භාවනාවයි.

බෝධිසත්වයන් (සිදුහත් කුමරා) වප්මගුල් දින දඹරුක් සෙවනෙහිදී ඇති කරගත් ''ආනාපානාසති භාවනාව '' (සිහියෙන් යුක්තව හුස්ම ගැනීම හා හෙලීම) මගින් ධ්‍යාන උපදවාගත් බව බෝසත් චරිතයෙහි දැක්වේ. මෙයත් චිත්ත සමාධියකි. එහෙත් එය නිවණට හේතු නොවුවත් නිවණට මගපෑදීමකි. ආනාපානාසති භාවනාව වැඩීමෙන් මෙලොව වශයෙන් නිරෝගී සුවය ලැබිය හැකි බව බුදු දහමෙන් පෙන්වා දී තිබේ. මෛත්‍රී භාවනාව ද සාමාන්‍ය මිනිස් ජීවිතයක් ගතකරන (ප්‍රවෘජ්ජා නොවී) කෙනෙකුට වුවද, සිදුකළ හැකි දෙයකි. මෛත්‍රී භාවනාවෙන් සිදු කරනු ලබන්නේ පළමුව තමන්ට මෛත්‍රී කිරීමයි. එයින් පසු පැතිරීයන ලෙස සියළුම සතුන් වෙත මෛත්‍රී කිරීමය. මෙය කරණීය මෙත්ත සූත්‍රයේ පැහැදිලි ලෙස දක්වා තිබේ. වනාන්තරයට ගොස් භාවනා කිරීමට ගිය භික්‍ෂුන් වහන්සේලාට සිදු වූ යක්‍ෂ, දෝෂ දුරු කරගැනීමට මෙම සූත්‍රය බුදුරාජාණන් වහන්සේ විසින් වදාරා තිබේ.

එම සූත්‍ර දේශානාවට අනුව කටයුතු කල (භාවනා කළ) එම භික්‍ෂුන් වහන්සේලා තම අදහසට අනුව නිවන් පසක් කරගත් බව එම සූත්‍රධර්මයට අනුව පෙන්වා දී තිබේ.මෙම භාවනාවෙන් මෙලොවදීම ලැබිය හැකි ආනිසංස දහයක් ගැන සඳහන් වෙයි.

''සුඛං සුපති සුඛං පටිභුඤ්ජති, නපාපකං සුතිනං නපසසති මනුසසානං පියොහොති, අමනුසසානං පියොහොති, දේවතාරක්ඛන්ති අසමමූලහො කාලං න කරොත අපපටී විජ්ජනො බ්‍රහ්මලොකෝ පගොහොති ''

(සුවසේ නිදයි,සුව සේ පිබිදෙති, පවිටු සිහින නොදකියි. ,මිනිසුන්ට ප්‍රිය වේ. අමනුෂ්‍යන්ට ප්‍රිය වේ. වස, විස, ගිනි, සතුරු විපත් ඇති නොවේ. දුටුවන් ප්‍රිය වේ. දෙවියන් රකියි. නුමුලාවෙන් කළුරිය කරයි. මරණින් මතු බඹලොව උපදී.) මෙවැනි විපාක රැසක් මෛත්‍රී භාවනාවෙන් ලබාගත හැකි බවත්, එය සෑම මිනිස් කොට්ඨාශයකම පොදුවේ ලැබෙන ආනිසංසයක් ලෙසට දක්වා තිබේ. එබැවින් ඉතා පහසුවෙන් මෙලොව හා පරලොව අනුසස් ලැබෙන බව විස්තර කර දී තිබේ. ''කරණීය මෙත්ත සූත්‍රය ''භාවනා ක්‍රම උගන්වන සූත්‍රයක් වන බවත් එය හඬ නඟා කියවන දෙයක් නොවන බව මෙහිලා අවබෝධ කරගත යුතු ව ඇත. මේ ගැන හරි හැටි නොදන්නා ඇතැම් පුද්ගලයින්, හඬනඟා කියවීමෙන් තම අදහස් ඉටුවේ යැයි සිතා සැනසෙති. මෙය නිවරදිව වටහාගෙන මෙම දේශනාවන්ගේ ප්‍රයෝජන ගතයුතුය. බුදු දහමෙහි දැක්වෙන මෙවැනි උතුම් දේශනාවන් ප්‍රයෝජනයට ගෙන තම තමන්ගේ ජීවිත මෙලොව හා පරලොව යහපත සලසා ගැනීමට තම නිවැරදි චින්තනය යොදාගත යුතු බව අවධාරණය කිරීමට මෙය උපකාරී වනු ඇත.

විජය තලවත්තේගෙදර

මෙම තීරුවට ඔබටත් ලිපි එවිය හැකියි. ඔබේ ලිපි වචන 250කට කැටි කොට එයට අදාළ පින්තූරයක්ද සමඟ අප වෙත එවන්න. අප්‍රකට හා ඓතිහාසික පුණ්‍යභූමි පිළිබඳ විස්තරයන්ට ප්‍රමුඛස්ථානය හිමිවේ. ඔබේ ලිපි සෑම මසකම පොහෝ දිනට සති 2කට පෙර එවන්න.

රංගිරි ශ්‍රී ලංකා පුවත්පත,රංගිරි ශ්‍රී ලංකා මාධ්‍ය ජාලය,දඹුල්ල. (rangirinewspapers@gmail.com)